# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## මුදල් ව්‍යාපාර

**මුදල් ව්‍යාපාර කටයුතු විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින්
2011 අප්‍රේල් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 මාර්තු මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[101 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 63.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 22.00 යි.**

# මුදල් ව්‍යාපාර

එල්. ඩී.—ඕ. 20/2010.

**මුදල් ව්‍යාපාර කටයුතු විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2011 අංක  දරන මුදල් ව්‍යාපාර පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### මුදල් සමාගම්වලට බලපත්‍ර දීම

අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සහ තැන්පතු භාරගැනීම වරදක් බව.

**2.** (1) මේ පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තකු හැර, වෙනත් තැනැත්තකු විසින් මුදල් ව්‍යාපාර පවත්වාගෙන යෑම නොකළ යුතු ය.

(2) මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තකු හෝ 3 වන වගන්තිය ප්‍රකාර මේ පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තකු හැර වෙනත් තැනැත්තකු විසින් තැන්පතු භාරගැනීම නොකළ යුතු ය.

(3) යම් තැනැත්තකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සමාගමක් වන්නේ නම් මිස, සහ එකී සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ අර්ථානුකූලව ඇපයෙන් සීමිත සමාගමක්, පෞද්ගලික සමාගමක්, අක්වෙරළ සමාගමක් හෝ විදේශීය සමාගමක් නොවන්නේ නම් මිස, ඒ තැනැත්තා මේ පනත යටතේ මුදල් සමාගමක් ලෙස ලියාපදිංචි වීමට සුදුස්සකු නොවන්නේ ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

2—PL 005633- 425 (2011/03)

**මේ පනතේ විධිවිධාන ඇතැම් ආයතනවලට අදාළ නොවීම.**

**3.** 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් බලපත්‍රලත් යම් බැංකුවකට හෝ ඒ බැංකුව සම්බන්ධයෙන් ද ඒ පනතේ 76අ වගන්තිය ප්‍රකාර නිදහස් කර ඇත්තා වූ ද මේ පනත යටතේ බලපත්‍ර ලැබූ මුදල් සමාගමක් හැර අන් ආයතනයකට හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සමිතියකට හෝ එය සම්බන්ධයෙන් ද තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් මගින් මේ පනත අදාළ වීමෙන් නිදහස් කරනු ලැබූ යම් ආයතනයකට හෝ එය සම්බන්ධයෙන් ද මේ පනතේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

**බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීම.**

**4.** බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් නියමිත ආකෘති පත්‍රයෙහි මණ්ඩලය වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, ඒ ඉල්ලීමේ සඳහන් කරුණු ඉල්ලුම්කරුගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බවට වූ ඉල්ලුම්කරුගේ ප්‍රකාශයක් එහි ඇතුළත් විය යුතු ය.

**සමාගම්වලට මුදල් සමාගම් ලෙස බලපත්‍ර ලබා දීම.**

**5.** (1) මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක ඉල්ලීම සම්බන්ධයෙන් තම නිර්දේශ ඉදිරිපත් කරන ලෙස මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට නියම කළ හැකි අතර, අධ්‍යක්ෂවරයාට ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලබන තොරතුරු කැඳවීමට සහ බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන සමාගමේ සහ එහි පාලක සමාගමක, යම් පාලිත සමාගමක, ආශ්‍රිත සමාගමක හෝ එහි පාලක සමාගමේ යම් පාලිත හෝ ආශ්‍රිත සමාගමක නැතහොත් අධ්‍යක්ෂවරයාගේ මතය අනුව බලපත්‍රය ඉල්ලා සිටින සමාගමේ ප්‍රමාණවත් මූල්‍ය සම්බන්ධතාවක් හෝ වැදගත් කළමනාකරණ සම්බන්ධතාවක් ඇති වෙනත් යම් සමාගමක හෝ පොත් පත් වාර්තා සහ කවර හෝ විස්තරයකට අයත් ලේඛන කැඳවා පරීක්ෂා කිරීමට හෝ පරීක්ෂා කිරීමට සැලැස්වීමට හැකි අතර, ඉන් පසු අධ්‍යක්ෂවරයා සිය නිර්දේශ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ඕනෑම අවස්ථාවක, ඉල්ලුම්කාර සමාගමේ යෝග්‍යතාවය පිළිබඳව සෑහීමට පත්වීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන විමර්ශණ කිරීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය හැකි අතර, සමාගමේ යෝග්‍යතාවය සම්බන්ධව අදාළ යයි සැළකෙන, ඕනෑම කරුණක් සහ විශේෂයෙන් පහත සඳහන් වන කරුණු සම්බන්ධයෙන්, මණ්ඩලය සෑහීමට පත් කරන ලෙස මණ්ඩලය විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(අ) ඉල්ලුම්කාර සමාගම විසින් ඉදිරිපත් කර ඇති ලේඛන සහ විස්තරවල වලංගු බව සහ පිළිගත හැකි බව;

(ආ) ඉල්ලුම්කාර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ඉතිහාසය;

(ඇ) මණ්ඩලය අවශ්‍යයැයි සලකනු ලැබිය හැකි පරිදි, අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද, මූල්‍ය තත්ත්වය සහ යෝග්‍යතාවය;

(ඈ) ඉල්ලුම්කාර සමාගමේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය හෝ ඉල්ලුම්කාර සමාගම විසින් සපයා ඇති තොරතුරු අනුව ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සපයා ගැනීමට එම සමාගමට ඇති හැකියාව;

(ඉ) ඉල්ලුම්කාර සමාගමේ මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී සමාගමට දැරීමට සිදුවන වගකීම් හා බැරකම් සියල්ල ආවරණය කිරීමට හා මේ පනතේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීමට ඉල්ලුම්කාර සමාගමට ඇති හැකියාව; සහ

(ඊ) මේ පනත යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කිරීම හා සම්බන්ධව, මේ පනතේ විධිවිධාන සහ මේ පනත යටතේ නිකුත් කර ඇති යම් විධාන ඉල්ලුම්කාර සමාගම විසින් පිළිපැදීම.

(3) මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම, (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන නිර්දේශ සහ (2) වන උපවගන්තිය යටතේ කරන ලද යම් විමර්ශණ සැලකිල්ලට ගත් විට—

(අ) (i) ඉල්ලුම්කාර සමාගම සතුව රුපියල් මිලියන දෙසීයකට නොඅඩු ප්‍රමාණයක හෝ 17 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන වඩා ඉහළ ප්‍රමාණයක මූලික ප්‍රාග්ධනයක් පවතින බවට;

(ii) මුදල් සමාගම්වලට අදාළ වන විධාන සහ රීති ඉටු කිරීමට ඉල්ලුම්කාර සමාගමට හැකි බවට; සහ

(iii) මණ්ඩලය වෙත ලබාදුන් තොරතුරුවල ප්‍රබලතාවය මත, ඉල්ලුම්කාර සමාගමට බලපත්‍රයක් ලබා දීම, එහි ණයහිමියන්ගේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන්නන්ගේ යහපතට හානිකර නොවන බවට,

මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම්, මණ්ඩලය විසින් සුදුසු යයි සළකන නියම සහ කොන්දේසිවලට යටත්ව, මණ්ඩලය විසින් ඉල්ලුම්කරුට මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මුදල් සමාගමක් වශයෙන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(ආ) ඉල්ලුම්කාර සමාගමට බලපත්‍රයක් ලබා දීම එහි ණයහිමියන්ගේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන්නන්ගේ යහපතට හානිකර ලෙස බලනොපාන බවට සහ (අ) ඡේදයේ (i) සහ (ii) අනු ඡේදයන්හි අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට ඉල්ලුම්කරුට හැකියාවක් ඇති බවට මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම්, සුදුසු යයි මණ්ඩලය අදහස් කරන යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, මණ්ඩලය විසින් තාවකාලික අනුමතයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය; හෝ

(ඇ) ඉල්ලුම්කාර සමාගමට බලපත්‍රයක් ලබා දීම එහි ණයහිමියන්ගේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන්නන්ගේ යහපතට හෝ මූල්‍ය පද්ධතියේ යහපත සහ ස්ථාවර භාවයට හානිකර ලෙස බලපාන බවට මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම්, මණ්ඩලය විසින් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. එමෙන්ම අවශ්‍ය යයි මණ්ඩලය සළකන විධාන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ප්‍රදානය කරන ලද තාවකාලික අනුමතය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයක් සඳහා වලංගු විය යුතු යි. සුවිශේෂ අවස්ථානුගත කරුණු වල දී තාවකාලික අනුමතයක වලංගු කාලය මණ්ඩලය විසින් දීර්ඝ කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, තාවකාලික අනුමතයක වලංගු කාලය (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ තාවකාලික අනුමතය ප්‍රදානය කරන ලද දිනයේ සිට මාස දහඅටක කාලයක් නොඉක්මවිය යුතු ය.

(5) තාවකාලික අනුමතය දී ඇත්තේ යම් ඉල්ලුම්කාර සමාගමක් වෙත ද ඒ සමාගම විසින්, මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමට පෙර මුදල් ව්‍යාපාර ආරම්භ කරනු නොලැබිය යුතු ය. (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ සමාගමට තාවකාලික අනුමතය ලැබී ඇති බව, යම් ලිඛිත නීතියක් යටතේ එවැනි අනාවරණය කිරීමක් අවශ්‍ය වේ නම් මිස, සමාගම විසින් නිකුත් කරනු ලබන යම් විස්තර පත්‍රිකාවක හෝ දැන්වීමක හෝ සමාගම විසින් පළකරන යම් වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ප්‍රකාශනයක, සඳහන් කරනු නොලැබිය යුතු ය.

(6) (අ) බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක අන්තර්ගත තොරතුරක් හෝ එවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් ඉල්ලුම්කාර සමාගම ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් අසත්‍ය බවට, අසම්පූර්ණ බවට හෝ වැරදි සහගත බවට හෙළිවුවහොත්; හෝ

(ආ) මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සලකා බැලීමේ දී ඉල්ලුම්කාර සමාගමට බලපත්‍රයක් ලබා දීම මූල්‍ය පද්ධතියේ යහපතට සහ එහි ස්ථාවර භාවයට අහිතකර බව පෙනී ගියහොත්,

මණ්ඩලය විසින් තාවකාලික අනුමතය අස්කර ගත හැකි ය.

(7) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පනවන ලද නියම හා කොන්දේසි සපුරාලීම සහ තාවකාලික අනුමතය ලබා දීමෙන් පසු ලැබුණ තොරතුරු මණ්ඩලය විසින් සලකා බැලීමෙන් පසු සහ ඉල්ලුම්කාර සමාගමට බලපත්‍ර දීම මගින් ණයහිමියන්ගේ සහ අනෙකුත් උනන්දුවක් දක්වන්නන්ගේ යහපතට හෝ මූල්‍ය පද්ධතියේ යහපත හෝ ස්ථාවරභාවයට හෝ අහිතකර නොවන බව මණ්ඩලය සෑහීමට පත් වීමෙන් පසු මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව ඉල්ලුම්කාර සමාගමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, තාවකාලික අනුමතය දීමෙන් ඉල්ලුම්කාර සමාගමට බලපත්‍රයක් ලබා දීමට මණ්ඩලයට බැඳීමක් ඇති නොවිය යුතු ය.

(8) ඉල්ලුම්කාර සමාගමට බලපත්‍රයක් නිකුත් කිරීමෙන් පසු, ඒ ඉල්ලුම්කාර සමාගමට මුදල් ව්‍යාපාර පවත්වාගෙන යෑම සඳහා බලය දෙමින් බලපත්‍රයක් නිකුත් කළ බව මහජනයාට දැනුම් දෙමින්,

ගැසට් පත්‍රයේ සහ යටත් පිරිසෙයින්, ශ්‍රී ලංකාවේ සංසරණය වන එක් දෛනික සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පතක දැන්වීමක් පළ කිරීම සඳහා මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(9) බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයේ හෝ ඒ සම්බන්ධව ඉදිරිපත් කරන යම් ලේඛනයක හෝ මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීම සඳහා සමාගමේ යෝග්‍යතාවය නිසැකව දැන ගැනීම සඳහා පවත්වන ලද විභාගයකදී හෝ විමර්ශණයක දී හෝ ව්‍යාජ, අසම්පූර්ණ හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන යම් තැනැත්තකු, මෙම පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

බලපත්‍ර ගාස්තුව.

**6.** මේ පනත යටතේ බලපත්‍රලත් සෑම මුදල් සමාගමක්ම රීති මගින් නියම කරනු ලබන මුදලක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් සමාගම් නාමලේඛනය සහ මුදල් සමාගම්වල නම් ප්‍රකාශයට පත් කිරීම.

**7.** (1) මේ පනත යටතේ බලපත්‍ර නිකුත් කරනු ලැබූ මුදල් සමාගම් සම්බන්ධයෙන්, මණ්ඩලය විසින්, නියමිත ආකෘතිය අනුව නාමලේඛනයක් තබාගත යුතු අතර, එය පවත්වා ගෙන යා යුතු ය.

(2) මණ්ඩලය විසින් කලින් කළ. මණ්ඩලය විසින් යෝග්‍ය යයි සළකනු ලබන ආකාරයකින් සහ ආකෘතියකින්, මේ පනත යටතේ බලපත්‍ර නිකුත් කරනු ලැබූ මුදල් සමාගම්වල නම් ඇතුළත් දැන්වීමක් ප්‍රසිද්ධ කිරීමට කටයුතු සලස්වනු ලැබිය හැකි අතර, එහි ඒ සමාගම් සම්බන්ධ අධීක්ෂණ ඇගයීම ද අඩංගු කරනු ලැබිය හැකි ය.

මුදල් සමාගමේ බලපත්‍රය ප්‍රදර්ශනය කිරීම.

**8.** සෑම මුදල් සමාගමක්ම, සියලු අවස්ථාවන්හි, සිය බලපත්‍රය ප්‍රධාන කාර්යාලයේ හෝ ව්‍යාපාර ස්ථානයේ ද, ඒ බලපත්‍රයේ පිටපතක් සමාගමේ එක් එක් ශාඛාවන්හි ද ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

මුදල් ව්‍යාපාර කටයුතු අවසන් කිරීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයට දැන්වීම මුදල් සමාගමේ යුතුකම බව.

**9.** (1) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ මුදල් සමාගමක් විසින්, මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක, මණ්ඩලය වෙත ඒ අවසන් කිරීම සම්බන්ධයෙන් දැන්වීමක් නොපමාව දෙනු ලැබිය යුතු ය.

(2) අවසන් කිරීම සම්බන්ධ දැන්වීමක් (1) වන උපවගන්තිය යටතේ ලැබූ විට, ගණන් බේරා වසා දැමීම සඳහා හෝ මුදල් සමාගමේ මුදල් ව්‍යාපාරය අවසතු කිරීම සඳහා හෝ මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ආකාරයකින් තැන්පතු වගකීම් ගෙවීම සඳහා හෝ වන විධානයන් සහ එයට ආනුෂංගික වෙනත් විධාන, මණ්ඩලය විසින්, ඒ මුදල් සමාගමට නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් මුදල් සමාගමක් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන නොයන බව විශ්වාස කිරීමට මණ්ඩලයට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඒ සමාගම විසින් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම අවසන් කර නොමැති බවට මණ්ඩලයේ දැන්වීමේ දින සිට සති දෙකක් ඇතුළත සාක්ෂි ඉදිරිපත් කරන ලෙස ඒ සමාගමට නියම කරමින්, මණ්ඩලය විසින්, ඒ සමාගමට ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යවනු ලැබිය හැකි ය. ඒ දැන්වීමේ දිනයේ සිට සති දෙකක් ඉකුත් විමෙන් පසු හෝ සමාගම එසේ සාක්ෂි ඉදිරිපත් කළහොත් ඒ සාක්ෂි සළකා බැලීමෙන් පසු හෝ ඒ දැන්වීම මණ්ඩලය විසින් ඉල්ලා අස්කර ගැනීම හෝ, ඒ මුදල් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා හෝ මුදල් සමාගමේ මුදල් ව්‍යාපාර අවසතු කිරීම සඳහා හෝ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් මුදල් සමාගමේ තැන්පතු වගකීම් ගෙවීම සඳහා හෝ වන විධානයන් සහ එයට ආනුෂංගික වෙනත් යම් විධාන, මණ්ඩලය විසින්, එම මුදල් සමාගමට නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ (2) හෝ (3) වන උපවගන්ති යටතේ නිකුත් කරනු ලැබූ විධාන, මණ්ඩලය විසින් නියම කරන ලද, එමෙන්ම, ඒ විධාන ඉටු කිරීම සඳහා මුදල් සමාගම විසින් ගෙන ඇති පියවර සැලකිල්ලට ගැනීමෙන් පසු සුවිශේෂ අවස්ථානුගත කරුණු යටතේ මණ්ඩලය විසින් දීර්ඝ කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ, ඉටු කිරීමට මුදල් සමාගමක් අපොහොසත් වන අවස්ථාවක, මුදල් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නඩුවක් පවරන ලෙස මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට නියම කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී 32 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

මුදල් යන වචනය භාවිතා කිරීම.

**10.** (1) මුදල් සමාගමක් විසින්, එහි නමේ කොටසක් ලෙස, “මුදල්”, “මූල්‍යකරණය” හෝ “මූල්‍ය” යන වචනයන්ගෙන් එකක් හෝ එහි අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක එයට සමාන වචනයක් හෝ භාවිතා කළ යුතු ය. “මුදල්”, “මූල්‍යකරණය” හෝ

“මූල්‍ය” යන වචනයන්ගෙන් එකක් හෝ එහි අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක එයට සමාන වචනයක් හෝ එහි නමේ නොමැති යම් මුදල් සමාගමක් විසින් “මුදල්”, “මූල්‍යකරණය” හෝ “මූල්‍ය” යන වචනයන්ගෙන් එකක් හෝ එහි අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක ඊට සමාන වචනයක් හෝ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට මාස හයක් ඇතුළත එහි නමේ ඇතුළත් කිරීම සඳහා, එහි නම වෙනස් කිරීමට අවශ්‍ය පියවර නොපමාව ගනු ලැබිය යුතු ය.

(2) මුදල් සමාගමක් හෝ (6) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් වන ආයතනයක් හැර, වෙනත් තැනැත්තකු විසින්, මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ලබා මිස, “මුදල්”, “මූල්‍යකරණය” හෝ “මූල්‍ය” යන වචන තනිව හෝ වෙනත් වචන සමග එක්ව හෝ ඉන් සෑදුන යම් වචනයක් හෝ එහි යම් අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක ඊට සමාන යම් වචනයක් හෝ, ඒ තැනැත්තාගේ නමේ හෝ විස්තරයේ හෝ ව්‍යාපාර නාමයේ කොටසක් ලෙස භාවිතා කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ (1) සහ (2) උපවගන්තිවලට යටත්ව, “මුදල්”, “මූල්‍යකරණය” හෝ “මූල්‍ය” යන වචන හෝ ඉන් සෑදුන යම් වචනයක් හෝ එහි අන්වක්ෂරිකරණයක්, හෝ වෙනත් භාෂාවක ඊට සමාන වචනයක් හෝ ඒ තැනැත්තාගේ නමේ හෝ විස්තරයේ හෝ ව්‍යාපාර නාමයේ හෝ කොටසක් ලෙස භාවිතා කරන යම් තැනැත්තකු විසින්, මණ්ඩලයේ ලිඛිත අවසරය ලබා ඇත්නම් හැර, “මුදල්”, “මූල්‍යකරණය” හෝ “මූල්‍ය” යන වචන හෝ ඉන් සෑදුන යම් වචනයක් හෝ එහි අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක ඊට සමාන වචනයක් හෝ ඒ නමෙන්, ඒ විස්තරයෙන් හෝ ඒ ව්‍යාපාර නාමයෙන් ඉවත් කිරීමෙන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට මාස හයක් ඇතුළත ඒ නම හෝ ඒ විස්තරය හෝ ව්‍යාපාරය නාමය වෙනස් කරනු ලැබිය යුතු ය.

(4) සමාගමේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා සහ වෙනත් යම් අදාළ අධිකාරියක් යටතේ පිහිටුවනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ, ඒවායේ නමේ, විස්තරයේ හෝ ව්‍යාපාර නාමයේ කොටසක් ලෙස “මුදල්”, “මූල්‍යකරණය” හෝ “මූල්‍ය” යන වචන හෝ ඉන් සෑදුන වචනයක් හෝ එහි යම් අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක ඊට සමාන වචනයක් භාවිතා කරන, සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද මණ්ඩල

පිළිබඳ තොරතුරු සපයන ලෙස ඒ මණ්ඩල පිහිටුවූ හෝ ලියාපදිංචි කළ අධිකාරියට, අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය. තව ද, ඒ අධිකාරිය හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු විසින් “මුදල්”, “මූල්‍යකරණය” හෝ “මූල්‍ය” යන වචන හෝ ඉන් සෑදුන වචනයක් හෝ එහි යම් අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක ඊට සමාන වචනයක් සිය නමේ, විස්තරයේ හෝ ව්‍යාපාර නාමයේ කොටසක් ලෙස භාවිතා කරන අවස්ථාවක, ඒ උල්ලංඝනය පිළිබඳව මේ පනතේ වෙනත් වගන්තියක විධිවිධාන යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබ හෝ ගැනීමට ඇත්තේ වුව ද පොදු යහපත උදෙසා මණ්ඩලය විසින් කවර හෝ මාර්ගයකින්:—

(අ) සංස්ථාගත කරන ලද තැනැත්තන් මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ සංස්ථාගත කරන ලද මණ්ඩලයේ නම, විස්තරය, ලිපිනය සහ ඒ සංස්ථාගත කරන ලද මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ලිපින; සහ

(ආ) සංස්ථාගත නොකරන ලද තැනැත්තන් මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ මණ්ඩලයේ නම, විස්තරය සහ ලිපිනය සහ සුදුසු යයි මණ්ඩලය අදහස් කරන්නේ නම් ඒ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් සහ ලිපින; සහ

(ඇ) තනි පුද්ගලයෙක් සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගලයාගේ නම සහ ලිපිනය සහ ඔහුගේ විස්තරය හෝ ව්‍යාපාර නාමය හෝ ඔහුගේ විස්තරය සහ ව්‍යාපාර නාමය යන දෙකම; සහ

ඒ තැනැත්තාගේ නමේ, හෝ විස්තරයේ හෝ ව්‍යාපාර නාමයේ කොටසක් ලෙස "මුදල්", "මූල්‍යකරණය" හෝ "මූල්‍ය" යන වචන හෝ ඉන් සෑදුනු වචනයක් හෝ එහි යම් අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක ඊට සමාන වචනයක් හෝ භාවිතා කිරීමට ඒ තැනැත්තාට බලයක් නොමැති බව ප්‍රසිද්ධ කරනු ලැබිය හැක.

(6) මේ වගන්තියේ සඳහන් කිසිවක්—

(අ) යම් සමාගමකට එහි නමේ කොටසක් ලෙස "මුදල්", "මූල්‍යකරණය" හෝ "මූල්‍ය" යන වචන හෝ එහි අන්වක්ෂරිකරණයක් හෝ වෙනත් භාෂාවක ඊට සමාන

වචනයක් භාවිතා කරන ලෙස මණ්ඩලය විසින් නියම කර ඇත්නම්. එවැනි සමාගමකට;

(ආ) තම අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා මුදල් සමාගම් විසින් පිහිටුවා ඇති සංගමයකට;

(ඇ) මුදල් සමාගමක සේවානියුක්තයන් වන සේවකයන්ගේ සංගමයක් හෝ එකමුතුවක් වන (138 වන අධිකාරය වූ) වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සමිතියකට;

(ඈ) යම් ආයතනයක් සම්බන්ධයෙන් ඒ වචන භාවිතය නීතියෙන් හෝ ජාත්‍යන්තර එකඟතාවයෙන් තහවුරු කර හෝ පිළිගෙන ඇති විටක එවැනි යම් ආයතනයකට; සහ

(ඉ) අධ්‍යාපන හෝ උපදේශන සේවා පමණක් සපයන සංස්ථාගත මණ්ඩලයකට,

අදාළ නොවිය යුතු ය.

(7) සෑම මුදල් සමාගමක් විසින්ම භාවිතා කිරීම සඳහා ලාංඡනයක් හෝ සංකේතයක් මණ්ඩලය විසින් හඳුන්වා දෙනු ලැබිය හැකි ය. මුදල් සමාගමක් හැර වෙනත් තැනැත්තකු විසින් ඒ ලාංඡනය හෝ සංකේතය භාවිතා කරනු නොලැබිය යුතු ය.

මුදල් සමාගමක ලුහුඬු නම හෝ එහි නමේ මුලකුරු එක්කොට සෑදූ නම භාවිතා කිරීම සීමා කිරීම.

**11.** (1) යම් සමාගමක්, තනි පුද්ගල ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ඒකකයක් විසින් මුදල් සමාගමක ලුහුඬු නම හෝ මුදල් සමාගමේ නාමයේ වචනවල මුලකුරු එක්කර සෑදූ නම හෝ සභික නාමයකින් අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමතියකින් තොරව කිසිදු නීතියක් යටතේ ලියාපදිංචි නොකළ යුතු ය.

එසේ වුව ද, මේ උපවගන්තියේ 2007 අංක 7 දරන සමාගම් පනතේ 7 සහ 10 වගන්ති ප්‍රකාර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත පවරා ඇති බලතලවලට යම් අහිතකර බලපෑමක් සිදුවන ලෙස තේරුම් නොගත යුතු ය.

(2) යම් මුදල් සමාගමක නම, ලුහුඬු නම, නමේ වචනවල මුලකුරු එක් කොට සෑදූ නම, අදාළ මුදල් සමාගම හැර වෙනත් තැනැත්තකු විසින්, අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අවසරයෙන් තොරව, සිය ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා වන කිසිම වෙළෙඳ දැන්වීමක භාවිතා කරනු නොලැබිය යුතු ය.

II වන කොටස

**මුදල් සමාගම් සඳහා වන විධානයන්, රීතින් සහ නියමයන්**

මණ්ඩලයේ විධාන.

**12.** (1) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මුදල් සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතුවල යම් අංගයක් පවත්වාගෙන යාම සහ විශේෂයෙන්ම පහත සඳහන් කාරණා සම්බන්ධයෙන්, මණ්ඩලය විසින් මුදල් සමාගම්වලට හෝ යම් කණ්ඩායමකට හෝ වර්ගයකට අයත් මුදල් සමාගම්වලට හෝ විධාන දෙනු ලැබිය හැකි ය.

(අ) ඒ සමාගම් විසින් තැන්පතු භාර ගනු ලැබිය හැක්කේ යම් නියම සහ කොන්දේසි යටතේ ද ඒ නියමයන් සහ කොන්දේසි, ඒ තැන්පතු මත ගෙවිය යුතු උපරිම පොළී අනුපාතික, තැන්පතු භාර ගනු ලැබිය හැකි උපරිම කාලසීමාවන්. එක් ගිණුමක හෝ ඊට වැඩි ගිණුම් ගණනක එක් තැනැත්තකුගේ නමින් මුදල් සමාගමක තැන්පත් කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය;

(ආ) ඒ සමාගම් විසින් යම් ණයක්, ණය පහසුකමක් හෝ යම් වර්ගයකට අයත් මූල්‍ය පහසුකමක් ප්‍රදානය කරන්නේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද ඒ නියම සහ කොන්දේසි, ඒ ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගවලට අයත් මූල්‍ය පහසුකම් මත අය කරනු ලැබිය හැකි උපරිම පොළී අනුපාතික සහ ඒ ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගයකට අයත් මූල්‍ය පහසුකම් ප්‍රදානය කරනු ලැබිය හැකි උපරිම කාලසීමාව;

(ඇ) කොමිස්, වට්ටම්, ගාස්තු හෝ වෙනත් කවර වූ හෝ ලැබීම් හෝ ගෙවීම් ආකාරයෙන් ඒ සමාගම්වලට ගෙවනු ලැබිය හැකි නැතහොත් ඒ සමාගම් විසින් අය කරනු ලැබිය හැකි උපරිම අනුපාතික;

(ඈ) ඒ සමාගම් විසින් ආයෝජන කරනු ලැබිය හැක්කේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, ඒ නියම සහ කොන්දේසි;

(ඉ) ඒ සමාගම් විසින් දෙනු ලබන ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගවලට අයත් මූල්‍ය පහසුකම් සහ කරනු ලබන ආයෝජන සඳහා අවසර දෙනු ලැබිය හැකි උපරිම කල් පිරීමේ කාලසීමාව සහ විවිධාකාර සහ වර්ගවලට අයත් ණය දීම්, ණය සහ ආයෝජන කටයුතු සඳහා නියම කරනු ලැබිය හැකි හෝ අවසර දෙනු ලැබිය හැකි සුරැකුම්වල ස්වභාවය සහ මුදල් ප්‍රමාණය:—

(ඊ) ඒ සමාගම් විසින් ගිණුම් පොත් හෝ වෙනත් වාර්තා හෝ ලේඛන පවත්වාගෙන යා යුතු ආකෘතිය සහ ආකාරය ;

(උ) ප්‍රදානය කරනු ලැබූ ණය නියමිත කාලයේදී ආපසු ගෙවා නැත්නම් ප්‍රදානය කරන ලද ණය සම්බන්ධයෙන් ගෙවා නොමැති පොලිය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් ඒ සමාගම්වල ආදායමෙන් බැහැර කිරීම ;

(ඌ) ඒ සමාගම්වල ද්‍රවශීල වත්කම් සහ ඒ සමාගම්වල මුළු තැන්පතු වගකීම් අතර පැවතිය යුතු අවම අනුපාතය ;

(එ) මණ්ඩලය විසින් නියම කරනු ලැබුවහොත් මුදල් සමාගම් විසින් මහ බැංකුව සමග මුදල් ශේෂ පවත්වාගෙන යෑම සහ ඒ මුදල් ශේෂ සහ මුදල් සමාගම්වල තැන්පතු වගකීම් අතර පැවතිය යුතු අවම අනුපාතය ;

(ඒ) තැන්පතුකරුවන් විසින් කල් පිරීමට පෙර තැන්පතු ආපසු ගැනීමට අදාළ විය යුතු කොන්දේසි ;

(ඔ) සිය ණය, ණය පහසුකම්, වෙනත් මූල්‍ය පහසුකම් හෝ ආයෝජන වැඩි කිරීම ඒ සමාගම්වලට තහනම් කිරීම ;

(ඕ) එ සමාගම් විසින් කරනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන යම් ණය, ආයෝජන හෝ මූල්‍ය පහසුකම් නිශ්චිත කාලසීමා ඇතුළත වැඩි කරනු ලැබිය හැකි සීඝ්‍රතාව පිළිබඳ සීමා නියම කිරීම;

(ක) නිශ්චිත කාලසීමාවන් ඇතුළත තම ණය, ආයෝජන හෝ මූල්‍ය පහසුකම්වල මුදල් ප්‍රමාණ නිශ්චිත සීමාවන් වලට අඩු කිරීමට ඒ සමාගම්වලට නියම කිරීම;

(ග) මුදල් සමාගමක කොටස් ප්‍රාග්ධනයෙන් —

(i) සමාගමක්, සංස්ථාගත කරන ලද මණ්ඩලයක් හෝ පුද්ගලයකු විසින් ; සහ

(ii) එකතුවක් වශයෙන්—

(අ) සමාගමක් සහ පහත දැක්වෙන ඒවායින් එකක් හෝ වැඩි ගණනක් විසින්—

(අඅ) එහි පාලිත සමාගම්;

(ආආ) එහි පාලක සමාගම;

(ඇඇ) එහි පාලක සමාගමේ පාලිත සමාගමක්; හෝ

(ඈඈ) ඒ සමාගම හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලකිය යුතු සම්බන්ධතාවයක් දරන සමාගමක්; හෝ

(ආ) තනි පුද්ගලයකු සහ පහත දැක්වෙන අය හෝ මණ්ඩල අතුරින් එකක් හෝ වැඩි ගණනක් විසින්—

(අඅ) ඔහුගේ ඥාතියකු;

(ආආ) ඔහුගේ සැලකිය යුතු සම්බන්ධතාවයක් හෝ ඔහුගේ ඥාතියාගේ සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇත්තා වූ සමාගමක්;

(ඇඇ) ඒ සමාගමේ පාලිත සමාගමක්;

(ඈඈ) ඒ සමාගමේ පාලක සමාගමක්;

(ඉඉ) ඒ සමාගමේ පාලක සමාගමේ පාලිත සමාගමක්;

(ඊඊ) ඒ සමාගම හෝ එහි පාලිත සමාගම හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලකිය යුතු සම්බන්ධතාවයක් දරන සමාගමක්; හෝ

(උඋ) ඒ පුද්ගලයාගේ හෝ ඔහුගේ ඥාතියාගේ සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇත්තා වූ සමාගමක් නොවන්නා වූ සංස්ථාගත මණ්ඩලයක්; හෝ

(ඈ) අවස්ථාවෝචිත පරිදි, පුද්ගලයකු හෝ සමාගමක් කෙලින්ම, වක්‍රාකාරව හෝ වාසිදායකව, එක් එක් සමාගමේ සැලකිය යුතු සම්බන්ධතාවක් හෝ වැදගත් කළමනාකරණ සම්බන්ධතාවයක් දරන්නේ යම් සමාගම්වලද, ඒ සමාගම් විසින්—

දරනු ලැබිය හැකි කොටස් ප්‍රාග්ධනයේ උපරිම ප්‍රතිශතය.

(ච) ඒ සමාගම් විසින්, සුරක්ෂණය කළ පහසුකම් සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු සීමා;

(ඡ) මුදල් සමාගම් විසින් කරගෙන යනු ලැබිය හැකි ක්‍රියාකාරකම් වර්ග පිළිබඳ සීමා;

(ට) මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරයන්ට හෝ සේවකයන්ට වැටුප්, දීමනා, වරප්‍රසාද, වියදම් ප්‍රතිපූරණ, සේවය අවසන් වීමේ දී ලැබෙන ප්‍රතිලාභ පාරිතෝෂික සහ වෙනත් විශ්‍රාමික දීමනා ලෙස කරන ගෙවීම්;

(ඩ) මුදල් සමාගමක් පවත්වාගෙන යා යුතු මූලික ප්‍රාග්ධන ප්‍රමාණය;

(ණ) මුදල් සමාගමක් අධ්‍යක්ෂවරයන්ට, ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයන්ට තිබිය යුතු අධ්‍යාපනික සහ වෘත්තීයමය සුදුසුකම් සහ පළපුරුද්ද;

(ත) මුදල් සාමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ ගණපූරණයේ සංයුතිය සහ ව්‍යුහය;

(ද) මුදල් සමාගමක අධ්‍යක්ෂවරයන් පත් කිරීමේදී, තෝරා පත් කර ගැනීමේදී පත්කරගැනීමේදී සහ නම් කිරීමේදී මණ්ඩලයේ පූර්ණ අනුමතය ලබා ගැනීමේ අවශ්‍යතාවය;

(න) මුදල් සමාගමක ප්‍රධාන විධායක නිලධාරියාගේ පත් කිරීම සඳහා අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමතය ලබා ගැනීමේ අවශ්‍යතාවය;

(ප) නිශ්චල දේපළ අත්කර ගැනීමේ දී සහ ඒවා මිල කිරීමේදී මුදල් සමාගම විසින් අනුගමනය කළ යුතු නියම, කොන්දේසි සහ පටිපාටීන්;

(බ) ඒ සමාගම් විසින් පාලිත සහ ආශ්‍රිත සමාගම් පිහිටුවීම;

(ම) මණ්ඩලය විසින් මේ පනත යටතේ පනවනු ලැබිය හැකි යම් දඩයක් ගෙවීම සහතික කිරීම සඳහා. මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වටිනාකමකින් සහ නියම අනුව, මුදල් සමාගමක් විසින් බැංකු ඇපයක් ඉදිරිපත් කිරීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයක් මගින්, මුදල් සමාගමක් විසින් මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර හෝ පසුව හෝ අත්කර ගන්නා ලද නැතහොත් දරන ලද එහි වත්කම් හෝ බැරකම් කිසිවක ස්වාභාවය හෝ ප්‍රමාණය වෙනස් කරනු ලැබිය යුතු යයි නියම කරනු ලැබූව ද ඒ විධාන බලපැවැත්විය යුතු ය:

එසේ වුවද, ඉහත සඳහන් පරිදි වෙනසක් කිරීමට නියම කරනු ලැබූ මුදල් සමාගමකට ඒ නියමය අනුව කටයුතු කිරීම පිණිස, ඒ විධානයේ දින සිට මාස දොළහක කාලසීමාවක් හෝ මණ්ඩලය විසින් ඉඩ දෙනු ලබන වැඩිදුර කාලසීමාවක් සඳහා අවසර දෙනු ලැබිය යුතු ය.

(3) මුදල් සමාගමක් විසින් (1) වන උපවගන්තියේ (ග) ඡේදය යටතේ එය වෙත නිකුත් කරන ලද විධානයක් අනුව කටයුතු කිරීම

සඳහා ඒ මුදල් සමාගමේ කොටස් දරන තැනැත්තකුට, ඒ සමාගමේ ඒ තැනැත්තා විසින් දරනු ලබන කොටස් සංඛ්‍යාව ඒ තැනැත්තා විසින් මේ පනත ක්‍රියාත්මක වීම පටන් ගන්නා දිනයට පෙර හෝ පසුව අත්කර ගනු ලැබුවා වුව ද, ඒ විධානයේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත දී අඩු කරන ලෙස ඒ මුදල් සමාගම විසින් ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි අතර, ඒ විධානය අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (එ) ඡේදය යටතේ මුදල් සමාගමක් වෙත නිකුත් කරන ලද විධානයන් අනුව කටයුතු කරමින් මුදල් සමාගමක් විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන යම් මුදල් ශේෂයක් මත, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් අනුපාතිකයක් අනුව, මණ්ඩලය විසින් ස්වකීය අභිමතය අනුව පොලියක් ගෙවනු ලැබිය හැකි ය.

(5) අවශ්‍ය අවස්ථාවන්හි දී, විශේෂයෙන් (1) වන උපවගන්තියේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් යම් මුදල් සමාගමකට විධාන දෙනු ලැබිය හැකි ය.

(6) මූල්‍ය පද්ධතියේ ශක්තිමත්භාවය සහතික කිරීම සඳහා, මණ්ඩලය විසින් මුදල් සමාගම්වල පාලක සමාගම්වලට, පාලිත සමාගම්වලට සහ ආශ්‍රිත සමාගම්වලට, ඒ සමාගම්වල ව්‍යාපාර කටයුතුවල යම් අංශයක් පවත්වාගෙන යා යුතු ආකාරය පිළිබඳව, විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

විධාන පිළිපැදීම අධීක්ෂණය කිරීම.

**13.** මේ වගන්තියේ 12 වන උපවගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ නිකුත් කරනු ලැබූ විධාන පිළිපැදීම අධීක්ෂණය කළ යුතු ආකාරය සම්බන්ධයෙන්, මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි අතර, නොපමාව හෝ අධ්‍යක්ෂවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ හෝ ඒ විධාන පිළිපදින ලෙස මුදල් සමාගම්වලට විධාන කිරීමට ද මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට බලය දෙනු ලැබිය හැකි ය.

විධානයන්ට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග.

**14.** (1) මේ වගන්තියේ 12 වන වගන්තියේ (1) සහ (2) වන උපවගන්ති යටතේ නිකුත් කරන ලද යම් විධානයක් අනුව කටයුතු කිරීමට යම් මුදල් සමාගමක් පැහැර හැරියහොත් 13 වන වගන්තිය යටතේ නිකුත් කළ යම් මාර්ගෝපදේශයන්හි අන් අයුරකට විධිවිධාන සලසා තිබේ නම් හැර, අධ්‍යක්ෂවරයා ඒ බව මණ්ඩලයට වාර්තා කරනු ලැබිය යුතු ය. එවැනි අවස්ථාවක දී මේ පනතේ 25 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) මේ වගන්තියේ 13 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ මාර්ගෝපදේශ අනුව අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුව ක්‍රියා කිරීමට යම් මුදල් සමාගමක් පැහැර හැරියහොත්, අධ්‍යක්ෂවරයා ඒ බව මණ්ඩලයට වාර්තා කරනු ලැබිය යුතු අතර, එවැනි අවස්ථාවක දී, මේ පනතේ 25 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

ලේඛන සහ තොරතුරු ඉදිරිපත් කරන ලෙස කරන විධානයන්.

**15.** මුදල් සමාගමක ව්‍යාපාර සහ ආයතනික කටයුතු කර ගෙන යන ආකාරය පිළිබඳව නිශ්චිතව දැන ගැනීම සඳහා හෝ වෙනත් විශේෂිත අරමුණක් සඳහා, ඒ විධානයේ නිශ්චිතව සඳහන් විය යුතු ආකාරයකින්, ආකෘති පත්‍රයකින් සහ කාලාන්තරවල හෝ කාලයක, ලේඛන සහ තොරතුරු සපයන ලෙස අධ්‍යක්ෂවරයා විසින් යම් මුදල් සමාගමකට විධාන කරනු ලැබිය හැකි ය.

රීති.

**16.** (1) මේ පනත යටතේ රීති සෑදීමට බලය දෙනු ලැබ ඇති හෝ සඳහන් කරනු ලැබ හෝ නියම කරනු ලැබ ඇති යම් කරුණක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි මණ්ඩලය විසින් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ යම් කරුණක් හෝ සම්බන්ධයෙන්, රීති සාදනු ලැබිය හැකි ය:—

(අ) මුදල් සමාගම්වලට බලපත්‍ර දීම සහ මුදල් සමාගම් විසින් මණ්ඩලයට ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තු;

(ආ) මේ පනත යටතේ භාවිතා කළ යුතු ආකෘති පත්‍ර;

(ඇ) මුදල් ව්‍යාපාරයේ යම් අංගයක් සම්බන්ධයෙන් මුදල් සමාගමක් විසින් යම් ප්‍රකාශ පත්‍රයක් හෝ වෙළඳ දැන්වීමක් නිකුත් කිරීම, විධිමත් කිරීම හෝ තහනම් කිරීම සහ ඒ සංස්ථා පත්‍රය හෝ වෙළඳ දැන්වීම නිකුත් කළ යුත්තේ කවර කොන්දේසි යටතේ ද ඒ කොන්දේසි.

මූලික ප්‍රාග්ධනය.

**17.** (1) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීම සඳහා සමාගමක් සතුව තිබිය යුතු අවම මූලික ප්‍රාග්ධන ප්‍රමාණය, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මණ්ඩලය විසින් එසේ තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන දෙසීයකට අඩු නොවිය යුතු ය.

(2) මුදල් සමාගමක් විසින් එහි මූලික ප්‍රාග්ධනය, ඒ සමාගමට මුදල් සමාගමක් ලෙස බලපත්‍රයක් දෙනු ලැබූ අවස්ථාවේ පැවැති මට්ටමට වඩා අඩු නොවන මට්ටමක සෑම අවස්ථාවකදීම පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

එසේ වුව ද, මණ්ඩලය විසින් මේ පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව වඩා ඉහළ මූලික ප්‍රාග්ධන ප්‍රමාණයක් හෝ මුදල් සමාගමක වත්කම් සහ වගකීම්වලට අදාළව මූලික ප්‍රාග්ධනයක් පවත්වාගෙන යෑම නියම කරමින් විධානයක් නිකුත් කර ඇති අවස්ථාවක, මුදල් සමාගමක් විසින් ඒ විධානයට අනුකූලව මූලික ප්‍රාග්ධනය පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

**18.** (1) මුදල් සමාගමක් විසින් සෑම අවස්ථාවකදීම, සංචිත අරමුදලක් පවත්වාගෙන යා යුතු ය. සෑම මුදල් සමාගමක්ම, එක් එක් අවුරුද්ද සඳහා බදු ගෙවීමෙන් පසු, එහෙත් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට පෙර, මණ්ඩලය විසින් විධාන කරනු ලැබිය හැකි ආකාරයට, සමාගමේ ශුද්ධ ලාභයෙන් යම් කොටසක් සංචිත අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය.

සංචිත අරමුදල.

(2) මුදල් සමාගමක් විසින් එහි ප්‍රාග්ධනය හෝ එහි සංචිත අරමුදලේ ඇති මුදල් ප්‍රමාණයක් මණ්ඩලයේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව අඩුකිරීම හෝ හීන කරනු නොලැබිය යුතු ය.

**19.** මුදල් සමාගමක් විසින් සියලුම අවස්ථාවල, එහි තැන්පත්කරුවන්ගේ සම්බන්ධතා ආරක්ෂා වන ආකාරයෙන් එහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යා යුතු අතර, තැන්පතු සහ ඒ මත ගෙවන පොලී නියමිත දිනයන් හි තැන්පත්කරුවන්ට ගෙවීම සඳහා සධාරණ ලෙස අවශ්‍ය වන සියලු පියවර ගෙනු ලැබිය යුතු ය.

මුදල් සමාගම් විසින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑම.

**20.** (1) තැන්පත් මුදලක් ඉල්ලූ විට හෝ, තැන්පතුව කරන අවස්ථාවේ දී කල් පිරෙන දිනය ගිවිසගෙන තිබේ නම් එම කල් පිරෙන දිනයේ දී හෝ එදිනට පසුව, තැන්පත්කරුවකුට, ඒ තැන්පත් මුදල නැවත ගෙවීමට හෝ ඒ මත පොලිය ගෙවීමට යම් මුදල් සමාගමක් අපොහොසත් වන අවස්ථාවක, ඒ සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකුම හෝ ලේකම්වරයකුම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

තැන්පතු ගෙවීමට හෝ පොලිය ගෙවීමට අපොහොසත්වීම වරදක් බව.

එසේ වුව ද, ඒ වරද සිදුකරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව සහ ඒ වරද සිදුකිරීම වැළැක්වීම පිණිස තමා විසින් නිසි

උද්‍යෝගයෙන් ක්‍රියා කර ඇති බව ඔහු විසින් ඔප්පු කළහොත්, ඒ අධ්‍යක්ෂවරයා, කළමනාකරුවා හෝ ලේකම්වරයා ඒ වරදට වරදකරු නොවිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර තමාගේ තැන්පතු මුදල සහ පොලිය ඉල්ලූ විට හෝ කල් පිරුන විට නොගෙවනු ලැබ ඇති යම් තැන්පත්කරුවකු විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විභාග සංග්‍රහය පනතේ 136 වන වගන්තිය ප්‍රකාර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

මුදල් සමාගම්වල යම් තනතුරු දැරීම සඳහා නුසුදුසු වීම.

21. (1) යම් තැනැත්තකු—

(අ) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක යම් අධිකරණයකින් බුන්වත් භාවයෙන් නිදහස් කරනු ලැබ නැති තැතැත්තකු හෝ බංකොලොත්භාවයට පත් තැනැත්තකු, ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇති තැනැත්තකු නම්;

(ආ) චරිත දූෂණය සම්බන්ධයෙන් යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් වරදකරුවකු කර ඇත්නම්;

(ඇ) මේ පනත යටතේ හෝ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යම් වරදක් සඳහා යම් අධිකරණයකින් වරදකරු කර ඇත්නම්;

(ඈ) මණ්ඩලය විසින් මේ පනතේ 51 වන වගන්තිය යටතේ ඔහුට විරුද්ධව ක්‍රියාකරනු ලැබ ඇති තැනැත්තකු නම්;

(ඉ) (i) පොලිසිය, යම් පාලන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය සංවිධානයක්, යම් පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ ශ්‍රී ලංකාවේ හෝ පිට රටක නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් හෝ විසින් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව සිදුකරන විමර්ෂණයකට හෝ විභාග කිරීමකට භාජනය වී සිටීනම්;

(ii) එසේ පත් කරනු ලැබීමට හෝ තෝරාපත්කර ගනු ලැබීමට පෙරාතුවම වූ අවුරුදු පහළොව ඇතුළත යම් පාලන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය

සංවිධානයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක්, ශ්‍රී ලංකාවේ හෝ පිටරටක නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් මණ්ඩලයක් හෝ විසින් වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක් පිළිබඳව වරදකරු කරනු ලැබ ඇත්තනම්;

(ඡ) (i) වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් සමාන සාපරාධී ක්‍රියාවක් ඇතුළත් වරදක් සඳහා ඔහුට විරුද්ධව නඩු කටයුතු පවතී නම්;

(ii) එසේ පත් කරනු ලැබීමට හෝ තෝරා පත් කරනු ලැබීමට පෙරාතුමව වූ අවුරුදු පහළොවට පෙර වංචාවක්, රැවටීමක්, වංක ක්‍රියාවක් හෝ වෙනත් සමාන සපාරාධී ක්‍රියාවක් ඇතුළත් වරදක් සඳහා යම් අධිකරණයකින් වරදකරු කර ඇත්නම්;

(ළ) පාලන හෝ අධීක්ෂණ අධිකාරියක් විසින්, ශ්‍රී ලංකාවේ හෝ පිටරටක යම් බැංකුවක, මුදල් සමාගමක හෝ සංස්ථාගත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ වෙනත් නිලධරයකු ලෙස සේවය කිරීමෙන් ඉවත් කරනු ලැබ හෝ සේවය කිරීම අත්හිටුවනු ලැබ ඇත්නම්;

(ළු) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සිහිවිකල බවට පත්ව ඇති බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(එ) බලපත්‍රය හෝ ලියාපදිංචිය අත්හිටුවනු ලැබ හෝ අවලංගු කරනු ලැබ ඇති යම් බැංකුවක, මුදල් සමාගමක් හෝ මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු වන්නේ නම් හෝ වෙනත් වගකිව යුතු තනතුරක් දරා ඇත්නම්;

(ඒ) (i) (අ) මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින්; හෝ

(ආ) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ (එය ඉවත් කරනු ලැබීමට පෙර) 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින්,

මුදල් ව්‍යාපාරය කරගෙන ගොස් ඇති බව; හෝ

(ii) මේ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් තැන්පතු භාරගෙන ඇති බව

මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත්නම්

(ඔ) මේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් හෝ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ ( එය ඉවත් කරනු ලැබීමට පෙර) 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාරය කරගෙන ගොස් ඇති බව හෝ මේ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් තැන්පත් භාරගෙන ඇතිබව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇති යම් සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු ලෙස කටයුතු කර හෝ වෙනත් වගකිව යුතු තනතුරක් දරා ඇත්නම්

ඒ තැනැත්තා, අවස්ථාවෝචිත පරිද, මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු හෝ ලේකම්වරයකු හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරකු ලෙසපත් කරනු ලැබීමට හෝ තෝරා පත්කරනු ලැබීමට හෝ ඒ තනතුරු දැරීමට හෝ නුසුදුසු විය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති නුසුදුසුකමට යටත්ව සිටිය දී, මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායයක නිලධරයකු හෝ ලේකම්වරයකු හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම.

**22.** (1) අධ්‍යක්ෂවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි, ආකෘතියකට අනුව සහ දිනයක තිබූ පරිදි, සිය වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් අධ්‍යක්ෂවරයාට කරන මෙන්, මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට හෝ සේවානියුක්තයකුට අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් ඉල්ලා සිටීමේ දී, යම් නිශ්චිත කාලයක් සඳහා, බැරකම් වැඩිවීම සහ අඩුවීම පිළිබඳව සහ වත්කම් අත්කර ගැනීම සහ බැහැර කිරීම විස්තර ද අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා වත්කම් සහ බැරකම් යනුවෙන් අදහස කරනුයේ, ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිට වත්කම් සහ බැරකම් වන අතර, එයට, ප්‍රකශය කරන තැනැත්තාට හෝ ඔහුගේ ඥාතියාට මුළුමනින්ම හෝ කොටසක් අයිති චංචල හා නිශ්චල දේපළ සහ ප්‍රකාශය කරන තැනැත්තාට හෝ ඔහුගේ ඥාතියාට අර්ථදායී සම්බන්ධතාවක් ඇති යම් දේපළක් ද ඇතුළත් වේ.

අක්‍රිය තැන්පතු මත බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කිරීම.

**23.** (1) තැන්පතුවක හිමිකරුවකු හෝ තැන්පතුව සම්බනධයෙන් හිමිකරුගේ වලංගු ඇටෝර්න් බලයක් දරන්නෙකු, අවුරුදු දහයකට නොඅඩු කාලසීමාවක් තුළ

(අ) මුදල් සමාගම් සමග තැන්පතුවක් කිරීමෙන් හෝ මුදල් ආපසු ගැනීමෙන් ගනුදෙනුවක් කර නැති අවස්ථාවක; සහ

(ආ) මුදල් සමාගම යම් ලිපි ගනුදෙනුවක් කර නැති අවස්ථාවක

එම තැන්පතුව අක්‍රිය වී ඇති ලෙස සැලකිය යුතු ය.

එසේ වුවද, නෛතික වයෝ පූර්ණත්වයට පත්ව නැති තැනැත්තකු සතු තැන්පත්තුවක් සම්බන්ධයෙන් අවුරුදු දහයේ කාලසීමාව ආරම්භ විය යුත්තේ, ඒ තැනැත්තා නෛතික වයෝ පූර්ණත්වයට පත්වූ අවස්ථාවේ සිටය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වූ අක්‍රීය තැන්පත්තුවක් දරන්නා වූ යම් මුදල් සමාගමක්, තැන්පත්තුවේ ස්වාභාවය ප්‍රකාශ කරමින්, මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි අකාරයකට සහ වේලාවක දී මණ්ඩලය වෙත වාර්තාවක් කරනු ලැබිය යුතු ය.

(3) යම් මුදල් සාමාගමකට,ඒ සමාගම විසින් වාර්තා කරනු ලැබූ අක්‍රීය තැන්පතු පිළිබඳව, මණ්ඩලය අවශ්‍ය යයි සලකනු ලබන ක්‍රියාමාර්ග ගන්නා මෙන් මණ්ඩලය විසින් විධාන කරනු ලැබිය

හැකිය. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, ඒ තැන්පතුවේ තිබෙන සියලු මුදල් මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කරන ලෙස මණ්ඩලය විධාන කළහොත්, මුදල් සමාගම විසින් එය මාරු කළ යුතු අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාර්ය සඳහා මණ්ඩලය විසින් එම මුදල් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය.

(4) මුදල් සමාගමක් ඉදිරිපත් කළ වාර්ථාවක ඇතුළත් සහ (3) වන උපවන්තිය යටතට නොවැටෙන යම් අක්‍රීය තැන්පත්තුක්, මණ්ඩලය විසින් අමාත්‍යාවරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, අමාත්‍යාවරයා විසින් අවස්ථානුගත කරුණු යටතේ සුදුසු යැයි ඔහු සලකනු ලබන යම් උපදේශ ඔහු විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ (2) වන උපවගන්තිය මගින් ඉදිරිපත් කරන ලෙස නියම වූ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසු දින තිහක් ඇතුළත, හිමිකරුගේ නම සහ ඒ තැන්පතුව පිළිබඳ විස්තර සඳහන් කරමින් දැන්වීමක්, අදාළ මුදල් සමාගම විසින් යටත් පිරිසෙයින්, ශ්‍රී ලංකාවේ සංසරණය වන එක් දෛනික සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි පුවත්පතක පළ කළ යුතු අතර, හිමිකරුට ඔහුගේ අවසන් වරට දන්නා ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් තැන්පතුව පිළිබඳ විස්තර ඇතුළත් දැන්වීමක් යවනු ලැබිය යුතු ය. එසේ වුවද, මුදල් සමාගම කරන සාධාරණ හේතු දැක්වීමක් මත, මණ්ඩලය විසින්, ඒ දැන්වීම තැපැල් කිරීමෙන් ඒ සමාගම නිදහස් කරනු ලැබිය හැකිය.

(6) යම් මුදල් සමාගමක් තබාගේ බැරට, තමාගේ නමින් හෝ තමාට හිමකම් ව්‍යුත්පන්න වන්නේ යම් තැනැත්තකුගේද ඒ තැනැත්තාගේ නමින් හෝ ඇති යම් මුදලක්, (3) වන උපවගන්තිය යටතේ මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කර ඇති බව මණ්ඩලය සෑහිමකට පත්වන අයුරින් ඔප්පු කරන යම් තැනැත්තකුට, යම් ලිඛිත නීතියකින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ ඒ මුදල් සම්බන්ධයෙන් පනවනු ලැබිය හැකි නියමවලට, කොන්දේසිවලට සහ සීමාකිරීම්වලට යටත්ව, මණ්ඩලය විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි අනුපාතික අනුව ඒ මුදල් ආපසු ගෙවනු ලැබූ දිනය දක්වා වූ පොලියත් සමග හෝ, පොලිය නොගෙවීමට මණ්ඩලය තීරණය කළ හොත්, එබඳු පොලියක් රහිතව, ඒ මුදල් මහ බැංකුව විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

## III වන කොටස

## මුදල් සමාගම් පරීක්ෂා කිරීම සහ අධීක්ෂණ ක්‍රියාමර්ග

මුදල් සමාගම් පරීක්ෂා කිරීම.

**24.** (1) අධ්‍යක්ෂවරයා ඔහු විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් ඒ සඳහා බලය දෙන ලද, මහ බැංකුවේ යම් නිලධාරියකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින්, සෑම මුදල් සමාගමකම පොත් සහ ගිණුම් එක් එක් පරීක්ෂණ කාලසීමාව තුළ අවම වශයෙන් එක් වරක්වත් පරීක්ෂා කළ යුතු අතර, අධ්‍යක්ෂවරයා විසින් සුදුසු යයි සලකනු ලබන යම් නිශ්චිත මුදල් සාමගමක් සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ගයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය.

(අ) අවශ්‍ය යයි ඔහු විසින් සළකනු ලබන තොරතුරු, ඔහු විසින් නිශ්චිතව සඳහන් කරන ලද කාලයක් තුළ දී හා ආකාරයකින් හෝ ආකෘතියකින් සපයන ලෙස යම් මුදල් සමාගමකට හෝ ඒ මුදල් සමාගමේ අධ්‍යක්ෂවරයකුට, ලේකම්වරයකුට, කළමනාකරුවෙකුට, සේවානියුක්තයකුට, විගණකවරයකුට, අනුයෝජිතයකුට, කොන්ත්‍රාත්කරුවකුට නියම කිරීම;

(ආ) යම් මුදල් සමාගමකට හෝ ඒ මුදල් සමාගමේ අධ්‍යක්ෂවරයකුට, ලේකම්වරයකුට, කළමණාකරුවකුට, සේවානියුක්තිකයකුට, විගණකවරයකුට, අනුයෝජිතයකුට හෝ කොන්ත්‍රාත්කරුවකුට ඒ මුදල් සමාගමේ මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික් හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, නියම කරන ආකාරයකින් ඒ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ ඒ වෙනත් ලේඛනවල සහතික කළ පිටපත් සපයන ලෙසත් නියම කිරීම ;

(ඇ) යම් මුදල් සමාගමක පරිශ්‍රයට හෝ ගබඩා ප්‍රදේශයට ඇතුළු වීම සහ, වෙනත් යම් නීතියක පටහැනි කුමක් සඳහන්ව තිබුණද, ඒ මුදල් සමාගමේ, මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික් හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන, පොත් වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සහ ඒ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර් සහ ඒ වෙනත් ලේඛනවල සහතික කළ හෝ නොකළ පිටපත් අවශ්‍ය ඕනෑම ආකාරයකින් ලබා ගැනීම ;

එසේ වුවද, මුදල් සමාගමක, මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික් හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන, ඉහත සඳහන් කළ ස්ථාන හැර වෙනත් ස්ථානයක තබා ඇති බවට අධ්‍යක්ෂවරයාට පිළිගත හැකි තොරතුරු ලැබී ඇත්නම්, අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට ඒ ස්ථානයට ඇතුළුවී පරීක්ෂා කිරීමට සහ ඒ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ එම වෙනත් ලේඛන පරීක්ෂා කිරීමට සහ අවශ්‍ය නම්, ඒවායේ සහතික කළ හෝ නොකළ පිටපත් ඕනෑම ආකාරයකින් ලබා ගැනීමටද බලය තිබිය යුතු ය :

එසේ වුවද, වැඩි දුරටත්, එසේ ඇතුළු වීමට හෝ සෝදිසි කිරීමට විරෝධය පෑමක් හෝ අවහිර කිරීමක් හෝ තොරතුරු සැඟවීමක් සිදු වේ යයි අධ්‍යක්ෂවරයා විශ්වාස කරන්නේ නම්, වරෙන්තුවේ සඳහන් ස්ථානයට ඔහු හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු ඇතුළුවී සෝදිසි කිරීම සඳහා ඔහු විසින් මහෙස්ත්‍රාත්වරයකුගෙන් වරෙන්තුවක් ලබාගනු ලැබිය හැකි ය. අධ්‍යක්ෂවරයා හෝ එසේ බලය දෙන ලද තැනැත්තා විසින් මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික් හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන යම් පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන සහ අදාළ තෙරතුරු අඩංගු ඉලෙක්ට්‍රෙනික් උපකරණ තම භාරයට ගනු ලැබිය හැකිය. අධ්‍යක්ෂවරයා විසින් එවැනි යම් ස්ථානයකට ඇතුළුවන විට ඒ ස්ථානය පිහිටා තිබෙන්නේ යම් පොලිස් ස්ථානගත බල ප්‍රදේශයක් තුලද ඒ පොලිස් ස්ථාන භාර නිලධරයාගේ සහය ලබාගත හැකි ය :

මේ ඡේදයේ කාර්ය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු නොවන යම් තැනැත්තකු එකී මුදල් සමාගමේ යම් පරිශ්‍රයකට ඇතුළුවන විට, අධ්‍යක්ෂවාරයා හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු කැටුව යා යුතු ය.

(ඇ) යම් මුදල් සමාගමක පාලක සමාගමට, යම් පාලිත සමාගමකට හෝ ආශ්‍රිත සමගමකට හෝ යම් මුදල් සමාගමක පාලක සමාගමේ යම් පාලිත සමාගමකට හෝ ආශ්‍රිත සමාගමකට හෝ අධ්‍යක්ෂවරයාගේ මතයට අනුව මුදල් සමාගමේ සැලකිය යුතු මූල්‍ය සම්බන්ධතාවයක් හෝ වැදගත් කළමනාකාරිත්ව සම්බන්ධතාවයක් දරන වෙනත් සමාගමකට, අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා සලකන

තොරතුරු සැපයීමට සහ අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයකින් හෝ ආකෘතියකින් නියම කරන දිනයකදී, වේලාවකදී, සහ ස්ථානයකදී, මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික් හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපි ගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීමට සහ ඒ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ එම වෙනත් ලේඛනවල සහතික කළ පිටපත් නියම කරන යම් ආකෘතියකින් සැපයීමට නියම කිරීම ;

(ඉ) අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද විගණකරවයකුට, විගණනය කිරීම සඳහා යම් මුදල් සමාගමක ගිණුම් ඉදිරිපත් කරන ලෙස සහ වෙනත් තොරතුරු සහ මුද්‍රිත, ඉලේට්‍රොනික් සහ වෙන් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, රෙජස්ටර සහ වෙනත් ලේඛන සපයන ලෙස, ඒ මුදල් සමාගමට හෝ එහි අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, සේවානියුක්තයකුට, අනුයෝජිතයකුට කොන්ත්‍රාත්කරුවකුට හෝ ලේකම්වරයකුට නියම කිරීම ;

(ඊ) යම් මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකුගෙන් කොටස්කරුවකුගෙන් ලේකම්වරයකුගෙන්, කළමනාකරුවකුගෙන්, සේවා නියුක්තිකයකුගෙන්, අනුයෝජිතයකුගෙන්, විගණකවරයකුගෙන් හෝ කොන්ත්‍රාත්කරුවකුගෙන් ඒ මුදල් සමාගමේ ආයතනික කටයුතු පිළිබඳව පළපුරුද්දෙන් දන්නා හෝ ඒ පිළිබඳ දැනුමක් ඇති හෝ ඒ සම්බන්ධව තොරතුරු සන්තකයේ පවතින වෙනත් යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න ඇසීම සහ ප්‍රකාශ වාර්තා කිරීම හෝ අවශ්‍ය වේ නම් අසන ලද ප්‍රශ්නවලට දිවුරුම් පෙත්සමක් මගින් පිළිතුරු සපයන ලෙස හෝ අවශ්‍ය වේ නම් (17 වන අධිකාරිය වූ) දිවුරුම් හෝ ප්‍රතිඥා ආඥා පනත අනුකූලව දිවුරුම් හෝ ප්‍රතිඥා දෙන ලෙස හෝ විධාන කිරීම සහ ප්‍රශ්න ඇසීමට සැලැස්වීම මෙන්ම ප්‍රකාශ වාර්තා කිරීම හෝ වාර්තා කිරීම සැලැස්වීම ;

(උ) යම් මුදල් සමාගමක ව්‍යාපාර හෝ ආයතනික කටයුතු පිළිබඳව පළපුරුද්දෙන් දැනීමක් ඇති හෝ ඒ පිළිබඳ දැනුමක් ඇති හෝ ඒ තොරතුරු සන්තකයේ පවතින

හෝ ඒ කටයුතු පිළිබඳ තොරතුරු දන්නා බවට පෙනෙන්නට තිබෙන යම් තැනැත්තකුගෙන් ලිඛිත දැන්වීමක් මගින් තොරතුරු කැඳවීම සහ අවශ්‍ය නම් ඒ තැනැත්තා සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීම.

(2) ඒ පරීක්ෂණය සම්පූර්ණ කිරීමෙන් පසු, ඒ පරීක්ෂණය පිළිබඳ වාර්තාව අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් ඒ පරීක්ෂණයේ පිරිවැය අදාළ මුදල් සමාගමෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ තමාට පනවන ලද යම් නියම අනුව කටයුතු කිරීම සෑම තැනැත්තකුගේම කාර්ය වන අතර, යම් තැනැත්තකු

(අ) මේ වගන්තිය යටතේ ඉල්ලා සිටි යම් තොරතුරක් සැපයීමට හෝ පොතක්, වාර්තාවක්, ලිපි ගොනුවක්, රෙජිස්ටරයක් හෝ වෙනත් ලේඛනයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් සැපයීමට පැහැර හැරියහොත් ;

(ආ) සම්මුඛ සාකච්ඡාවක් සඳහා කැඳ වූ විට ඒ සඳහා තමාම යෑම පැහැර හැරියහොත් ;

(ඇ) ව්‍යාජ හෝ අසම්පූර්ණ හෝ සාවද්‍ය හෝ නොමග යවන සුළු තොරතුරු, පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර් හෝ වෙනත් ලේඛන, ද්‍රව්‍ය හා දේ සැපයුව හොත් ; හෝ

(ඈ) අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරයා විසින් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලය දෙන ලද යම් තැනැත්තකුට, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් කාර්යක් කිරීමේ දී අවහිර කළහොත්,

ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(5) මේ වගන්තියෙහි "පරීක්ෂණ කාලසීමාව" යන්නෙන්, මණ්ඩලය විසින් ඒ කාර්ය සඳහා තීරණය කරනු ලැබිය හැකි යම් කාලපරිච්ඡේදයක් අදහස් වේ.

**25.** (1) යම් මුදල් සමාගමක්

මුදල් සමාගමක් අයහපත් පරිච අනුගමනය කරන බවට අධ්‍යක්ෂවරයාගේ මතය වනවට පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය.

(i) එහි තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ සම්බන්ධතාවලට හානි වන අයහපත් හෝ අයෝග්‍ය මූල්‍ය පරිචයන් අනුගමනය කරමින් සිය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම හෝ පවත්වාගෙන යාමට ඉඩ ඇති බව හෝ

(ii) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද හෝ පනවන ලද යම් විධානයක්, රීතියක්, නියෝගයක් හෝ නියමයක් උල්ලංඝනය කර ඇති බව හෝ ඒ අනුව කටයුතු කිරීමට අසමත්ව ඇති බව,

24 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් සාදන ලද වාර්තාවක් අනුව, මණ්ඩලයේ මතය වන්නේ නම්, මණ්ඩලය විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ගවලින් එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය.

(අ) මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලයක් තුළ ගෙවිය යුතු වන රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයක් පැනවීම ;

(ආ) ඒ මුදල් සමාගමට එවැනි යම් පරිචයක් අනුගමනය කිරීම නවත්වන ලෙස විධාන කිරීම ;

(ඇ) පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන ලද විධානයක්, රීතියක්, නියෝගයක් හෝ නියමයක් පිළිපැදීමට මුදල් සමාගමක් අසමත් වී ඇති විට, නොපමාව හෝ මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් තුළ ඒවා පිළිපදින ලෙස ඒ මුදල් සමාගමට විධාන කිරීම ;

(ඈ) ඒ පරිචයෙන් හෝ උල්ලංඝනයෙන් ඇති වූ තත්ත්ව නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඒ මුදල් සමාගමට විධාන කිරීම ;

(ඉ) මණ්ඩලයට බරපතල අධීක්ෂණ ගැටළු පවතින මුදල් සමාගමක් ලෙස මුදල් සමාගමේ නම ප්‍රසිද්ධ කිරීම ;

(ඊ) ඒ මුදල් සමාගමේ ව්‍යාපර කටයුතු නිසි අයුරු පවත්වා ගැනීම සම්බන්ධයෙන් ඒ සමාගමේ කටයුතු කළමනාකරණයට තැනැත්තකු පත් කිරීම ;

(උ) ඒ මුදල් සමාගමේ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යොමු කිරීමේ අනුදේශ මත වෙනත් යම් කර්තව්‍ය ඉටු කිරීම සඳහා මහ බැංකුවේ නිලධරයකු මණ්ඩලයේ නියෝජිතයා වශයෙන් පත් කිරීම ;

(ඌ) මුදල් සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු කළමනාකරුවකු හෝ පාලකයකු මුදල් සමාගමේ හෝ මුදල් සමාගමට සම්බන්ධ යම් කාර්යක් කිරීමෙන් වළක්වාලීම ;

(එ) මුදල් සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ සේවානියුක්තයකු ඉවත් කිරීම ;

(ඒ) මුදල් සමාගමේ ප්‍රාග්ධනය වැඩි කිරීමට කටයුතු සැලසීමෙන් හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංයුක්ත කිරීමෙන් හෝ ඒ ක්‍රියාමාර්ග දෙකම ගැනීමෙන් මුදල් සමාගම ප්‍රතිසංවිධානය කිරීම ;

(ඔ) යම් තැනැත්තකු විසින් මුදල් සමාගමේ දරන කොටස් ගණන අඩුකිරීමට නියම කිරීම ;

(ඕ) මුදල් සමාගම වෙනත් මුදල් සමාගමක් සමග හෝ වෙනත් යම් ආයතනයක් සමග ඒ වෙනත් මුදල් සමාගමේ හෝ ආයතනයේ කැමැත් ඇතිව ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලැස්වීම ;

(ක) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, තැන්පත්කරුවකු විසින් මුදල් සමාගම සමග එළඹ ඇති යම් ගිවිසුමක් සමාලෝචනය කිරීම සහ මුදල් සමාගමේ තැන්පතුකරුවන්ගේ හෝ අනෙකුත් ණයහිමියන්ගේ යහපත ගැන හෝ විචක්ෂණ වාණිජ පරිචය පිළිබඳ නිසි සැලකිල්ලකින් තොරව ඒ ගිවිසුමට එළඹ ඇතැයි මණ්ඩලය විසින් සලකනු ලබන අවස්ථාවක, ආපසු ගෙවීම, පොලී අනුපාතික සහ අයකිරීම්වලට සම්බන්ධ නියම ඇතුළුව, ඒ ගිවිසුමේ නියම වෙනස් කිරීම ;

(ග) වෙනත් යම් ලිඛිත නීතියක් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මුදල් සමාගම විසින් යම් තැනැත්තකු සමග ඇති යම් ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් සමාලෝචනය කිරීම සහ එවැනි සමාලෝචනයකින් පසු, මුදල් සමාගමේ තැනැපත්කරුවන්ගේ හෝ අනෙකුත් ණයහිමියන්ගේ යහපත ගැන හෝ විචක්ෂණ වාණිජ පරිචය පිළිබඳ නිසි සැලකිල්ල නොදක්වා ඒ ගිවිසුමට හෝ කොන්ත්‍රත්තුවට ඇතුළත්ව ඇති බව මණ්ඩලයට පෙනී යන්නේ නම්, ඒ ගිවිසුමේ හෝ කොන්ත්‍රාත්තුවේ නියම වෙනස් කිරීම.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේද යටතේ දෙන ලද විධානයකින් අතෘප්තියට පත් යම් මුදල් සමාගමක් විසින් ඒ විධානය නිකුත් කිරීමේ දින සිට දින තිහක් ඉකුත් වීමට පෙර, මණ්ඩලය වෙත ලිඛිත අභියාචනයක් කරනු ලැබිය හැකි අතර, ඒ අභියාචනය ලැබී දින තිහක් ඇතුළත මණ්ඩලය විසින් එහි තීරණය දෙනු ලැබිය යුතු ය.

(3) යම් මුදල් සමාගමක් විසින් මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කර ඇති අවස්ථාවක සහ ඒ මුදල් සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයකු එකී උල්ලංඝනය කිරීමට වගකිව යුතු බවට විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට හේතු ඇති විට, ඒ අධ්‍යක්ෂවරයාගේ හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයාගේ විදේශ ගමන් බලපත්‍රය අත්හිටුවන ලෙස අධ්‍යක්ෂවරයා විසින් මහෙස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලීමක් කළ හැකි ය.

## IV වන කොටස

### මුදල් සමාගම්වල මූල්‍ය ප්‍රකාශ සහ විගණනය

**26.** සෑම මුදල් සමාගමක් විසින් ම එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු පහත ප්‍රකාශ ඇතුළත් මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් පිළියෙල කරනු ලැබිය යුතු ය — මුදල් සමාගමේ ගිණුම්.

(අ) ඒ මුදල් වර්ෂයේ අවසානයට ශේෂ පත්‍රයක් ; සහ

(ආ) ඒ මුදල් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයක්

**27.** (1) මුදල් සමාගමක ශේෂ පත්‍රයෙහි ඒ ශේෂ පත්‍රය අදාළ වන මුදල් වර්ෂය අවසානයට ඒ සමාගමේ කටයුතු පිළිබඳ තත්ත්වය දැක්විය යුතු ය. — මුදල් සමාගමේ ශේෂ පත්‍රය.

(2) මණ්ඩලය විසින් අන්‍යාකාරයකින් නියම කරන්නේ නම් මිස ශේෂ පත්‍රයේ හෝ ඊට අමුණන ලද යම් ප්‍රකාශයක-

(අ) ස්පෘශ්‍ය වත්කම්වලින් නියෝජනය නොවන ප්‍රාග්ධන වියදම් කපා නොහරින ලද්දේ නම්, වෙන වෙනම වූ ශීර්ෂ යටතේ ඒ වියදම් ;

(ආ) ආයෝජනවල වෙළඳ අගය ;

(ඇ) මුදල් වර්ෂය තුළ ස්ථාවර වත්කම් තක්සේරු කරන්නට යෙදුනේ නම්, ඒ ස්ථාවර වත්කම් තක්සේරු කිරීමට යොදාගත් ක්‍රමය ;

(ඈ) බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන කිරීමෙන් පසු අත්තිකාරම්වල මුළු මුදල ;

(ඉ) ස්ථාවර වත්කම්වල අගය ක්ෂය වීම, අලුත් කිරීම හෝ අඩුවීම සඳහා වූ ප්‍රතිපාදනයෙහි යම් වැඩිවීමක් හෝ අඩුවීමක් ;

(ඊ) අරමුදල් ප්‍රභව සහ යෙදවීම ;

(උ) සංචිත, ප්‍රතිපාදන සහ එකිනෙකින් වෙනස් වූ බැරකම් ;

(ඌ) හිමිකරු ප්‍රාග්ධනයේ වෙනස් වීම ;

(එ) මුදල් සමාගමේ පළමුවන ශේෂ පත්‍රය සම්බන්ධයෙන් හැර ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති සියලු ශීර්ෂ සඳහා ඊට ආසන්නම පෙර මුදල් වර්ෂය අවසානයේ තිබූ අනුරූපී මුදල් ප්‍රමාණයන්

දැක්විය යුතු ය.

**28.** මණ්ඩලය විසින් අන්‍යාකාරයකින් නියම කරන්නේ නම් මිස මුදල් සමාගමක ආදායම් ප්‍රකාශයේ හෝ ඊට අමුණන ලද යම් ප්‍රකාශයක- (මුදල් සමාගමේ ආදායම් ප්‍රකාශය)

(අ) ස්ථාවර වත්කම්වල අගය ක්ෂයවීම, අලුත් කිරීම හෝ අඩුවීම සඳහා වූ ප්‍රතිපාදනය මගින් ආදායමෙන් ගෙවනු ලැබූ මුදල් ;

(ආ) ලාභ මත ශ්‍රී ලංකා ආදායම් බද්ද සහ වෙනත් ශ්‍රී ලංකා බදු සඳහා ආදායමින් ගෙවූ මුදල සහ ඒ ගිණුම්වලින් පැහැදිලිවම වෙනස්ව, පවත්නා බදු වර්ෂය හෝ පසුව එළඹෙන වර්ෂයක් වෙනුවෙන් අයවිය යුතු බදු සම්බන්ධයෙන් වූ බැරකම් සඳහා වෙන් කළ හෝ වෙන් කිරීමට යෝජිත මුදල් ;

(ඇ) ගෙවන ලද හෝ ගෙවීමට යෝජිත ලාභංශවල මුළු එකතු මුදල ;

(ඈ) විගණකවරුන්ගේ පාරිශ්‍රමික ප්‍රමාණය ;

(ඉ) අධ්‍යක්ෂවරුන්ගේ සංවේචනවල මුළු එකතුව ලෙස ආදායමින් ගෙවූ මුදල ;

(ඊ) සංචිතවලට වෙන් කළ හෝ වෙන් කිරීමට යෝජිත හෝ ඉන් ආපසු ගන්නා ලද මුදල ;

(උ) මුදල් සමාගම විසින් සාමාන්‍යයෙන් නොයෙදෙන සහ සුවිශේෂ හෝ පුනරාවර්තන නොවන ස්වභාවයේ කරුණු හේතු කොට ගෙන යෙදෙන ගනුදෙනුවලින් පැන නගින හෝ ගිණුම් තැබීමේ පදනමෙහි වෙනස් කිරීමක් නිසා ඇති වන ලාභයක් හෝ පාඩුවක් හෝ ආදායම් සහ වියදම් වෙනම ශීර්ෂ යටතේ ;

(ඌ) මුදල් සමාගමේ ප්‍රථම ආදායම් ප්‍රකාශය සම්බන්ධයෙන් හැර, ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති සියලු ශීර්ෂ සඳහා ඊට ආසන්නතම පෙර මුදල් වර්ෂයෙන් තිබූ අනුරූපී මුදල් ප්‍රමාණයන්,

දැක්විය යුතු ය.

මුදල් සමාගමේ ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම පළ කිරීම.

**29.** (1) සෑම මුදල් සමාගමක් විසින් ම, එක් එක් මුදල් වර්ෂය අවසාන වී මාස තුනක් ඇතුළත—

(අ) ඒ මුදල් වර්ෂය සඳහා වූ සමාගමේ විගණනය කළ ආදායම් ප්‍රකාශය ;

(ආ) ඒ මුදල් වර්ෂය අවසානයට සමාගමේ විගණනය කළ ශේෂ පත්‍රය ;

(ඇ) ඒ ඉහත (අ) සහ (ආ) හි සඳහන් කළ ලේඛන සම්බන්ධව විගණකවරයාගේ වාර්තාව ; සහ

(ඈ) සමාගමේ කටයුතුවල තත්ත්වය පිළිබඳව ඒ ශේෂ පත්‍රයට අමුනන ලද අධ්‍යක්ෂවරයන්ගේ වාර්තාව,

අධ්‍යක්ෂවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(2) සෑම මුදල් සමාගමක්ම, එක් එක් මුදල් වර්ෂය අවසාන වී මාස තුනක් ඇතුළත, ශ්‍රී ලංකාවේ සංසරණය වන එක් දෛනික සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පතක, යටත් පිරිසෙයින් එක් වරක්වත්, (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) උපවගන්තිවල සඳහන් වූ ලේඛන පළ කරනු ලැබිය යුතුය.

(3) සෑම මුදල් සමාගමක් විසින් ම, (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) උපවගන්තිවල සඳහන් වූ ලේඛන, ඒ මුදල් සමාගම එහි ව්‍යාපාර කටයුතු කරන එක් එක් ස්ථානයෙහි ප්‍රකට ස්ථානයක, පසුව එළඹෙන මුදල් වර්ෂය සඳහා ඒ ලේඛන පිළියෙල කොට ප්‍රදර්ශනය කරන තෙක්, ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලය විසින්, මේ වගන්තියෙහි සඳහන් ශේෂ පත්‍රයේ සහ ආදායම් ප්‍රකාශයේ ආකෘතිය නිශ්චය කරනු ලැබිය හැකි අතර, එසේ ආකෘතිය නිශ්චය කළ විට, සෑම මුදල් සමාගමකම ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකකාශය ඒ ආකෘතියට අනුව පිළියෙල කරනු ලැබිය යුතු ය.

(5) සෑම මුදල් සමාගමක්ම, එහි එක් එක් මුදල් වර්ෂයක් අවසානයට පසු එළඹෙන ආසන්නම මාස හයක කාලපරිච්ඡේදය සඳහා, සමාගමේ ප්‍රධාන මූල්‍ය දත්ත සහ ප්‍රධාන ක්‍රියාකාරිත්ව දර්ශක අධ්‍යක්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයකින් සහ කාලසීමාවක් තුළ පළ කරනු ලැබිය යුතු ය.

**30.** (1) මුදල් සමාගමක විගණකවරයා විසින් සමාගමක ගිණුම්, මුදල්, මුදල් කළමනාකරණය සහ දේපළ පිළිබඳව පරීක්ෂා කරනු ලැබිය යුතු ය. විගණකවරයා විසින් හැකිතාක් දුරට සහ අවශ්‍ය වන තාක් දුරට- ගිණුම් විගණනය කිරීම.

(අ) මුදල් සමාගම විසින්, මුදල් සමාගම් විසින් මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තත් කාලයෙහි බල පැවැත්වෙන නීති සහ මණ්ඩලය විසින් නිකුත් කරන ලද රීති සහ විධානවලට අනුකූලව එහි කටයුතු පවත්වාගෙන යාම කර ඇත්තේ ද ;

(ආ) තැන්පතු භාර ගැනීම සහ ගිණුම් පවත්වාගෙන යාමට අදාළ වාර්තා සතුටුදායක ලෙස කර ඇත්තේ ද ;

(ඇ) මුල්‍ය පාලන කාර්ය පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ දෘෂ්ටි කොණයෙන් බලන කල සමාගමේ ගිණුම් ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛන, මුදල් සමාගමේ කටයුතු පිළිබඳ අඛණ්ඩ ඇගයීමක් කළ හැකි වන පරිදි නිසි අයුරින් හා ප්‍රමාණවත් අයුරින් සැලසුම් කර ඇත්තේ ද යන බව සහ ඒ ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛන ඵලදායී ලෙස ක්‍රියාත්මක වන්නේ ද ;

(ඈ) ගණකාධිකරණය, මුල්‍යකරණය සහ තක්සේරු කිරීම පිළිබඳ මූලධර්ම කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින්, සැලකිල්ලට භාජනව ඇති කාලසීමාව සම්බන්ධයෙන් මුදල් සමාගමේ කටයුතු පිළිබඳව සත්‍ය සහ සාධාරණ අදහසක් ගෙන හැර දක්වන පරිදි විගණනය කරන ද ගිණුම් සැලසුම් කර ඇත්තේ ද ;

යන බව පරීක්ෂා කර බැලිය යුතු ය.

(2) දක්ෂ සහ සුදුසුකම් ලබා ඇති විගණකවරුන් මුදල් සමාගම්වල ගිණුම් විගණනය කිරීම සඳහා යොදවා ගන්නා බව සහතික කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, මණ්ඩලය විසින් ඒ පිළිබඳ මාර්ගෝපදේශ අධ්‍යක්ෂවරයාට නිකුත් කරනු ලැබිය හැකි අතර, අධ්‍යක්ෂවරයා විසින්, ඒ මාර්ගෝපදේශ අනුව, මුදල් සමාගම්වල ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකවරුන් සංඛ්‍යාවක් කලින් කලට තෝරා එසේ තෝරාගත් විගණකවරුන්ගේ ලැයිස්තුවක් සියලු මුදල් සමාගම්වලට යවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් මුදල් සමාගම්වල විගණකවරුන් වාරිකව මාරු කිරීම පිළිබඳව විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) මුදල් සමාගමේ ගිණුම් විගණනය කිරීමේ කාර්ය සඳහා (2) වන උපවගන්තිය යටතේ යවන ද ලැයිස්තුවෙන් විගණකවරුන් තෝරා ගැනීම සහ (3) වන උපවගන්තිය ප්‍රකාර නිකුත් කරන විධාන අනුව කටයුතු කිරීම එක් එක් මුදල් සමාගමේ කාර්ය විය යුතු ය.

## V වන කොටස

## මුදල් සමාගම් විධිමත් කිරීමේ සහ නිරාකරණයට පත් කිරීමේ ක්‍රියාමාර්ග

අත්හිටුවීම.

**31.** (1) අධ්‍යක්ෂවරයා විසින් ම හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ මහ බැංකුවේ යම් නිලධරයකු හෝ වෙනත් තැනැත්තකු විසින් යම් මුදල් සමාගමක කටයුතු පරීක්ෂා කරනු ලැබීමෙන් පසුව හෝ මුදල් සමාගමෙන් ලැබුණු තොරතුරු අනුව හෝ ඒ සමාගම බුන්වත් යයි හෝ එහි තැන්පත්කරුවන්ගේ ඉල්ලීම් ඉටු කිරීමට නොහැකි තත්ත්වයකට එය පත්වීමට ඉඩ තිබේ යයි හෝ ඒ සමාගම ව්‍යාපර කටයුතුවල දිගටම යෙදී සිටීම නිසා එහි තැන්පත්කරුවන්ට හෝ අනෙකුත් ණය හිමියන්ට පාඩු සිදුවීමට ඉඩ තිබේ යයි හෝ අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන විටක, ඒ අනුව වාර්තාවක්, මණ්ඩලයට ඉදිරිපත් කිරීම පිණිස, අධ්‍යක්ෂවරයා විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත යැවිය යුතු ය. සිද්ධි සහ අවස්ථානුගත කරුණු සමාලෝචනයට භාජනය කිරීමෙන් පසුව, මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි ක්‍රියා කළ යුතු යයි මණ්ඩලය අදහස් කරන්නේ නම්, ව්‍යාපර කටයුතු වහාම අත්හිටුවන ලෙස සමාගමට විධාන කරමින් සහ සමාගමේ සියලුම පොත්, වාර්තා සහ වත්කම් භාරගන්නා ලෙසත්, සමාගම විසින් ව්‍යාපාර කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙසත් අධ්‍යක්ෂවරයාට විධාන කරමින් මණ්ඩලය විසින් නියෝගයක් කරනු ලැබිය හැකි ය.

(2) සමාගමේ පොත්, වාර්තා හෝ වත්කම් කිසිවක් තම සන්තකයේ හෝ භාරයේ ඇත්තා වූ ද, ඒ පොත්, වාර්තා හෝ වත්කම් අධ්‍යක්වරයා වෙත හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද මහ බැංකුවේ යම් නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු වෙත භාරදී පැහැර හරින්නා වූ ද, මුදල් සමාගමක යම් අධ්‍යක්ෂවරයකු කළමනාකාරවරයකු, ලේකම්වරයකු, සේවානියුක්තයකු හෝ වෙනත් යම් තැනැත්තකු හෝ යම් පොත් වාර්තා හෝ වත්කම් භාර ගැනීමේ

දී හෝ සමාගමේ ව්‍යාපාර කටයුතු දිගටම පවත්වාගෙන යාම වළක්වාලීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා සලකන යම් වෙනත් පියවර ගැනීමේ දී අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද මහ බැංකුවේ යම් නිලධාරියකුට හෝ වෙනත් යම් තැනැත්තකුට අවහිර කරන හෝ විරෝධය පාන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සත්භාවයෙන් කරන ලද නියමයක් නිසා සිදු වූ හෝ සිදු වීමට ඉඩ තිබෙන හෝ සිදු වී යයි කියනු ලබන යම් පාඩුවක් හෝ අලාභයක් අයකර ගැනීම සඳහා හෝ ඒ නියමය සමාලෝචනය කිරීමට හෝ අවලංගු කිරීමට සලස්වා ගැනීම සඳහා හෝ ඒ නියමය කරන ලද්දේ සත්භාවයෙන් නොවේ යැයි ඔප්පු කළ හැකි නම් මිස, කිසිම අධිකරණයක යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය හැකි ය.

(4) මුදල් සමාගම විසින් දී ඇති ණය ආපසු අයකර ගැනීම නොකඩවා සිදු කිරීමට හැකි වීම සඳහා අවශ්‍ය යයි, මණ්ඩලය සලකන පියවර ගැනීමට මණ්ඩලයට හැකි අතර ඒ කාර්ය සඳහා, ණය ගැතියන්ට මුදල් සමාගමට ගෙවීම් කිරීමට හැකි වන සේ, මුදල් සමාගම නමින් බැංකු ගිණුම් විවෘත කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(5) යම් මුදල් සමාගමක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් මේ වගන්තිය යටතේ කරන ලද යම් අත්හිටුවීමේ නියෝගයක බලපෑම, එය කරන ලද දින සිට මාස හයක කාලයක් ඉකුත් වූ විට අවසාන විය යුතු අතර, හැකිතාක් ඉක්මණින් පහත (අ) හා (ආ) හි සඳහන් පරිදි ක්‍රියාකිරීම මණ්ඩලයේ කාර්ය වන්නේ ය.

(අ) කොන්දේසි රහිතව හෝ පොදු යහපත හෝ සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපත සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් කොන්දේසිවලට යටත්ව හෝ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට සමාගමට අවසර දෙමින් නියෝගයක් කිරීම ; හෝ

(ආ) මුදල් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා මෙහි මින් මතු විධාන සලස්වා ඇති පරිදි නිසි බලය ඇති අධිකරණයක් වෙත අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කරනු ලැබීමට සැලැස්වීම සහ ඒ බව මුදල් සමාගමට දැනුම් දීම. මුදල් සමාගමකට එසේ දැනුම් දී ඇති විට, ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට අධිකරණයක් විසින් නියෝගයක් කර ඇත්නම් මිස, සමාගම ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ නොකළ යුතු ය.

(අ) ඡේදය මගින් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන ලෙස සහ වෙන යම් ලිඛිත නීතියක හෝ සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඒ සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු හෝ සේවානියුක්තයකු දිගමට කටයුතු කරගෙන යාම එහි තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපතට හානි කර යයි මණ්ඩලයේ අදහස වන අවස්ථාවක, ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට අවසර දීම සඳහා වූ කොන්දේසියක් වශයෙන් ඒ අධ්‍යක්ෂවරයා, කළමනාකාරවරයා හෝ සේවානියුක්තයා මණ්ඩලය විසින් ඉවත් කළ හැකි ය. තව ද, ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු, කළමනාකාරවරයකු හෝ සේවානියුක්තයකු වශයෙන් යම් තැනැත්තකු මණ්ඩලය විසින් පත් කළ හැකි ය.

(6) මේ වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡෙදය යටතේ නියෝගයක් නිකුත් කර ඇති විට, වෙනත් යම් ලිඛිත නීතියක හෝ මුදල් සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මණ්ඩලය විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය—

(අ) මුදල් සමාගම, වෙනත් මුදල් සමාගමක් හෝ වෙනත් යම් ආයතනයක් සමග ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන වැඩපිළිවෙළක් ඒ වෙනත් මුදල් සමාගමේ හෝ ආයතනයේ කැමැත්ත ඇතිව යෙදීම;

(ආ) මුදල් සමාගමේ ප්‍රාග්ධන වැඩි කිරීමෙන් සහ නව කොටස් හිමියන් බඳවා ගැනීමට වැඩපිළිවෙල යෙදීමෙන් මුදල් සමාගම ප්‍රතිසංවිධානය කිරීම;

2—PL 005633- 425 (2011/02)

(ඇ) ඒ මුදල් සමාගමේ තැන්පතුකරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපත සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන ඕනෑම ආකාරයකට මුදල් සමාගම ප්‍රතිසංස්කරණය කිරීම;

(ඈ) මුදල් සමාගමේ ව්‍යාපාර කටයුතු නිසි අයුරින් පවත්වාගෙන යෑම සඳහා එහි කටයුතු කළමනාකරණයට යම් තැනැත්තකු පත් කිරීම;

(ඉ) මුදල් සමාගමේ හෝ මුදල් සමාගම සම්බන්ධ යම් කර්තව්‍යයක් කිරීමෙන් මුදල් සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ පාලකවරයකු වැළැක්වීම;

(ඊ) මුදල් සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ සේවානියුක්තයකු ඉවත් කිරීම;

(උ) මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිසංස්ථාපනය කිරීම;

(ඌ) තැන්පතුකරුවකු විසින් මුදල් සමාගම සමඟ එළඹ ඇති යම් ගිවිසුමක් සමාලෝචනය කිරීම සහ ඒ ගිවිසුම මුදල් සමාගමේ තැන්පතුකරුවන්ගේ හෝ අනෙකුත් ණහිමියන්ගේ යහපත ගැන හෝ විචක්ෂණ වාණිජ පරිචය පිළිබඳ නිසි සැලකිල්ලක් නොදක්වා එළඹ ඇති බව මණ්ඩලය සලකනු ලබන අවස්ථාවක, ආපසු ගෙවීම, පොලී අනුපාතික සහ අයකිරීම්වලට සම්බන්ධ නියම ඇතුළුව, ඒ ගිවිසුමේ නියම වෙනස් කිරීම;

(එ) මුදල් සමාගම විසින් යම් තැනැත්තකු සමග ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් සමාලෝචනය කිරීම සහ එවැනි සමාලෝචනයකින් පසු, මුදල් සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපත ගැන නිසි සැලකිල්ලක් නොදක්වා හෝ විචක්ෂණ වාණිජ පරිචය ගැන නිසි සැලකිල්ල නොදක්වා ඒ ගිවිසුමට හෝ කොන්ත්‍රාත්තුවට එළඹ ඇති බව මණ්ඩලයට පෙනී යන්නේ නම් ඒ ගිවිසුමේ හෝ කොන්ත්‍රාත්තුවේ නියම වෙනස් කිරීම;

(ඒ) මණ්ඩලය විසින් නම් කරන ලද තැනැත්තකුට:—

(i) මුදල් සමාගමේ ඒ කොටස් සඳහා කොටස් වෙළඳපොලේ මිල ගණන් ප්‍රකාශ කර ඇති අවස්ථාවක වෙළඳපොළ අගය අනුව; හෝ

(ii) ඒ කොටස් සඳහා කොටස් වෙළඳපොලේ මිළ ගණන් ප්‍රකාශ කර නැති අවස්ථාවක, මණ්ඩලය විසින් නම් කරන ලද තක්සේරුකරුවකු විසින් තීරණය කරනු ලැබූ මිළ අනුව,

වූ වන්දි මුදලක් ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබූ විට මුදල් සමාගමේ තමන්ට අයිති කොටස්වල හිමිකම ඒ තැනැත්තාට අවසතු කරන ලෙස හෝ පවරන ලෙස, මුදල් සමාගමේ යම් කොටස් හිමියකුට විධාන කිරීම.

(7) මේ වගන්තියේ (6) වන උපවගන්තියේ (ඒ) ඡේදය යටතේ ඔහුට දෙන ලද විධානයකට අනුව කටයුතු කිරීමට අපොහොසත් වන කොටස් හිමියකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

ගණන් බේරා වසා දැමීම.

**32.** මේ වගන්තියේ (1) 31 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ මණ්ඩලය විසින් නියෝගයක් කර ඇති අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි, නිසි බලය ඇති අධිකරණයක් වෙත, මුදල් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් කරන ලද ඉල්ලීමක් මත, මුදල් සමාගම ගණන් බේරා වසා දැමිය යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි අතර, ඒ අනුව, 2007 අංක 7 දරන සමාගම් පනතේ අධිකරණයේ අධීක්ෂණයට යටත්ව, සමාගමේ ගණන් බේරා වසා දැමීමට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සමාගම ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) අධිකරණය විසින් අවශ්‍ය යයි සලකන යම් විමසීමකින් පසුව සහ අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරන කරුණු සලකා බැලීමෙන් පසුව, සමාගම බුන්වත් නොවේ යයි අධිකරණයේ මතය වුවහොත්, කොන්දේසි රහිතව හෝ පොදු යහපත හෝ සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපත සඳහා

අවශ්‍ය යයි අධිකරණය සලකන යම් කොන්දේසිවලට යටත්ව හෝ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට මුදල් සමාගමට අවසර දෙමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, මෙම පනතේ 31 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් කරන ලද්දා වූ හෝ කරන ලදැයි අදහස් කරන්නා වූ නියෝගයක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කර ඇති මුදල් සමාගමකට මේ උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා හෝ තත්කාර්ය සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකු, ඒ ගණන් බේරා වසා දැමීමේ කාර්ය සඳහා ඈවරකරු ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(5) යම් මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීම සඳහා දරන ලද යම් පිරිවැය, ගාස්තු සහ වියදම්, ඒ මුදල් සමාගමේ අරමුදල්වලින් ගෙවිය නොහැකි වූ විටක, පොදු යහපත තකා ඒ පිරිවැය, ගාස්තු සහ වියදම් මහ බැංකුවේ අරමුදල්වලින් ගෙවිය යුතු යයි මණ්ඩලය සලකන්නේ නම්, එසේ ගෙවනු ලැබිය හැක.

(6) නිසි බලය ඇති අධිකරණයක් විසින් මේ වගන්තිය යටතේ කරන ලද සෑම ආඥාවක්ම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කළ හැකි අභියාචනයකට යටත් විය යුතු අතර, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ සිවිල් නඩු සම්බන්ධ අභියාචනයන්ට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(7) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක අධිකරණයට ඉල්ලීම ඉදිරිපත් කර ඇති අධ්‍යක්ෂවරයා තවදුරටත් මුදල් සමාගම් විෂය පවරා ඇති මහ බැංකුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා නොවුව ද, නීතියේ කාර්ය සඳහා පැමිණිල්ලේ මුල් ශීර්ෂය වලංගු ලෙස නඩු කටයුතු දිගටම පවත්වාගෙන යාමේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ, යම් මුදල් සමාගමක් සම්බන්ධයෙන් වූ විට "නිසි බලය ඇති අධිකරණයක්" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග වගන්තිය යටතේ පළාතක් සඳහා පිහිටුවනු ලැබුවා වූ ද

1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් එය පිහිටුවනු ලැබූ පළාත ඇතුළත සිවිල් අධිකරණ බලය පැවරුණා වූ ද මහාධිකරණයක් හෝ යම් පළාතක් සඳහා එවැනි සිවිල් අධිකරණ බලයක් පැවරුණු මහාධිකරණයක් පිහිටුවනු නොලැබූ විටක බස්නාහිර පළාත සඳහා පිහිටුවනු ලැබූ මහාධිකරණය හෝ අදහස් වේ.

ගණන් බේරා වසාදැමීමේ දී හිමිකම් පෑම්වල ප්‍රමුඛත්වය.

**35.** මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේ දී කරනු ලබන හිමිකම් පෑම්වල ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

එසේ වුව ද, තවදුරටත් මේ වගන්තිය යටතේ නියෝග සාදන තුරු, 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන හෝ වෙනත් යම් අදාළ නීතියක විධිවිධාන මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේ දී හිමිකම්වල ප්‍රමුඛත්වය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය විසින් භාරගනු ලැබිය හැකි ය.

**34.** (1) 31 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක් ලැබුණු විට සිද්ධීන් සහ අවස්ථාගත කරුණු සමාලෝචනය කිරීමෙන් පසු, 31 වන වගන්තිය යටතේ ක්‍රියාමාර්ගයක් ගැනීමට විකල්පයක් වශයෙන්, මණ්ඩලය තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවකට, මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය විසින්, භාර ගනු ලැබිය හැකි අතර, ඒ භාර ගැනීම පිළිබඳව ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කරනු ලැබිය යුතුය. මණ්ඩලය විසින් භාර ගත් මුල් කාලසීමාව දීර්ග කරනු ලැබිය හැකි අතර, ඒ කාලය දීර්ඝ කිරීම පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. එවැනි සෑම භාර ගැනීමක්ම සහ යම් කාලය දීර්ඝ කිරීමක් පිළිබඳව මණ්ඩලය විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් වරයාට දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඔහු විසින් ඒ බවට සමාගමට අදළ පොත්වල සටහනක් කරණු ලැබිය යුතු ය.

(2) යම් මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය භාර ගන්නා අවස්ථාවක මණ්ඩලය විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය—

(අ) ඒ මුදල් සමාගම සම්බන්ධයෙන්, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් හෝ ඒ යටතේ හෝ ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත

හෝ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් වෙනත් යම් තැනැත්තකු වෙත පවරන ලද හෝ නියම කරන ලද හෝ වෙන් කරන ලද සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම;

(ආ) මුදල් සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණය හිමියන්ගේ යහපත සැලකිල්ලට ගනිමින් සහ පොදු යහපත තකා, මණ්ඩලය සහ යම් තැනැත්තකු අතර එකඟ විය හැකි යම් කොන්දේසිවලට යටත්ව, මුදල් සමාගමේ කළමනාකරණය සඳහා ඒ තැනැත්තා සමඟ යම් ගිවිසුමකට ඇතුළු වීම;

(ඇ) මුදල් සමාගම වෙනත් මුදල් සමාගමක් හෝ වෙනත් යම් ආයතනයක් සමඟ ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් වැඩපිළිවෙලවල් ඒ වෙනත් මුදල් සමාගමේ හෝ ආයතනයේ කැමැත්ත ඇතිව සකස් කිරීම;

(ඈ) ප්‍රාග්ධනය වැඩිකිරීමෙන් සහ අලුත් කොටස්කරුවන් බඳවා ගැනීමේ වැඩපිළිවෙලක් යෙදීමෙන් එය ප්‍රතිසංවිධානය කිරිම;

(ඉ) මුදල් සමාගමේ තැන්පතුකරුවන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ යහපත වේ යැයි මුදල් මණ්ඩලය විසින් අදහස් කරනු ලබන යම් ආකාරයකින් ඒ මුදල් සමාගම ප්‍රතිසංස්කරණය කිරීම;

(ඊ) මුදල් සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ සේවානියුක්තයෙකු ඉවත් කිරීම;

(උ) මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිසංස්ථාපනය කිරීම;

(ඌ) මණ්ඩලය විසින් නම් කළ තැනැත්තකු, විසින්—

(i) මුදල් සමාගමේ කොටස් සඳහා කොටස් වෙළඳපොලේ මිළ ගණන් ප්‍රකාශ කර ඇති අවස්ථාවක වෙළඳපොළ අගය අනුව; හෝ

(ii) ඒ කොටස් සඳහා කොටස් වෙළඳපොලේ මිළ ගණන් ප්‍රකාශ කර නැති අවස්ථාවක මණ්ඩලය විසින් නම් කරන ලද තක්සේරුකරුවකු විසින් තීරණය කරන ලද මිළ අනුව.

තීරණය කරන ලද වන්දි මුදලක් ගෙවනු ලැබූ විට, තමන්ට අයිති කොටස්වල අයිතිය ඒ තැනැත්තාට අවසතු කරන ලෙස හෝ පවරන ලෙස මුදල් සමාගමේ යම් කොටස් හිමියකුට විධාන කිරීම.

(එ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මුදල් සමාගම සමඟ තැන්පත්කරුවකු විසින් ඇතුළු වූ යම් ගිවිසුමක් සමාලෝචනය කිරීම සඳහා සහ මුදල් සමාගමේ තැන්පත්කරුවන්ගේ හෝ අනෙකුත් ණය හිමියන්ගේ යහපත ගැන හෝ විචක්ෂණ වාණිජ පරිචය ගැන නිසි සැලකිල්ලකින් තොරව ඒ ගිවිසුමට එළඹ මණ්ඩලය විසින් සළකනු ලබන අවස්ථාවක, ආපසු ගෙවීම, පොලී අනුපාතික හා අයකිරීම් සම්බන්ධයෙන් වූ නියම ඇතුළුව, ඒ ගිවිසුමේ නියම වෙනස් කිරිම;

(ඒ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මුදල් ගමාගම විසින් යම් තැනැත්තකු සමඟ ඇතුළු වී ඇති යම් ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් සමාලෝචනය කිරීම සහ එවැනි සමාලෝචනයකින් පසු මුදල් සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපත ගැන හෝ විචක්ෂණ වාණිජ පරිචය ගැන නිසි සැලකිල්ල නොදක්වා ඒ ගිවිසුමට හෝ කොන්ත්‍රාත්තුවට එළඹ ඇති බව මණ්ඩලයට පෙනී යන්නේ නම්, ඒ ගිවිසුමේ හෝ කොන්ත්‍රාත්තුවේ නියම වෙනස් කිරීම.

(3) යම් මුදල් සමාගමක පරිපාලනය සහ කළමනාකරණය මණ්ඩලය විසින් පවරා ගන්නා ලද කාලසීමාව තුළ ඒ මුදල් සමාගමේ සෑම අධ්‍යක්ෂවරයෙක්, කළමනාකාරවරයෙක් සහ ලේකම්කරයෙක් විසින් ම, ඒ සමාගම සම්බන්ධයෙන් වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටුකිරීම, මණ්ඩලය විසින් ප්‍රකාශිතව ම බලය දෙනු ලැබ ඇත්නම් මිස, අවසන් කරනු ලැබිය යුතු ය.

(4) මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය මණ්ඩලය විසින් පවරා ගනු ලැබූ අවස්ථාවක, පොදු යහපත සඳහා වේ යයි මණ්ඩලය විසින් සළකනු ලබන විට, මණ්ඩලය විසින්—

(අ) මුදල් සමාගමට අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන්නා වූ මුදල් පහසුකම්, ප්‍රදාන වශයෙන් හැර, ණය මුදල් හෝ වෙනත් පහසුකම් වශයෙන් ඒ මුදල් සමාගමට පිළියෙල කර දීම හෝ දීම කළ හැකිය; තවද

(ආ) සමාගමේ පරිපාලනය හා කළමනාකරණය කරගෙන යාමේ දී දරන්නට සිදු වූ සියලු පිරිවැය ගාස්තු සහ වියදම් දැරිය හැකිය.

(5) එසේ වුව ද, (1) වන උපවගන්තිය යටතේ මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය පවරා ගැනීමෙන් පසු යම් අවස්ථාවක, සමාගමේ ව්‍යාපාරය තාවකාලිකව අත්හිටුවීම, පොදු යහපත හෝ තැන්පත්කරුවන්ගේ යහපත සඳහා හෝ වේ යැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන්නේ නම් මණ්ඩලය විසින් ඒ සමාගමේ ව්‍යාපාර කටයුතු අත්හිටුවිය හැකි ය. එසේ නැතහොත්, සාධාරණ කාලසීමාවක් ඇතුළත සමාගම ශක්තිමත් වන සේ වර්ධනය කිරීමට සහ නුබුන්වත් තත්ත්වයකට පත් කිරීමට නොහැකි බව අධ්‍යක්ෂවරයා විසින් හෝ මණ්ඩලයෙන් බලය ලත් යම් තැනැත්තකු විසින් කරන ලද වාර්තාවක් අනුව මණ්ඩලයට පෙනී යන්නේ නම්, සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලුම් කරන ලෙස මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට විධාන කළ හැකි ය. මුදල් සමාගම ගණන් බේරා වසාදමන ලෙසට මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට විධාන කළ හොත්, ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් 32 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂාව.

**35.** මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය මණ්ඩලය විසින් 34 වන වගන්තිය යටතේ පවරා ගනු ලැබ ඇති අවස්ථාවක, මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් නිසා හෝ 34 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලයට පැවැරුණු, නියම වූ හෝ වෙන්කර දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ යම් තැනැත්තකුට සිදු වූ හෝ විඳින්නට සිදු වූ හෝ සිදු වූයේ යයි හෝ විඳින්නට සිදු වූයේ යයි කියනු ලබන හෝ යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් මණ්ඩලය වගකිව යුතු නොවන අතර, ඒ සම්බන්ධයෙන් යම් අධිකරණයක යම් නඩුවකට හෝ නඩු කටයුත්තකට මණ්ඩලය යටත් නොවිය යුතු ය.

මුදල් සමාගමේ පරිපාලනය සහ කළමනාකරණය යම් තැනැත්තකු සතු කිරීම.

**36.** (1) මණ්ඩලය විසින් මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය 34 වන වගන්තිය යටතේ පවරා ගනු ලැබ ඇති අවස්ථාවක, තැන්පත්කරුවන්ගේ හෝ ණයහිමියන්ගේ සම්බන්ධතා

ආරක්සා කර ගැනීම වෙනුවෙන් පියවර ගැනීම සඳහා, ඒ මුදල් සමාගමේ පරිපාලනය හා කළමනාකරණය යම් තැනැත්තකු වෙත, ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව සතු කළ හැකි අතර, ඒ සම්බන්ධයෙන් දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය හැකි ය. ඒ මුදල් සමාගමේ පරිපාලනය හා කළමනාකරණය සතු කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා විසින්, යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් හෝ ඒ යටතේ ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හෝ ඒ සමාගමේ සංගමික ව්‍යවස්ථාවලිය මගින් වෙනත් යම් තැනැත්තකු වෙත හෝ පැවරී වෙන් කර දී ඇති හෝ නියම වී ඇති හෝ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය, ඒ මුදල් සමාගම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් මුදල් සමාගමක පරිපාලනය හා කළමනාකරණය යම් තැනැත්තකු සතුකර ඇති අවස්ථාවක, මණ්ඩලය විසින් නම් කරන ලද තැනැත්තකුට, ඒ තැනැත්තා විසින් පහත දැක්වෙන පරිදි, එනම්:—

(i) මුදල් සමාගමේ කොටස් සඳහා කොටස් වෙළඳපොලේ මිළ ගණන් ප්‍රකාශ කර ඇති අවස්ථාවක වෙළඳපොල අගය අනුව; හෝ

(ii) ඒ කොටස් සඳහා කොටස් වෙළඳපොලේ මිළ ගණන් ප්‍රකාශ කර නැති අවස්ථාවක, මණ්ඩලය විසින් නම් කරන ලද තක්සේරුකරුවකු විසන් තීරණය කරනු ලැබිය යුතු මිළ අනුව,

වූ වන්දි මුදලක් ගෙවනු ලැබූ විට, මුදල් සමාගමේ තමන්ට අයිති කොටස්වල හිමිකම ඒ තැනැත්තාට අවසතු කරන ලෙස හෝ පවරන ලෙස, මණ්ඩලය විසින් ඒ මුදල් සමාගමේ යම් කොටස් හිමියකුට විධාන කරනු ලැබිය හැක.

(3) මණ්ඩලය විසින්, මුදල් සමාගමේ පරිපාලනය සහ කළමනාකරණය යම් තැනැත්තකු සතු කර ඇති අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයේ පූර්ව ලිඛිත අවසරය ඇතිව, ඒ කාර්යයන් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර, 34 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඒ)

සහ (ඔ) ඡේදවල විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මුදල් සමාගමේ බලපත්‍රය අවලංගු කිරීම.

**37.** (1) යම් මුදල් සමාගමක් —

(අ) බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු මාස නවයක් ඇතුළත ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පැහැර හරින ලද බවට;

(ආ) එය විසින් උපචිත කර ගන්නා ලද යම් ණයක් ඒ ණය ගෙවිය යුතු වූ විට ගෙවීම පැහැර හරින ලද බවට;

(ඇ) ඒ මුදල් සමාගමට විරුද්ධව, සහන සඳහා පෙත්සමක් හෝ නඩුවක් පවරන ලදුව, යම් වස්තු භංගත්ව නීතියක් හෝ ණයකරුවන් සඳහා සහන සඳහා ඉඩ සලස්වා ඇති හෝ ණයකරුවන්ට අදාළ වන්නා වූ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඒ සමාගම වෙනුවෙන් ඇවරකරුවකු, ඊකවරණකරුවකු හෝ දේපළ භාරගන්නකු පත්කරනු ලැබ ඇති වූ බවට;

(ඈ) මුදල් ව්‍යාපාර කරගෙන යාම අවසන් කරනු ලැබූ බවට;

(ඉ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරන ලද යම් විධානයක් හෝ රීතියක් දිගටම උල්ලංඝනය කරන බවට හෝ ඒවාට පටහැනිව කටයුතු කරන බවට;

(ඊ) වාර්ෂික බලපත්‍ර ගාස්තුව ගෙවීම පැහැර හරින ලද බවට; හෝ

(උ) එහි තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපතට හානිකර විය හැකි ආකාරයකින් එහි ව්‍යාපාර කටයුතු කරන ලද හෝ කරගෙන යන බවට,

මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම් ඒ මුදල් සමාගමට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කරනු ලබන මණ්ඩලය විසින් ඒ මුදල් සමාගමට දැන්වීමක් කරනු ලැබිය හැකි ය.

(2) 5 වන වගන්තිය යටතේ මුදල් සමාගමක් වෙත නිකුත් කරන ලද බලපත්‍රය එලෙස අවලංගු කරනු නොලැබිය යුත්තේ කුමක්

නිසාද යන බවට හේතු සඳහන් කරමින්, (1) වන උපවගන්තිය යටතේ වූ අවලංගුකිරීම පිළිබඳව දැන්වීමකට විරුද්ධව, ඒ දැන්වීමේ දිනයේ සිට දින තිහක් ඇතුළත, යම් මුදල් සමාගමක් විසින් මණ්ඩලය වෙත ලිඛිතව විරෝධතා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) අවලංගු කිරීම පිළිබඳ දැන්වීමේ දින සිට දින හැටක් ඉකුත් වීමෙන් පසු සහ (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද විරෝධතා සලකා බැලීමෙන් පසු මණ්ඩලයට ඒ දැන්වීම ඉල්ලා අස්කර ගැනීමට හෝ මුදල් සමාගමට නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට හෝ හැකි අතර, බලපත්‍රය අවලංගු කිරීම සඳහා මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයේ දිනයේ දී හෝ මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් පසු දිනයක දී හෝ ඒ අවලංගු කිරීම බලාත්මක විය යුතු ය.

(4) මුදල් සමාගමක බලපත්‍රය අවලංගු කිරීම සඳහා මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය මුදල් සමාගම වෙත දැනුම් දිය යුතු අතර එකී සමාගමට තවදුරටත් මුදල් ව්‍යාපාර කටයුතු කිරීමට බලය නොමැති බව මහජනතාව වෙත දැනුම් දෙමින් එකී අවලංගු කිරීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ සහ අවම වශයෙන් ශ්‍රී ලංකාවේ සංසරණය වන එක් දෛනික සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත් පතක පළ කරනු ලැබිය යුතු ය.

(5) මුදල් සමාගමක බලපත්‍රය අවලංගු කරන ලද අවස්ථාවක, මණ්ඩලය විසින් 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යන නාමලේඛනයෙන් මුදල් සමාගමේ නම ඉවත් කළ යුතු අතර, ගණන් බේරා වසා දැමීම සඳහා වූ විධාන ද ඇතුළුව, මණ්ඩලය අවශ්‍ය යයි සලකන විධාන මණ්ඩලය විසින් නිකුත් කිරීම හෝ ඒ සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා ඉල්ලුම් කරන ලෙස මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට නියම කරනු ලැබිය හැකි ය. එවැනි විටක දී 32 වන වගන්තියේ (3) උපවගන්තිය හැර එහි අනෙකුත් විධිවිධාන අදාළ විය යුතු ය.

(6) මේ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ නිකුත් කළ යම් විධානයක්, මුදල් මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කළ කාලසීමා තුළ ඉටු කිරීමට මුදල් සමාගමට නොහැකි වන අවස්ථාවක, මුදල් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නඩු පවරන ලෙස මුදල් මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට නියම කරනු ලැබිය හැකි අතර, එසේ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් 32 වන වගන්තියේ (3) වන උපවගන්තිය හැර එහි අනෙකුත් විධිවිධාන අදාළ විය යුතු ය.

VI වන කොටස

**තැන්පතු රක්ෂණය කිරීම**

**38.** (1) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, මණ්ඩලය විසින්, මුදල් සමාගම් විසින් දරනු ලබන තැන්පතු රක්ෂණය කිරීම සඳහා වූ ක්‍රමයක් පිහිටුවීම, පවත්වාගෙන යාම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම කරනු ලැබිය හැකි අතර, මුදල් සමාගම්වලට ඒ සමාගම් විසින් දරන තැන්පතු ඒ යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

තැන්පතු රක්ෂණය සඳහා යෝජනා ක්‍රමය.

(2) (අ) (1) වන උපවගන්තියේ සඳහන් වී ඇති කර්තව්‍ය සියල්ලම හෝ ඉන් යම් කර්තව්‍යයක් හෝ කිරීම සඳහා, මණ්ඩලය විසින් යම් නියම හා කොන්දේසි යටතේ සංස්ථාගත මණ්ඩලයකට (මෙහි මින්මතු "බලයලත් සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) බලය දෙනු ලැබිය හැකි අතර, එවිට, ඒ කාර්ය සඳහා ඒ සංස්ථාගත මණ්ඩලයට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(ආ) මණ්ඩලයට බලයලත් සංස්ථාගත මණ්ඩලයේ කොටස් අත්කර ගැනීමට සහ දැරීමට හැකි ය.

**39.** (1) තැන්පතු රක්ෂණය සඳහා යෝජනා ක්‍රමයක් පිහිටුවා ඇති විට, සෑම මුදල් සමාගමක්ම ඒ මුදල් සාමගම දරන තැන්පතු රක්ෂණය කිරීම සඳහා, මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ආකෘතියකින් මණ්ඩලයට හෝ බලයලත් සංස්ථාපිත මණ්ඩලයට ඉල්ලුම් කළ යුතු ය.

තැන්පතු රක්ෂණය සඳහා ඉල්ලුම් කිරීම.

ඒ යෝජනා ක්‍රමය යටතේ තැන්පතු රක්ෂණය කරන යම් මුදල් සමාගමක් මේ පනතේ මේ කොටසේ “රක්ෂිත මුදල් සමාගම” යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) මණ්ඩලය විසින් හෝ බලයලත් සංස්ථාපිත මණ්ඩලය විසින් එහි අභිමතය පරිදි, (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකි ය.

(3) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයේ එකඟත්වය ඇතිව බලයලත් සංස්ථාපිත මණ්ඩලය විසින් හෝ කලින් කලට තීරණය කරනු ලැබිය යුතු ආරම්භක ගාස්තුවක්, සෑම ඉල්ලුම්කාර මුදල් සමාගමක් විසින් ම, අවස්ථාවෝචිත පරිදි මණ්ඩලයට හෝ බලයලත් සංස්ථාපිත මණ්ඩලට ගෙවනු ලැබිය යුතු ය.

(4) රක්ෂිත මුදල් සමාගමක් විසින් ස්වකීය තැන්පතු මත මණ්ඩලය වෙත හෝ බලයලත් සංස්ථාපිත මණ්ඩලය වෙත රක්ෂණ වාරිකයක් ගෙවනු ලැබි යුතු ය.

(5) යම් රක්ෂිත මුදල් සමාගමක්, යම් රක්ෂණ වාරිකයක් ගෙවීමේ දී යම් පැහැර හැරීමක් කළහොත්, ඒ පැහැර හැරීමේ කාලය සඳහා, ඒ වාරිකය මත, ඒ පැහැර හැරීම නිසා මණ්ඩලයට හෝ බලයලත් සංස්ථාගත මණ්ඩලයට ඇති විය හැකි පාඩු සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් හෝ මණ්ඩලයේ එකඟත්වය ඇතිව බලයලත් සංස්ථාපිත මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අනුපාතිකයක් අනුව මණ්ඩලයට හෝ බලයලත් සංස්ථාගත මණ්ඩලයට පොලී ගෙවීමට, ඒ රක්ෂිත මුදල් සමාගම යටත් විය යුතු ය.

**බලයලත් සංස්ථාපිත මණ්ඩලය විසින් පරීක්ෂණය කිරීම.**

**40.** (1) බලයලත් සංස්ථාපිත මණ්ඩලය එහි අභිමතය පරිදි, යම් රක්ෂිත මුදල් සමාගමක පොත් සහ ගිණුම් පරීක්ෂා කිරීමට සැලැස්විය යුතු අතර, මේ පනතේ 24 වන වගන්තියේ (1) සහ (4) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, ඒ පරීක්ෂණයට අදාළ විය යුතු ය.

(2) පරීක්ෂණයකින් පසු, බලයලත් සංස්ථාපිත මණ්ඩලය විසින් නොපමාව, පරීක්ෂණ වාර්තාවක් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**තැන්පතු රක්ෂණය සම්බන්ධ රීති.**

**41.** (1) මණ්ඩලය හෝ මණ්ඩලයේ එකඟත්වය ඇති ව බලයලත් සංස්ථාපිත මණ්ඩලය විසින් තැන්පතු රක්ෂණ ක්‍රමයක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ විශේෂයෙන්, පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(අ) රක්ෂිත මුදල් සමාගමක් විසින් රක්ෂණ වාරික ගෙවිය යුතු ප්‍රමාණය, කාලය සහ ආකාරය ;

(ආ) වාරික ගෙවීම පැහැර හරින මුදල් සමාගකින් අය කර ගත හැකි පොලිය ;

(ඇ) මුදල් සමාගම්වල තැන්පතුකරුවන් රක්ෂණය කිරීමේ කාර්ය සඳහා මේ පනතේ මේ කොටස යටතේ නියම කළ යුතු බවට හෝ තීරණය කළ යුතු බවට ප්‍රකාශිත හෝ නියමිත යම් කරුණක් ;

(ඈ) රක්ෂිත මුදල් සමාගමක් සඳහා වාර්තා තබාගැනීම සම්බන්ධ අවශ්‍යතා ;

(ඉ) රක්ෂිත මුදල් සමාගමක් සඳහා වාර්තා කිරීම් සම්බන්ධ අවශ්‍යතා ;

(ඊ) මේ පනතේ මේ කොටස යටතේ, මණ්ඩලය හෝ බලයලත් සංස්ථාපිත මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ කිරීම කෙරෙහි බලපාන, ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වෙනත් යම් කාරණයක්.

## VII වන කොටස

### අධිකාරි බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යන හෝ තැනපතු භාර ගන්නා තැනැත්තන්ට එරෙහි ක්‍රියාමාර්ග

**42.** (1) 2 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබුවේ ද හෝ කරගෙන යන්නේ ද හෝ තැන්පතු භාරගනු ලැබ තිබේද හෝ භාර ගන්නේ ද යනු නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයා විසින් ඒ සඳහා බලය දෙන ලද මහ බැංකුවේ යම් නිලධාරියකු විසින් හෝ විමර්ෂණයක් පවත්වනු ලැබිය හැකි අතර, ඒ කාර්ය සඳහා පහත දැක්වෙන දේ වලින් එකක් හෝ වැඩි ගණනක් කරනු ලැබිය හැකිය. විමර්ශන.

(අ) ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තාගේ අධ්‍යක්ෂවරයකුට, හවුල්කරුවකුට, සාමාජිකයකුට, ලේකම්වරයකුට, කළමනාකාරවරයකුට, සේවානියුක්තයකුට, අනුයෝජිතයකුට, කොන්ත්‍රාත්කරුවකුට හෝ විගණකවරයකුට, අවශ්‍ය යයි ඔහු විසින් සළකනු ලබන තොරතුරු, ඔහු විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලසීමාවක් තුළ දී සහ අකාරයකින් හෝ ආකෘතියකින් සපයන ලෙස නියම කිරීම ;

(ආ) ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තාගේ අධ්‍යක්ෂවරයකුට. හවුල්කරුවකුට, සමාජිකයකුට, කළමනාකාරවරයකුට, ලේකම්වරයකුට, සේවානියුක්තිකයකුට, අනුයෝජිතයකුට කොන්ත්‍රාත්කරුවකුට හෝ විගණකවරයකුට, ඒ තැනැත්තාගේ ව්‍යාපාර හා ආයතනික කටයුතුවලට සම්බන්ධ මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික් හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්නාගෙන යන පොත්.වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර් සහ අනෙකුත් ලේඛන, ඔහු විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ස්ථානයක දී පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීමට සහ නියම කරන ලද යම් ආකෘතියකින් ඒ පොත්. වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ අනෙකුත් ලේඛනවල සහතික කළ පිටපත් සැපයීම නියම කිරීම ;

(ඇ) ඕනෑම අවස්ථාවක ඒ තැනැත්තාගේ පරිශ්‍රයට, ගබඩා ප්‍රදේශයට හේ ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ අධ්‍යක්ෂවරයකුගේ, හවුල්කරුවකුගේ, සමාජිකයකුගේ, ලේකම්වරයකුගේ, කළමනාකරුවකුගේ, සේවානියුක්තයකුගේ, අනුයෝජිතයකුගේ, කොන්ත්‍රාත්කරුවකුගේ. හෝ විගණකවරයකුගේ ඒ පරිශ්‍රයේ තිබෙන වාහනයකට ඇතුළු වීමට හෝ එසේ ඇතුළු වීමට අධ්‍යක්ෂවරයා විසින් ඒ කාර්ය සඳහා සේවය ලබාගත් වෙනත් තැනැත්තකුට බලය දීම සහ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද ඒ පරිශ්‍රය ගබඩා ප්‍රදේශය, වාහන සහ ඒ තැනැත්තාගේ ව්‍යාපාර හා ආයතනික කටයුතු හා සම්බන්ධ මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සහ පරීක්ෂා කිරීමට කටයුතු සැලැස්වීම සහ අවශ්‍ය නම් ඒ පොත්, වාර්තා, ලිපිගොනු රෙජිස්ටර සහ අනෙකුත් ලේඛනවල සහතික කළ හෝ එසේ නොකළ පිටපත් අවශ්‍ය ආකාරයකින් ලබා ගැනීමට සහ ඒ පරිශ්‍රයේ හෝ ගබඩා ප්‍රදේශයේ හෝ වාහනයේ තිබී සොයාගත් හෝ පරිශ්‍රයේ හෝ ගබඩා ප්‍රදේශයේ සුරක්ෂිතාගාර ගත කර තිබිය හැකි මුදල්, විනිමය බිල්පත්. සංස්ථා හා රජයේ සුරැකුම් පත් ගණන් තබා ගැනීම;

එසේ වුව ද, ඒ තැනැත්තාගේ ව්‍යාපාර හා ආයතනික කටයුතුවලට සම්බන්ධ මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් යම් ස්වරූපයෙන් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර

සහ වෙනත් ලේඛන, ඒ තැනැත්තාගේ පරිශ්‍රයේ හෝ ඒ තැනැත්තාගේ ගබඩා ප්‍රදේශයේ හෝ ඒ තැනැත්තාගේ පරිශ්‍රයේ තිබෙන, ඒ තැනැත්තාගේ හෝ ඔහුගේ අධ්‍යක්ෂවරයකුගේ, හවුල්කරුවකුගේ, සමාජිකයකුගේ, ලේකම්වරයකුගේ, කළමනාකරුවකුගේ, සේවානියුක්තයකුගේ, අනුයෝජිතයකුගේ, කොන්ත්‍රාත්කරුවකුගේ. හෝ විගණකවරයකුගේ වාහනයක හැර වෙනත් ස්ථානයක තබා තිබෙන බවට අධ්‍යක්ෂවරයාට සාධාරණ තොරතුරු ලැබුණ හොත් අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ වෙනත් ස්ථානයට ඒ වාහනයට ඇතුළුවීම සහ ඒ පොත්, වාර්තා. ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සහ අවශ්‍ය නම් ඒවායේ සහතික කළ හෝ එසේ නොකළ පිටපත් අවශ්‍ය ආකාරයකින් ලබා ගැනීම සහ ඒ ස්ථානයේ දී සොයගත් මුදල්, විනිමය බිල්පත්, සංස්ථා හා රජයේ සුරැකුම්පත් ගණන් තබා ගැනීම

(ඇ) ඒ තැනැත්තාගෙන් හෝ ඒ තැනැත්තාගේ යම් අධ්‍යක්ෂවරයකුගෙන්, හවුල්කරුවෙකුගෙන්, සාමාජිකයකුගෙන්, ලේකම්වරයකුගෙන්, කළමනාකාරවරයකුගෙන්, සේවා නියුක්තිකයකුගෙන්, අනුයෝජිතයකුගෙන්, විගණකවරයකුගෙන්. හෝ කොන්ත්‍රාත්කරුවකුගෙන් හෝ ඒ තැනැත්තාගේ ව්‍යාපාර හා ආයතනික කටයුතු පිළිබඳව පළපුරුද්දෙන් දන්නා හෝ දැනුමක් ඇති හෝ ඒ සම්බන්ධ තොරතුරු සන්තකයේ පවතින වෙනත් යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න ඇසීම සහ ප්‍රකාශ වාර්තා කිරීම හෝ අවශ්‍ය වේ නම් අසන ලද ප්‍රශ්න වලට දිවුරුම් පෙත්සමක් මගින් පිළිතුරු සපයන ලෙස හෝ අවශ්‍ය වේ නම් (17 වන අධිකාරය වූ ) දිවුරුම් හෝ ප්‍රතිඥා අඥාපනතට අනුකූලව දිවුරුම් හෝ ප්‍රතිඥා දෙන ලෙස හෝ විධාන කිරීම සහ ප්‍රශ්ණ ඇසීමට සැළැස්වීම මෙන්ම ප්‍රකාශ වාර්තා කිරීම හෝ වාර්තා කිරීමට සැලැස්වීම ;

(ඉ) ඒ තැනැත්තාගේ පාලක සමාගමට, යම් පාලිත සමාගමකට හෝ ආශ්‍රිත සමාගමකට හෝ ඒ තැනැත්තාගේ පාලක සමාගමේ යම් පාලිත සමාගමකට හෝ ආශ්‍රිත සමාගමකට හේ අධ්‍යක්ෂවරයාගේ මතය අනුව ඒ තැනැත්තා සමග සැළකිය යුතු මූල්‍ය සම්බන්ධතාවයක් හෝ ඇති වෙනත් යම් සමාගමකට, අවශ්‍ය යයි අධ්‍යකෂවරයා සලකන තොරතුරු සැපයීමට සහ අධ්‍යක්ෂවරයා විසින් නියම

කරනු ලබන ආකෘතියකින්, ආකාරයකින්, ස්ථානයකදී, දිනයකදී, සහ වේලාවකදී, මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික් හේ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන එහි ව්‍යාපාර සහ ආයතනික කටයුතුවලට සම්බන්ධ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ අනෙකුත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීමට සහ ඒ පොත්, වාර්තා, ලිපිගෙනු, රෙජිස්ටර සහ අනෙකුත් ලේඛනවල සහතික කළ පිටපත් අවශ්‍ය යම් ආකාරයකින් සැපයීමට නියම කිරීම;

(ඊ) ඒ තැනැත්තාගේ ව්‍යාපාර හා ආයතනික තොරතුරු පළපුරුද්දෙන් දන්නා හේ ඒ ගැන දැනුමක් ඇති හෝ ඒ තොරතුරු සන්තකයේ පවතින හෝ තොරතුරු තිබෙන බවට පෙනී යන හෝ යම් තැනැත්තකුගෙන් ලිඛිත දැන්වීමක් මගින් තොරතුරු කැඳවීම සහ අවශ්‍ය නම් ඒ තැනැත්තා සම්මුඛ සාකාච්ඡාවක් සඳහා කැඳවීම ;

(උ) ඒ අරමුණ සඳහා අවශ්‍ය යයි ඔහු සලකන වෙනත් යම් ක්‍රියාමාර්ගයක් ගැනීම.

(2) (අ) වෙනත් ලිඛිත නීතියක ඊට පටහැනි කුමක් සඳහන් වුවද අධ්‍යක්ෂවරයා විසින් (1) වන උපවගන්තියේ කාර්ය සඳහා වූ විමර්ශනයක් පැවැත්වීමට අදාල අවස්ථානුගත තත්වයක් යටතේ අවශ්‍ය විය හැකි සියලු සහාය ලබා දෙන ලෙස පොලිස්පතිවරයාට හෝ පළාත භාර හෝ කොට්ඨාශය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට නියම කරනු ලැබිය හැකි අතර, ඒ විමර්ශනයේ සොයා ගැනීම් අධ්‍යක්ෂවරයා විසින් නියම කළ හැකි ආකාරයකට සහ නියම කළ හැකි කාලසීමාවන් තුළ අධ්‍යක්ෂවරයාට වාර්තා කරන ලෙස නියම කරනු ලැබිය හැකිය;

(ආ) පොලිස්පතිවරයා විසින් හේ පළාත් හෝ කොට්ඨාශය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් (1) වන උපවගන්තියේ කාර්ය සඳහා විමර්ශනයක් පවත්වන ලෙස කොට්ඨාශය භාර සහකාර පොලිස් අධිකාරීවරයාට හෝ අදාල පොලීසිය භාර ස්ථානාධිපතිවරයාට හෝ නියම කරනු ලැබිය හැකි අතර ඒ නිලධරයාට නීත්‍යනුකූල ලෙස ක්‍රියාත්මක කළ හැකි බලතලවලට අමතරව (1) වන උපවගන්තිය

(අ) සිට (උ) දක්වා වූ ඡේදවල සඳහන් ඕනෑම ක්‍රියාවක් සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සහිතව බලය තිබිය යුතු ය ;

(ඇ) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා විමර්ශනයක් කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් යම් ප්‍රාදේශීය ලේකම්වරයකුගේ සහාය ඉල්ලා සිටිය හැකි අතර අධ්‍යක්ෂවරයා විසින් නිශ්චිතව දක්වන ආකාරයට සහ එවැනි කාලයක් තුළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අධ්‍යක්ෂවරයාට සහාය දිය යුතු ය ;

(3) යම් තැනැත්තකු මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබූ බවට හෝ කරගෙන යන බවට හෝ තැන්පතු භාරගනු ලැබ තිබෙන බවට හෝ භාරගන්නා බවට, විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට හේතු තිබෙන අවස්ථාවක අධ්‍යක්ෂවරයා විසින් ඒ කරුණ මණ්ඩලයට වාර්තා කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කළ වාර්තාව සලකා බැලීමෙන් පසු, මණ්ඩලය විසින්, ඒ වාර්තාව ඉදිරපත් කර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධවද, ඒ තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දීමෙන් පසු, ඒ තැනැත්තා 2 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබුවේද හෝ කරගෙන යනු ලබන්නේ ද හෝ තැන්පතු භාර ගනු ලැබ තිබෙන්නේ ද හෝ භාර ගනු ලබන්නේ ද යන්න නිශ්චය කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා 2 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින්, මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබූ බව හෝ කරගෙන යන බව හෝ තැන්පතු භාරගනු ලැබ තිබෙන බව හෝ භාර ගන්නා බව නිශ්චය කරනු ලැබුවහොත්, ඒ අනුව ඒ නිශ්චය ඒ තැනැත්තාට ලිඛිතව දන්වනු ලැබිය යුතු ය. කරුණු ඉදිරිපත් කිරීමට දෙනු ලබන අවස්ථාව පිළිබඳ දැන්වීම ඇතුළු මණ්ඩලය විසින් මේ වගන්තිය යටතේ දෙනු ලැබිය යුතු යම් දැන්වීමක් ඒ තැනැත්තා අවසන්වරට සිටි ස්ථානයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබුවහොත් එය භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) මෙම පනත යටතේ යම් නඩුවක් පවරා ඇති අවස්ථාවක, යම් තැනැත්තකු මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබුවේ ද හෝ කරගෙන යන්නේ ද හෝ තැන්පතු භාරගනු ලැබ තිබේ ද හෝ භාරගන්නේ ද යන කරුණු පිළිබඳ යම් ප්‍රශ්නයක් මතු වුවහොත් ඒ

තැනැත්තා මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබූ බවට හෝ කරගෙන න බවට හෝ තැන්පතු භාරගනු ලැබ තිබෙන බවට හෝ භාරගන්නා බවට කරන ලද නිශ්චයට සම්බන්ධ මණ්ඩලයේ රැස්වීම් වාර්තාවේ සහතික කළ පිටපතක්, සාක්ෂිවලදී, අවශ්‍ය විය යුතු අතර එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(6) මණ්ඩලය විසින් (4) වන උපවගන්තිය යටතේ වූ තීරණය පිළිබඳ දැන්වීම සමගම හෝ ඉන් පසුව අවශ්‍ය යයි සලකනු ලබන විධාන ඒ තැනැත්තාට නිකුත් කරනු ලැබිය හැකි අතර එකී විධානවලට ඒ තැනැත්තාගේ ව්‍යාපාර කටයුතු මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් තැනැත්තකුට අවසතු කිරීම හෝ තැනපතු වගකීම් ආපසු ගෙවීම් හෝ සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නිසි අධිකරණ බලය ඇති අධිකරණයකට නිශ්චිත කාලයක් තුළදී ඉල්ලීමක් කිරීම වැනි පියවර ඇතුළත් විය හැකි අතර ඒ විධානවලට අනුකූලව ක්‍රියාකිරීම ඒ තැනැත්තාගේ කාර්ය වන්නේ ය.

(7) (6) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තාගේ ව්‍යාපාර කටයුතු අවසතු කිරීමේ විධාන නිකුත් කිරීමේ දී, වෙනත් ලිඛිත නීතියක පටහැනිව කුමන විධිවිධාන තිබුණ ද මණ්ඩලය විසින්—

(අ) තැන්පතුකරුවකු විසින් ඒ තැනැත්තා සමග ඇතුළත් වූ යම් ගිවිසුමක් සමාලෝචනය කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තාගේ තැන්පතුකරුවන්ගේ හෝ අනිකුත් ණය හිමියන්ගේ යහපත ගැන හේ විචක්ෂණ වානිජ පරිචය ගැන නිසි සැලකිල්ලකින් තොරව ඒ ගිවිසුමට එළඹ ඇතැයි මණඩලය විසින් සලකනු ලැබන අවස්ථාවක ආපසු ගෙවීම, පොලි අනුපාතික, සහ අය කිරීම් සම්බන්ධයෙන් වූ නියම ඇතුළුව ඒ ගිවිසුමේ නියම වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) ඒ තැනැත්තා වෙනත් යම් තැනැත්තකු සමග ඇතුළත් වී ඇති යම් ගිවිසුමක් හෝ කොන්ත්‍රාත්තුවක් සමාලෝචනය කරනු ලැබිය හැකි අතර, එවැනි සමාලෝචනයකින් පසු, ඒ තැනැත්තාගේ තැන්පතුකරුවන්ගේ සහ අනෙකුත් ණයහිමියන්ගේ යහපත ගැන හෝ විචක්ෂණ වාණිජ පරිචය ගැන නිසි සැලකිල්ල නොදක්වා ඒ ගිවිසුමට හෝ කොන්ත්‍රාත්තුවට එළඹ ඇති බව මණ්ඩලයට පෙනී ගියහොත් ඒ ගිවිසුමේ හෝ කොන්ත්‍රාත්තුවේ නියම වෙනස් කරනු ලැබිය හැකි ය.

(8) ඒ තැනැත්තා (6) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන අනුව කටයුතු කිරීමට පැහැර හරින අවස්ථාවක, ඒ තැනැත්තා ගණන් බේරා වසා දැමීම හෝ අධිකරණයකින් ඒ තැනැත්තා බුන්වත් බව ප්‍රකාශ කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම ඇතුළුව අවශ්‍ය යයි මණ්ඩලය සලකන පියවර මණ්ඩලය විසින් ගනු ලැබිය හැක.

සමාගමක් ගණන් බේරා වසා දැමීමේ දී 32 වන වගන්තියේ විධිවිධාන, එහි (3) වන උපවගන්තියේ විධිවිධාන හැර, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

සමාගමක් හැර වෙනත් තැනැත්තන් මණ්ඩලයක් ගණන් බේරා වසා දැමීමේ දී 32 වන වගන්තියේ විධිවිධාන සහ (2) වන සහ (3) වන උපවගන්තිවල හැර අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු අතර, ඇවරකරු විසින් සුදුසු යයි සලකන ආකාරයට සුදුසු යයි ඔහු සලකන පදනමක් අනුව, ඒ තැනැත්තන් මණ්ඩලයේ වත්කම් සහ බැරකම්වල අගය නිශ්චිතව දැනගත යුතු ය. ගණන් බේරා වසා දැමීම සඳහා ආඥාවක් නිකුත් කිරීමෙන් පසු කවර විටක වුවද නිසි බලය ඇති අධිකරණය විසින් ඇවරකරුට සියලු වත්කම් මුදල් කර ගැනීමට බලය දෙනු ලැබිය හැකි අතර, යම් තැනැත්තකුට ඔහු සන්තකයේ පවතින ඒ තැනැත්තන් මණ්ඩලයට හිමි යම් මුදල්, දේපල, පොත් සහ වෙනත් ලේඛන වහාම හෝ විශේෂිතව සඳහන් කළ කාලසීමාවක් තුළ ඇවරකරුට, ගෙවීමට, භාරදීමට, යැවීමට, යටතට පැමිණවීමට හෝ පැවරීමට නියම කරනු ලැබිය හැකිය. ඇවරකරු විසින්, ඒ තැනැත්තන් මණ්ඩලය ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා සැලැස්මක් සකස් කර, නිසි බලය ඇති අධිකරණයේ තහවුරුව සඳහා ඉදිරිපත් කළ යුතු අතර, ඒ තැනැත්තන් මණ්ඩලය ගණන් බේරා වසා දැමීම ඒ සැලැස්මට අනුව ක්‍රියාත්මක කළ යුතු ය.

(9) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන්නේ නම් (4) වන උපවගන්තිය ප්‍රකාරව තීරණය කරන ලද ඒ තැනැත්තාගේ මුදල් සහ දේපළ ආපසු ලබා ගැනීම සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය යයි සළකනු ලබන යම් පියවර ගනු ලැබිය හැකි අතර, මේ පනතේ 51 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් විය යුතු ය.

(10) නිශ්චය සඳහන් තැනැත්තන් 2 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් මුදල් ව්‍යාපාර කටයුතු කර ගෙන ගනු ලැබූ බවට හෝ කරගෙන යන බවට හෝ තැන්පතු භාර ගනු ලැබූ බවට හෝ භාර ගන්නා බවට හෝ භාර ගන්නා බවට, මණ්ඩලය විසින්,

යටත් පිරිසෙයින්, ශ්‍රී ලංකාවේ සංසරණය වන එක් දෛනික සිංහල, සිංහල දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පතක, දැන්වීමක් පළ කරනු ලැබිය හැකිය, ඒ තැනැත්තා, තැනැත්තන් මණ්ඩලයක් වන්නේ නම්, ඒ තැනැත්තන් මණ්ඩලය:—

(i) සංස්ථාගත මණ්ඩලයක් නම් ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ලිපින;

(ii) ව්‍යාපාර ආයතනයක් නම් ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවන්ගේ නම් සහ ලිපින ;

(iii) ව්‍යාපාර ආයතනයක් හැර වෙනත් සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම් ඒ මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහ නිලධාරීන්ගේ නම් සහ ලිපින.

ඒ දැන්වීමේ අඩංගු කරනු ලැබිය හැකි ය.

(11) මේ වගන්තිය යටතේ තමාට කරන ලද යම් නියමයක් අනුව කටයුතු කිරීම සෑම තැනැත්තකුගේම කාර්ය විය යුතු අතර, යම් තැනැත්තකු—

(අ) මේ වගන්තිය යටතේ නියම කර සිටින යම් තොරතුරක් සැපයීමට හෝ පොතක්, වාර්තාවක්, ලිපි ගොනුවක් හෝ වෙනත් ලේඛනයක් ද්‍රව්‍යයක් හේ දෙයක් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරිමට හෝ පැහැර හැරියහොත් ;

(ආ) සම්මුඛ සාකච්ඡාවක් සඳහා කැඳවූ විට ඒ සඳහා තමාම යෑමට පැහැර හැරියහොත් ;

(ඇ) ව්‍යජ හෝ අසම්පූර්ණ හෝ සාවද්‍ය හේ නොමග යවන සුළු තොරතුරු, පොත්, වාර්තා ලිපිගොනු, රෙජිස්ටර හෝ වෙනත් යම් ලේඛන, ද්‍රව්‍ය හෝ දේ සැපයුවහොත්; හෝ

(ඈ) අධ්‍යක්ෂවරයාට හෝ (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකුට හෝ අධ්‍යක්ෂවරයා විසින් විමර්ෂණය කිරීමේ දී ඔහුට සහාය වන ලෙස ඉල්ලා සිටින ලද හෝ නියම කරන ලද පොලිස්පතිවරයාට හෝ පළාත භාර හෝ කොට්ඨාශය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාට හෝ යම් ප්‍රාදේශීය ලේකම්වරයකුට හෝ අවස්ථාවෝචිත පරිදි, පොලිස්පතිවරයා, නියෝජ්‍ය පොලිස්පතිවරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකුට, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් කර්තව්‍යයක් කිරීමේ දී අවහිර කළහොත්,

ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු වේ.

*තොරතුරු සහ පොත් සපයන ලෙස යම් තැනැත්තකුට බලකරන අධිකරණ ආඥා.*

**43.** යම් තැනැත්තකු 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 46 වන වගන්තිය හෝ ප්‍රකාර ඉල්ලා සිටි යම් තොරතුරු, පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර හෝ අනෙකුත් ලේඛන හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක් සැපයීමට පැහැර හරින හෝ ව්‍යාජ, සාවද්‍ය හෝ අසම්පූර්ණ තොරතුරු, පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර, හෝ වෙනත් ලේඛන හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක් සපයන අවස්ථාවක—

(අ) 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 46 වන වගන්තිය හෝ ප්‍රකාර කටයුතු කිරීමට පැහැර හරින තැනැත්තාගේ මුද්‍රිත, ඉලෙක්ට්‍රොනික් හෝ වෙනත් යම් ස්වරූපයකින් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන, ද්‍රව්‍ය හෝ දෑ පරීක්ෂා කිරීමට ඉල්ලීමේ නම් කරන ලද යම් තැනැත්තකුට, බලය දෙමින් ; හෝ

(ආ) 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 46 වන වගන්තිය හෝ ප්‍රකාර කටයුතු කිරීම පැහැර හරින තැනැත්තාට හෝ ආඥාවේ නම් කළ හැකි පරිදි, ඒ තැනැත්තාගේ අධ්‍යක්ෂවරයකුට, හවුල්කරුවකුට, සාමාජිකයකුට, ලේකම්වරයකුට, කළමනාකරුවකුට, සේවානියුක්තයකුට, අනුයෝජිතයකුට, කොන්ත්‍රාත්කරුවෙකුට, හෝ විගණකවරයකුට, ඒ තැනැත්තාගේ, මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික් ස්වරූපයෙන් පවත්වාගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන, ද්‍රව්‍ය සහ දෑ ආඥාවේ නිශ්චිතව සඳහන් කළ තැනැත්තකුට නිශ්චිතව සඳහන් කළ ස්ථානයකදී ඉදිරිපත් කරන ලෙස නියම කරමින්,

අඥාවක් නිකුත් කරන මෙන්, අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් නිසි මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

*ක්‍රියාවිරහිත කිරීමේ නියෝගයක් නිකුත් කිරීම.*

**44.** (1) 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර යම් තැනැත්තකු පිළිබඳව පිළිබඳව විමර්ශනය කරද්දී අධ්‍යක්ෂවරයා විසින් ඕනෑම අවස්ථාවක (මෙහි මින් මතු "ක්‍රියාවිරහිත කිරීමේ නියෝගය" යයි සඳහන් කරනු ලබන) නියෝගයක්, පහත දැක්වෙන එක් දෙයක් හෝ වැඩි ගණනක් සඳහා කරනු ලැබිය හැක:—

(අ) ඒ තැනැත්තාගේ වත්කම් හෝ එහි යම් කොටසක් හෝ බැහැර කිරීම තහනම් කිරීම ;

(ආ) අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ගනුදෙනුවකට හෝ ගනුදෙනු වර්ගයකට ඒ තැනැත්තා ඇතුළු වීම තහනම් කිරීම ;

(ඇ) ඒ තැනැත්තට තැන්පතු කැඳවීම හෝ රැස් කිරීම තහනම් කිරීම;

(ඈ) අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ගිණුමකට, දේපළකට, ආයෝජනයකට, හෝ සම්බන්ධ යම් ගනුදෙනුවකට ඇතුළුවීම තහනම් කිරීම.

(2) 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර තැනැත්තන් මණ්ඩලයක් පිළිබඳව විමර්ෂණය කරද්දී, ඕනෑම අවස්ථාවක ඒ තැනැත්තන් මණ්ඩලය —

(i) සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ, සංස්ථාගත මණ්ඩලයේ ඕනෑම අධ්‍යක්ෂවරයකුට හේ කළමනාකරුවකුට ;

(ii) ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ ඕනෑම හවුල්කරුවකුට ;

(iii) ව්‍යාපාරය ආයතනයක් නොවන සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම්, ඒ මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකුට හෝ මණ්ඩලයේ කළමනාකරණය හා පාලනය පිළිබඳ වගකීම දරන එහි ඕනෑම නිලධරයකුට,

අධ්‍යක්ෂවරයා විසින් පහත සඳහන් එකක් හෝ වැඩි ගණනක් සඳහා ක්‍රියාවිරහිත කිරීමේ නියෝගයක් කරනු ලැබිය හැකි වේ.

(අ) ඒ තැනැත්තාගේ වත්කම් හෝ ඉන් යම් කොටසක් බැහැර කිරීම තහනම් කිරීම;

(ආ) අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ගනුදෙනුවකට හෝ ගනුදෙනු වර්ගයකට ඒ තැනැත්තා ඇතුළුවීම තහනම් කිරීම ;

(ඈ) එ තැනැත්තාට තැන්පතු කැඳවීම හෝ රැස්කිරීම තහනම් කිරීම;

(ඉ) අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ගිණුමට දේපළකට. ආයෝජනයකට හෝ සම්බන්ධ යම් ගනුදෙනුවකට ඇතුළුවීම තහනම් කිරීම.

(3) මේ වගන්තියේ (1) වන සහ (2) වනන උපවගන්ති යටතේ නිකුත් කළ ක්‍රියාවිරහිත කිරීමේ නියෝගයක්, 45 වගන්තියේ විධිවිධානවලට යටත් ව, එය නිකුත් කිරීමේ සිට දින හතක් ඉක්ම වූ කාලයකට බලාත්මක නොවිය යුතු ය.

ක්‍රියාවිරහිත කිරීමේ නියෝගය තහවුරු කිරීම සහ ගමන් බලපත්‍ර අත්හිටුවීම.

**45.** (1) 44 වන වගන්තිය යටතේ ක්‍රියා විරහිත කිරීමේ නියෝගය නිකුත් කිරීමෙන් පසු අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාවිරහිත කිරීමේ නියෝගය බලාත්මකව පවතින කාලසීමාව තුළ ඒ ක්‍රියාවිරහිත කිරීමේ නියෝගය තහවුරු කිරීම සඳහා මහාධිකරණයට ඉල්ලීමක් කළ යුතු අතර ක්‍රියා ක්‍රියාවිරහිත කිරීමේ නියෝගය දීර්ඝ කිරීමක් අවශ්‍ය තත්ත්වයක් ඇති වුවහොත් එසේ දීර්ඝ කිරීමක් ද ඉල්ලා සිටිය යුතු ය.

(2) ඒ ක්‍රියා විරහිත කිරීමේ නියෝගය නිකුත් කිරීමට ප්‍රමාණවත් හේතු තිබෙන බවට මහාධිකරණය සෑහීමකට පත් වූ අවස්ථාවක, මහාධිකරණය විසින් ක්‍රියා විරහිත කිරීමේ නියෝගය තහවුරු කරනු ලැබිය හැකි අතර, එය දීර්ඝ කිරීම සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට මහාධිකරණය සෑහීමට පත් වුවහොත් සුදුසු යයි මහාධිකරණය අදහස් කරන කාලසීමාවන් සඳහා දීර්ඝ කිරීම් කරනු ලැබිය හැකි වේ.

(3) (අ) 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර යම් තැනැත්තකු පිළිබඳව විමර්ෂනය කරද්දී අධ්‍යක්ෂවරයා විසින් ඕනෑම අවස්ථාවක ඒ විමර්ශනයට භාජනය වී ඇති ඒ තැනැත්තාගේ ගමන් බලපත්‍රය අත්හිටුවීම සඳහා අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉල්ලීමක් කළ හැකි ය.

(ආ) 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර විමර්ෂණයට භාජනය වී ඇති තැනැත්තා, තැනැත්තන් මණ්ඩලයක් වන අවස්ථාවක දී අධ්‍යක්ෂවරයා විසින්-

(i) ඒ තැනැත්තන් මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම් ඒ සංස්ථාගත මණ්ඩලයේ ඕනෑම අධ්‍යක්ෂවරයකුගේ හෝ කළමනාකරුවකුගේ ;

(ii) ඒ තැනැත්තන් මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම් එහි ඕනෑම හවුල්කරුවකුගේ ; සහ

(iii) ඒ තැනැත්තන් මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නොවන, සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම්, ඒ මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකුගේ හෝ ඒ මණ්ඩලයේ කළමනාකරණය හා පාලනය පිළිබඳ වගකීම් දරන එහි ඕනෑම නිලධාරියකුගේ.

විදේශ ගමන් බලපත්‍රය අත්හිටුවීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි ඉල්ලීමක් හෝ ඉල්ලීම් ඉදිරිපත් කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

විමර්ශනයට භාජනය වන තැනැත්තන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ තොරතුරු.

**46.** (1) 42 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර විමර්ශනයක් ආරම්භ කර ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි දිනක පැවති ඒ තැනැත්තාගේ වත්කම් සහ බැරකම් පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂවරයා නිශ්චය කරන ආකාරයකට, ඒ තැනැත්තාගෙන් හෝ ඒ තැනැත්තාගේ වත්කම් සහ බැරකම් පිළිබඳව පළපුරුද්දෙන් දන්නා හෝ දැනුමක් ඇති හෝ ඒ තැනැත්තාගේ වත්කම් සහ බැරකම් පිළිබඳව තොරතුරු තිබෙන බව පෙනී යන හෝ යම් තැනැත්තකුගෙන්, අධ්‍යක්ෂවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් කැඳවා සිටිය හැකිය.

(2) ඒ තැනැත්තා තනි පුද්ගලයෙක් නම් ඔහුගේ කලත්‍රයාගේ, දරුවන්ගේ සහ දෙමව්පියන්ගේ වත්කම් හා බැරකම් පිළිබඳ තොරතුරු කැඳවනු ලැබිය හැකි ය.

(3) ඒ තැනැත්තා තැනැත්තන් මණ්ඩලයක් නම්, පහත දැක්වෙන අයගේ සහ ඔවුන්ගේ කලත්‍රයන්ගේ, දරුවන්ගේ සහ දෙමව්පියන්ගේ ද වත්කම් සහ බැරකම් පිළිබඳ තොරතුරු කැඳවනු ලැබිය හැකි ය :

(අ) සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරුන්, කළමනාකරුවන් සහ සේවානියුක්තයන් ;

(ආ) ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් ;

(ඇ) ව්‍යාපාර ආයතනයක් නොවන, සංස්ථාගත නොකළ තැනැත්තන් මණ්ඩලයක සාමාජිකයන්.

(4) ඒ තැනැත්තාගේ වත්කම් සහ වෙනත් යම් තැනැත්තකුට යම් ආකාරයකින් පවරා ඇති බව, තෑගි කර ඇති බව, වෙන් කර දී ඇති බව හෝ බැහැර කර ඇති බවට අධ්‍යක්ෂවරයාට තොරතුරු තිබෙන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ වෙනත් තැනැත්තාගේ වත්කම් සහ බැරකම් පිළිබඳ තොරතුරු කැඳවනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය (1) වන, (2) වන, (3) වන හෝ (4) වන උපවගන්ති යටතේ තොරතුරු ඉල්ලා සිටීමේදී, යම් නිශ්චිත කාලයක් සඳහා බැරකම් වැඩිවීම සහ අඩුවීම පිළිබඳව සහ වත්කම් අත්කර ගැනීම් සහ බැහැර කිරීම් පිළිබඳව විස්තර අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකිය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "වත්කම් සහ බැරකම්" යනුවෙන් ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත තිබෙන වත්කම් සහ බැරකම් අදහස් වන අතර, එයට යම් තැනැත්තකු හෝ ඔහුගේ ඥාතියාට මුළුමණින්ම හෝ එහි යම් කොටසක් හෝ අයිති නිශ්චල සහ චංචල දේපල ද ඒ තැනැත්තාට හෝ ඔහුගේ ඥාතියාට අර්ථදායි අයිතිවාසිකමක් ඇති යම් දේපලද ඇතුළත් වේ.

පොලිසිය සහ ප්‍රාදේශීය ලේකම්වරුන් තොරතුරු සැපයිය යුතු බව.

**47.** පනතේ 42 වන වගන්තිය ප්‍රකාර පවත්වනු ලබන විමර්ශනයක් පහසු කිරීම සඳහා, අධ්‍යක්ෂවරයා විසින්, පොලිස් ස්ථානයක් භාර පොලිස් ස්ථානාධිපතිවරයකුගෙන් හෝ අදාළ ප්‍රදේශීය ලේකම්වරයකුගෙන්, අවස්ථාවෝචිත පරිදි, අදාළ පොලිස් කොට්ඨාසයේ හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීමා තුළ පදිංචි හෝ සිය ව්‍යාපාර ස්ථානය තිබෙන හෝ යම් තැනැත්තකු පිළිබඳ තොරතුරු සපයන ලෙස, නියම කරනු ලබිය හැකි අතර, අධ්‍යක්ෂවරයා විසින් නියම කර සිටි තොරතුරු සැපයීමට, පොලිස් ස්ථානාධිපතිවරයා හෝ ඒ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ විසින්, සෑම උත්සාහයක්ම ගනු ලැබිය යුතු ය.

අධිකාරී බලයක් නොමැතිව තැන්පතු කැඳවමින් ප්‍රචාරණය කිරීම තහනම් කිරීම.

**48.** (1) මේ පනත යටතේ මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලය ලැබූ තැනැත්තකු හෝ මේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාර නිදහස් කරන ලද යම් බැංකුවක් හෝ ආයතනයක් හැර, වෙනත් කිසිම තැනැත්තකු විසින්, කිසිම ක්‍රමයකින් හෝ කිසිම ආකාරයකින්, ඍජු හෝ වක්‍ර ලෙස තැන්පතු කැඳවීම සඳහා ප්‍රචාරණය කරනු නොලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රචාරණ දැන්වීමකින්, (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන බව

අධ්‍යක්ෂවරයාගේ මතය වන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ තැනැත්තාට, තැන්පතු කැඳවීම සඳහා ප්‍රචාරක දැන්වීම් පළකිරීමෙන් වැළකෙන ලෙස නියම කරමින් නොතීසියක් යවනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් වන නොතීසිය, ලියාපදිංචි තැපෑලෙන්-

(අ) ප්‍රචාරක දැන්වීමේ දී ඇති ලිපිනයට ;

(ආ) ඒ තැනැත්තා තනි පුද්ගලයෙක් නම් ඒ තැනැත්තාගේ ව්‍යාපාර ස්ථානයට හෝ පදිංචි ලිපිනයට ;

(ඇ) ඒ තැනැත්තා සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ තැනැත්තාගේ ව්‍යාපාර ස්ථානයට හෝ ලියාපදිංචි කළ ලිපිනයට ; හෝ

(ඈ) ඒ තැනැත්තා සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම්, ඒ තැනැත්තාගේ ව්‍යාපාර ස්ථානයට හෝ ඒ මණ්ඩලයේ හවුල්කරුවන්ගේ හෝ සාමාජිකයන්ගේ ලිපිනවලට.

යවා ඇත්නම්, ඒ නොතීසිය, නොතීසියේ සඳහන් වන පුද්ගලයාට භාර දී ඇතැයි සළකනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාර අධ්‍යක්ෂවරයා විසින් යවන ලද නොතීසියකට අනුව ක්‍රියා කිරීමට යම් තැනැත්තකු පැහැර හරින්නේ නම්, ඒ තැනැත්තාගේ ව්‍යාපාර ස්ථානය පිහිටා ඇති හෝ ඒ තැනැත්තාගේ ලියාපදිංචි ලිපිනය, පදිංචි ලිපිනය හෝ ප්‍රචාරක දැන්වීමේ දී ඇති ලිපිනය අයත් වන අධිකරණ බලප්‍රදේශය හිමි මහෙස්ත්‍රාත් අධිකරණයට, අධ්‍යක්ෂවරයා විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(5) (අ) 4 වන උපවගන්තිය ප්‍රකාර අධ්‍යක්ෂවරයා විසින් කරනු ලැබූ ඉල්ලීමක පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු ය.

(i) මේ පනතේ කාර්ය සඳහා ඔහු අධ්‍යක්ෂවරයා බව ;

(ii) ඔහුගේ මතය අනුව, (2) වන උපවගන්තිය ප්‍රකාර නිකුත් කළ නොතීසියේ සඳහන් වන ප්‍රචාරක දැන්වීම තැන්පතු කැඳවීමේ කාර්යය සඳහා ඍජුව හෝ වක්‍රව අදහස් කර ඇති බව ;

(iii) ඉල්ලීමේ සඳහන් කළ තැනැත්තාට, එනම් අධ්‍යක්ෂවරයාගේ මතය අනුව (ii) අනුඡේදයේ සඳහන් වන ප්‍රචාරක දැන්වීමේ දැන්වීම්කරු වන තැනැත්තාට, (2) වන උපවගන්තිය ප්‍රකාර නොතීසියක් නිකුත් කළ බව ;

(v) දැන්වීම්කරු (1) වන උපවගන්තිය යටතේ තැන්පතු කැඳවමින් දැන්වීමක් පළකිරීමට බලය ලබා දී ඇති තැනැත්තකු නොවන බව ; සහ

(vi) (2) වන උපවගන්තිය අනුව නිකුත් කළ නොතීසියේ අඩංගු නියමයන්ට අනුව කටයුතු කිරීමට දැන්වීම්කරු පැහැර හැර ඇති බව.

(ආ) තැන්පතු කැඳවීම සඳහා, කවර ආකාරයකින් හෝ ඍජු හෝ වක්‍ර ලෙස ප්‍රචාරණය කිරීම වහාම නවත්වන ලෙස දැන්වීම්කරුට නියෝග කරමින් ආඥාවක් කරන ලෙස ඉල්ලා සිටින ආයාචනයක් ඉල්ලීමෙහි අන්තර්ගත විය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ කරන සෑම ඉල්ලීමක්ම ඒ ඉල්ලීමේ දක්වා ඇති කරුණු තහවුරු කරන දිවුරුම් පෙත්සමකින් තහවුරු කළ යුතු අතර, ඒ ඉල්ලීම සමඟ (2) වන උපවගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද ප්‍රචාරක දැන්වීමේ පිටපතක් සහ (2) වන උපවගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද නොතීසියේ පිටපතක් ද ඉදිරිපත් කළ යුතු ය.

(7) (4) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් අධිකරණය වෙත ලැබීමේ දී-

(අ) ඉල්ලීම කරනු ලැබ ඇත්තේ යම් ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් ද ඒ ප්‍රචාරක දැන්වීම පළකිරීමෙන් ඒ ඉල්ලීමෙහි නම් කර ඇති දැන්වීම්කරු වළක්වමින් සහ නඩු කටයුතු අවසන් වන තුරු හෝ අධිකරණය විසින් සුදුසුයයි සළකනු ලබන තෙක් තැන්පතු කැඳවන, තවදුරටත් වූ ප්‍රචාරක දැන්වීම් කවර හෝ ආකාරයකින් පළකිරීමෙන් ඒ දැන්වීම්කරු වළක්වමින් කොන්දේසි සහිත ආඥාවක් ; සහ

(ආ) ඍජුව හෝ වක්‍රව තැන්පතු කැඳවමින් කවර හෝ ආකාරයකින් ප්‍රචාරක දැන්වීම් කිරීමෙන් ඒ දැන්වීම්කරු වළක්වන ආඥාවක් නිකුත් නොකළ යුත්තේ මන් ද යන්න පිළිබඳව සිතාසියේ සඳහන්ව ඇති දිනයේ දී (සිතාසි නිකුත් කළ දින සිට සති දෙකකට වැඩි නොවන කාලයක් තුළ වූ දිනයක දී) අධිකරණයේ පෙනී සිට හේතු ඉදිරිපත් කරන ලෙස නියම කරන සිතාසි ද,

අධිකරණය විසින් ඉල්ලීමේ නම් කර ඇති දැන්වීම්කරු වෙත වහාම නිකුත් කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ සිතාසියක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙතද, ඒ තැනැත්තා සිතාසියේ සඳහන් කළ දිනයේදී අධිකරණයේ පෙනී සිටීම පැහැර හරිනු ලැබුවහොත් හෝ තමාට ඉදිරිපත් කිරීමට හේතු නොමැති බව අධිකරණයට දැනුම් දෙනු ලැබුවහොත් අධිකරණය විසින් (7) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද කොන්දේසි සහිත ආඥාව, ඉල්ලීම ඉදිරිපත් කර ඇත්තේ යම් දැන්වීමක් සම්බන්ධයෙන් ද ඒ දැන්වීම පළකිරීමෙන් දැන්වීම්කරු වළක්වන සහ තැන්පතු තවදුරටත් වූ දැන්වීම් කවර හෝ ආකාරයකින් පළකිරීමෙන් ද ඒ දැන්වීම්කරු වළක්වන අවසාන ආඥාවක් බවට පත් කළ යුතු ය.

(9) මේ වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ සිතාසියක් භාරදෙන ලද්දේ යම් තැනැත්තකුටද, ඒ තැනැත්තා සිතාසියේ සඳහන් කළ දිනයේ දී අධිකරණයේ පෙනී සිට, තැන්පතු කැඳවමින් කවරාකාරයේ හෝ ප්‍රචාරණයක් කිරීම ඔහුට තහනම් කරමින් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුත්තේ කුමක් නිසාද යන බවට හේතු තිබෙන බව අධිකරණයට දන්වන්නේ නම්, අධිකරණය ඒ කාරණය පිළිබඳව විභාග කර තීරණය කිරිමට කටයුතු කරනු ලැබිය හැකි ය.

(10) (අ) මේ වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ වූ ඒ විභාගයේදී, (7) වන උපවගන්තිය යටතේ සිතාසිය භාර දෙනු ලැබූ දැන්වීම්කරුට, ඔහු ඉල්ලීමේ සඳහන් වූ ප්‍රචාරක දැන්වීම නොකළ බව හෝ ඔහුට එසේ දැන්වීමක් කිරීමට අවසර ලබා දෙන යම් ලිඛිත නීතියක් යටතේ දැන්වීම කළ බව සහ ඒ අවසරය බලාත්මකව පවතින බව සහ අවලංගු කර නැති බව හෝ වෙනත් ලෙසකින් නිර්බල කර නැති බව හෝ හැරුන විට (4) වන උපවගන්තිය යටතේ කළ ඉල්ලීමේ සඳහන් කරුණු

කිසිවක් පිළිබඳව විවාද කිරිමට අයිතියක් නොලැබිය යුතු ය.

(ආ) (4) වන උපවගන්තිය යටතේ කරන ඉල්ලීමක් සනාථ කිරීම සඳහා අධ්‍යක්ෂවරයාගේ යම් සාක්ෂි කැඳවීමට මහෙස්ත්‍රාත් අධිකරණයට නිසි බලය නොතිබිය යුතු ය.

(11) හේතු ඉදිරිපත් කරන තැනැත්තාට තැන්පතු කැඳවමින් දැන්වීම් පළකිරීමට හිමිකමක් ඇති බවට තමා ඉදිරිපත් කරන ලද සාක්ෂි මත තීරණය කිරීමට පරීක්ෂණයෙන් පසු මහෙස්ත්‍රාත්වරයාට නොහැකි නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් (7) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද කොන්දේසි සහිත ආඥාව, ඉල්ලීම ඉදිරිපත් කර ඇත්තේ යම් දැන්වීමක් සම්බන්ධයෙන් ද, ඒ දැන්වීම පළකිරීමෙන් දැන්වීම්කරු වළක්වන සහ තැන්පතු කැඳවන තවදුරටත් වූ දැන්වීම් කවර හෝ ආකාරයකින් පළකිරීමෙන් ද දැන්වීම්කරු වළක්වන අවසාන ආඥාවක් බවට පත් කළ යුතු ය. ඒ තැනැත්තා විසින් අධිකරණය සෑහීමට පත්වන පරිදි කරුණු ඉදිරිපත් කරනු ලැබුවහොත් (7) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද කොන්දේසි සහිත ආඥාව මහෙස්ත්‍රාත්වරයා විසින් ඉවත් කරනු ලැබිය යුතු ය.

(12) (4) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ප්‍රකාරව තැන්පතු කැඳවමින් කවර හෝ ආකාරයකින් දැන්වීම් පළකිරීම වහාම නවත්වන ලෙස යම් තැනැත්තකුට නියම කරන ආඥාවක් අධිකරණය විසින් කරනු ලබන අවස්ථාවක වැළැක්වීමේ ආඥාව ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා අවශ්‍ය සියළු ආඥා ද අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය.

තැන්පතු කැඳවමින් කරන ප්‍රචාරක දැන්වීම් පළකිරීමට පෙර මාධ්‍ය ආයතන විසින් කරුණු පිරික්සා බැලිය යුතු ය.

**49.** මාධ්‍ය ආයතනයක් විසින් තැන්පතු කැඳවන ප්‍රචාරක දැන්වීමක් පළ කිරීමට පෙර, අදාළ දැන්වීම්කරුට තැන්පතු භාරගැනීමට බලය ලැබී ඇත්දැයි ඒ දැන්වීම්කරුගෙන් විමසා දැනගනු ලැබිය යුතුය.

අධිකාරී බලය නොමැතිව තැන්පතු කැඳවන ප්‍රචාරක දැන්වීම් පළ කිරීම වරදක් බව.

**50.** (1) තැන්පතු කැඳවමින් යම් තැනැත්තකු කරන ප්‍රචාරක දැන්වීම් පළ කිරීමෙන් වළකින ලෙස නියම කරමින් ඒ තැනැත්තාගේ නම සඳහන් නොතීසියක් අධ්‍යක්ෂවරයා, විසින්, ඕනෑම මාධ්‍ය ආයතනයකට යවනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

## VIII වන කොටස

### වැරදි සහ දණ්ඩන

අයුතු ලැබීම් පිළිබඳව ගතයුතු පියවර.

**51.** (1) අධ්‍යක්ෂවරයාගේ වාර්තාවක් සළකා බැලීමෙන් පසු, මුදල් සමාගමක යම් ආදී හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධාරියකු, කළමනාකරුවකු, සේවානියුක්තයකු, අනුයෝජිතයකු හෝ කොන්ත්‍රාත්කරුවකු යම් ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින්-

(අ) ඒ මුදල් සාමාගමට අයිති මුදල් හෝ දේපළ ඔහුට හෝ වෙනත් යම් තැනැත්තකුට, අයුතු ලැබීමක් ; හෝ

(ආ) මුදල් සමාගමට අයුතු පාඩුවක්.

සලස්වා ඇති බව, මණ්ඩලයේ මතය වන්නේ නම්, මේ පනත යටතේ හෝ වෙනත් නීතියක් යටතේ යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබ ඇත්තේ වුවද, එසේ අයුතු ලෙස ලැබූ හෝ අයුතු ලෙස පාඩු සිදු වීමට සැලැස් වූ  මුදල් හේ දේපල. මණ්ඩලය විසින් දේපල, මණ්ඩලය විසින් යෝග්‍ය යයි නිශ්චය කරනු ලැබිය හැකි අනුපාතිකයක් යටතේ පොලිය සමග මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාල සීමාවක් තුළ ආපසු ගෙවීමට, ආපසු ලබාදීමට හෝ ඒ වෙනුවෙන් මුදල් සාමාගමට අලාභ ගෙවීමට ඒ අධ්‍යක්ෂවරයාට ප්‍රධාන විධායක නිලධාරියාට, කළමනාකරුට, සේවානියුක්තයාට, අනුයෝජිතයාට, කොන්ත්‍රාත්කරුට, හෝ (අ) ඡේදයේ සඳහන් කරන ලද ඒ වෙනත් තැනැත්තාට මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකිය.

(2) මේ වගන්තිය (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු, ඒ උපවගන්තියේ සඳහන් කර ඇති මුදල් හෝ දේපල මුදල් සමාගමට

ආපසු ගෙවීමට. ආපසු ලබාදීමට හෝ ඒ වෙනුවෙන් අලාභ ගෙවීමට පැහැර හරින අවස්ථාවක. මණ්ඩලය විසින් —

(අ) පහත දැක්වෙන ආකාරයේ වූ යම් මුදල් දේපළ හෝ වෙනත් වත්කම්වල වටිනාකම, ස්වභාවය සහ ඒවා තිබෙන ස්ථානය මණ්ඩලය විසින් බලය දෙන ලද නිලධාරියකුට නිශ්චිත කාලසීමාවක් ඇතුළත අනාවරණය කරන ලෙස ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය හැකි ය ;

(i) ඒ තැනැත්තාට අයිති යම් මුදල්, දේපළ හෝ වෙනත් වත්කම්; හෝ

(ii) ඒ තැනැත්තාට අර්ථදායි සම්බන්ධතාවයක් ඇති යම් මුදල්, දේපල හේ වෙනත් වත්කම් ; හෝ

(iii) යම් කිසි නිශ්චිත දිනයක් වන විට හෝ නිශ්චිත කාලසීමාවක් තුල කවරාකාරයෙන් හෝ බැහැර කරන ලද දේපළ සහ අනෙකුත් වත්කම් ද ඇතුළුව, ඒ තැනැත්තා සඳහා භාරයක් වශයෙන් ඒ තැනැත්තාගේ ඥාතියකු විසින් හෝ වෙනත් තැනැත්තකු විසින් අත්කර ගත් හෝ මිලදී ගත් හෝ දරනු ලබන හෝ සතුව ඇති හෝ යම් මුදල් දේපල හෝ වෙනත් වත්කම්,

(ආ) කවර වේලාවක හෝ මණ්ඩලය විසින් නිශ්චය වශයෙන් සඳහන් කරන වේලාවක, ඒ තැනැත්තගේ අයිතිය හෝ සන්තකයේ තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ සඳහන් කර දක්වන්නා වූ ද එසේ සඳහන් කර ඇති එක් එක් දේපල අත්කර ගත් දිනය සහ එසේ අත්කර ගැනීම සිදු වූයේ, මිලදී ගැනීමෙන්, තෑගි දීමකින්, අන්තිම කැමැත්ත මගින් ප්‍රදානයකින්, උරුම වීමෙන් හෝ වෙනත් ආකරයකින් ද යන වග නිශ්චිතව සඳහන් කරන්නා වූ දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය ;

(ඇ) පහත දැක්වෙන පරිදි වූ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකිය ;

(i) සපයන තොරතුරු මුදල් සමාගම් කටයුතු පිළිබඳ විමර්ශනයට උපකාරී වෙතැයි විශ්වාස කිරීමට මණ්ඩලයට සාධාරණ හේතු ඇති අවස්ථාවක, යම් වේලාවක හෝ මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබන වේලාවක හෝ ඒ තැනැත්තාගේ අයිතයේ හේ සන්තකයේ තිබූ සියලු චංචල හෝ නිශ්චල දේපළ සඳහන් කර දක්වන්නා වූ දිවුරුම් ප්‍රකාශයක්,

(ii) ඒ විමර්ශනයේ දී අදාළ වෙතැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලැබන වෙනත් කාරණා පිළිබඳ පිළිබඳ විස්තර අඩංගු දිවුරුම් ප්‍රකාශයක්;

(ඇ) එම තැනැත්තාගේ ගිණුමට අදාළ සටහන් අඩංගු ඒ බැංකුවේ යම් පොතක්, ලේඛනයක්, හෝ චෙක්පතක් හෝ ඒ මුදල් සමාගමේ යම් පොතක්, ලේඛනයක් හෝ සහතිකයක්, දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස හෝ නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි, ඒ සටහන්වල සහතික පිටපත් සපයන ලෙස අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ යම් බැංකුවක හෝ යම් මුදල් සමාගමක ප්‍රධාන විධායක නිලධාරියාට, නියම කරනු ලැබිය හැකිය ;

මෙම ඡේදයේ කාර්ය සඳහා “ලේඛනය” යන්නට යම් ආරක්ෂා තැන්පත් පෙට්ටියක් පිළිබඳ විස්තර ද ඇතුළත් විය යුතු ය.

(ඉ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනි කවර විධිවිධාන තිබුණ ද ඒ තැනැත්තාගේ කටයුතු සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ලබා ගත හැකි සියලු තොරතුරු දැන්වීමේ නිශ්චිතව සඳහන් පරිදි සපයන ලෙස ද, කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ හෝ ඇත්තා වූ ද ඒ තැනැත්තාට අදාළ වන්නා වූ ද යම් ලෙඛනයක් හෝ යම් ලේඛනයක සහතික කළ පිටපතක් දැන්වීමේ නිශ්චිතව සඳහන් පරිදි ඉදිරිපත් කරන හෝ සපයන ලෙස ද කොමසාරිස් ජනරාල්වරයාට නියම කරනු ලැබිය හැකි ය ;

(ඊ) මේ උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර ඉල්ලා සිටි යම් තොරතුරු මණ්ඩලය විසින් බලය දෙන ලද තැනැත්තකුට සපයන ලෙසට කවර හෝ ක්‍රමකින් මහජනයාට ආරාධනය කරනු ලැබිය හැකිය;

(ඩ) මණ්ඩලය විසින් නිශ්චය කරන මුදල් ප්‍රමාණයක් දක්වා, තනිව හෝ ඒකාබද්ධව දරන ඒ තැනැත්තගේ ගිණුම් සහ ආරක්ෂක තැන්පත් පෙට්ටි ක්‍රියාවිරහිත  කරන ලෙස යම් බැංකුවක හෝ මුදල් සමාගමක ප්‍රධාන විධායක නිලධාරියාට දැන්වීමක් භාර දෙනු ලැබිය හැකි ය;

මේ ඡේදය යටතේ නිකුත් කරන සෑම දැන්වීමක්ම, ඒ දැන්වීමේ නිශ්චය කර ඇති, දින අනූවක් නොඉක්මවන කාලයක් තුළ, බලාත්මක විය යුතු අතර, මේ ඡේදය යටතේ නිකුත් කළ දැන්වීමක් බලාත්මක පවතින කාලය තුල දැන්වීම උල්ලංඝනය කරමින් සිදුකරන යම් මුදල් අරමුදල් මාරු කිරීමක් ශූන්‍ය සහ බල රහිත විය යුතු ය ;

(ඪ) දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් දේපළවල හෝ වත්කම්වල සන්තකය අයිතිය හෝ එහි යම් සම්බන්ධතාවයක් (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ එම පළමුව සඳහන් තැනැත්තා වෙනුවෙන් භාරයක් වශයෙන් දේපළ හෝ වත්කම් දරන නෑදෑයකු හෝ වෙනත් තැනැත්තකු විසින් හෝ මුදල් සමාගමක අරමුදල්වලට ආරෝපණය කළ හැකි මුදල් අයෝග්‍ය භාවිතා කිරීමෙන් හෝ අනිසි ලෙස යොදා ගැනීමකින් මිලට ගත් හෝ අත්පත් කරගත් දේපළ හෝ වත්කම් දරන වෙනත් යම් තැනැත්තකු විසින් දේපළවල හෝ වත්කම් දරන වෙනත් යම් තැනැත්තකු විසින් දේපළවල හෝ වෙනත් වත්කම්වල සන්තකය හිමිකම හෝ යම් සම්බන්ධතාවයක් පැවරීම, තහනම් කෙරෙන දැන්වීමක් ඒ තැනැත්තාට, ඒ තැනැත්තාගේ නෑදෑයාට හෝ වෙනත් තැනැත්තාට භාර දෙනු ලැබිය හැකිය. 0 තව ද එම දැන්වීමෙන්,

(i) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට ඒ දේපළවල හිමිකමට සම්බන්ධ ඔප්පුවල පිටපත්;

(ii) මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට ඒ මෝටර් වාහනය සම්බන්ධයෙන් මෝටර් රථ වාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්;  සහ

(iii) මෝටර් වාහන හැර වෙනත් චංචල දේපළ සම්බන්ධයෙන් හිමිකමට සාක්ෂි වශයෙන් වූ ලේඛනවල පිටපත්,

අධ්‍යක්ෂවරයාට භාර දෙන ලෙස ද ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

මේ ඡේදය යටතේ නිකුත් කරන සෑම දැන්වීමක්ම, ඒ දැන්වීමේ නිශ්චය කර ඇති, දින අනූවක් නොඉක්මවන කාලයක් තුළ බලාත්මක විය යුතු අතර, මේ ඡේදය යටතේ නිකුත් කළ දැන්වීමක් බලාත්මකව පවතින කාලය තුළ දැන්වීම උල්ලංඝනය කරමින් ඒ දැන්වීමේ සඳහන් කර ඇති යම් දේපළක හෝ වත්කමක හිමිකම, සන්තකය හෝ වෙනත් සම්බන්ධතාවයක් පැවරීම ශූන්‍ය සහ බල රහිත විය යුතු ය.

(එ) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ විට ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා, මෝටර් වාහන සම්බන්ධයෙන් වූ විට මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා, යම් සමාගමක කොටස්, ස්කන්ධ සහ ණයකර සම්බන්ධයෙන් වූ විට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ අදාළ මුදල් සමාගමේ ලේකම්වරයා සහ අදාළ වන අවස්ථාවන්හි දී, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලත් කොටස් හුවමාරුවක අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ රජයේ සුරැකුම්පත් සම්බන්ධයෙන් වන විට (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ව්‍යාපාර වස්තු සහ සුරැකුම් පත් ආඥා පනත සහ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත ප්‍රකාර පත් කළ ප්‍රාථමික වෙළෙඳුන් ඇතුළු අදාළ බලධරයකු වෙත, (ඍ) ඡේදයේ සඳහන් වන දැන්වීමේ පිටපතක් භාර දෙනු ලැබිය හැකි ය ;

(ඒ) මේ උප වගන්තියේ (එ) වන ඡේදයේ සඳහන් දැන්වීමක පිටපතක් භාර දෙනු ලැබූ යම් බලධරයකුට ඒ දැන්වීම ඒ බලධරයාගේ භාරයේ ඇති නිසි පොත්වල හෝ ලේඛනවල ලියාපදිංචි කරන ලෙසට නියම කළ හැකි ය. දැන්වීමක් බලාත්මකව පවතින කාලපරිච්ඡේදයේදී ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා, මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා සහ

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සහ (එ) ඡේදයේ සඳහන් දැන්වීමක පිටපතක් භාර දෙනු ලැබූ වෙනත් අදාළ බලධරයකු, ඒ දැන්වීමේ සඳහන් කර ඇති දේපළ හෝ වත්කම්වලට සම්බන්ධ යම් ඔප්පුවක්, පැවරුම් සාධන පත්‍රයක් හෝ වෙනත් හිමිකම් ලේඛනයක් ලියාපදිංචි නොකළ යුතු ය ;

(ඔ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කළ යම් තැනැත්තකු හෝ ඔහුගේ ඥාතියකුගේ යම් දේපළක් හෝ වත්කමක් සම්බන්ධයෙන්, (ඈ) ඡේදයේ සහ (එ) ඡේදයේ සඳහන් කළ යම් තැනැත්තකුගේ හෝ බලධරයකුගේ සන්තකයේ හෝ භාරයේ ඇති යම් තොරතුරක් සපයන ලෙස ඒ තැනැත්තාට හෝ බලධරයාට නියම කරනු ලැබිය හැකි ය ;

(ඕ) (i) (උ) සහ (ඌ) ඡේද යටතේ භාර දෙන ලද දැන්වීමක් වලංගුව පවතින කාලපරිච්ඡේදය ඉකුත් වීමට ප්‍රථම ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් දේපළක් තහනමට ගැනීමට හා විකිණීමට බලය පවරන ආඥාවක් සහ ඒ දේපළ තහනමට ගැනීම හා විකිණීම සඳහා වූ ක්‍රියාවෙහි යෙදවීමේ රිට් ආඥාවක් සඳහා ලඝු කාර්ය පටිපාටිය අනුව වූ ඉල්ලීමක් අධ්‍යක්ෂවරයා විසින් එම දේපළ පිහිටි දිස්ත්‍රික්කයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය ;

(ii) මේ ඡේදයේ (i) වන අනුඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත ඉල්ලීමක් කරනු ලැබීමෙන් පසුව සහ (1) වන උපවගන්තියෙහි සඳහන් ආදී හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු ප්‍රධාන විධායක නිලධරයකු, කළමනාකරුවකු, සේවානියුක්තයකු, අනුයෝජිතයකු හෝ කොන්ත්‍රාත්කරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් යම් ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින්, සමාගමට අයිති යම් මුදලක් හෝ දේපළක් තමාට හෝ වෙනත් යම් තැනැත්තකුට අයුතු ලෙස ලැබීමක් හෝ මුදල් සමාගමට අයුතු පාඩුවක් සලස්වා ඇති බවට දිසා අධිකරණය සෑහීමකට පත් වන්නේ නම්, දිසා අධිකරණය විසින් යම් බැංකුවක හෝ මුදල්

සමාගමක ප්‍රධාන විධායක නිලධාරියාට, ඒ තැනැත්තා විසින් තනිව හෝ ඒකාබද්ධව දරන ගිණුම්වල ඇති මුදල්වලින් (උ) ඡේදය යටතේ නිකුත් කරන ලද දැන්වීම්වල මණ්ඩලය විසින් සඳහන් කර ඇති මුදල් ප්‍රමාණය, දිසා අධිකරණයේ තැන්පත් කිරීමට නියම කළ යුතු අතර, දිසා අධිකරණය විසින්, තැන්පතු තහනමට ගැනීමට බලය දෙන සහ නියම කරන, ක්‍රියාවේ යෙදවීමේ රිට් බලපත්‍රයක් පිස්කල්වරයාට නිකුත් කිරීමට විධාන කළ යුතු ය.

(iii) මේ ඡේදයේ (i) වන අනුඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත ඉල්ලීමක් කරනු ලැබීමෙන් පසුව සහ (1) වන උපවගන්තියේ සඳහන් ආදි හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු, කළමනාකරුවකු සේවා නියුක්තයකු, අනුයෝජිතයකු හෝ කොන්ත්‍රාත්කරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් යම් ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින්, සමාගමට අයත් යම් මුදලක් හෝ දේපළක් තමාට හෝ වෙනත් යම් තැනැත්තකුට අයුතු ලෙස ලැබීමක් හෝ මුදල් සමාගමට අයුතු පාඩුවක් සලස්වා ඇති බවට දිසා අධිකරණය සෑහීමට පත්වන්නේ නම්,

(අ) මුදල් සමාගමේ ඒ අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායක නිලධරයාට, කළමනාකරුට, සේවානියුක්තයාට, අනුයෝජිතයාට හෝ කොන්ත්‍රාත්කරුවාට හෝ එසේ අයුතු ලෙස ලැබීමක් ලද වෙනත් තැනැත්තකුට හෝ තැනැත්තන්ට අයත් යම් දේපලක් සහ වත්කම් ; හෝ

(ආ) මුදල් සමාගමේ ඒ අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක නිලධරයා, කළමනාකරු, සේවා නියුක්තයා, අනුයෝජිතයා හෝ කොන්ත්‍රාත්කරු වෙනුවෙන් ඥාතියකු හෝ වෙනත් තැනැත්තකු විසින් භාරයක් වශයෙන් දරනු ලබන යම් දේපළක් හෝ වත්කම් ; හෝ

(ඇ) මුදල් සමාගමේ වත්කම්වලට ආරෝපණය කළ හැකි මුදල්වලින් අත්කර ගනු ලැබූ හෝ මිලට ගනු ලැබූ යම් දේපලක් හෝ වත්කම්

තහනමට ගෙන විකිණීමට පිස්කල්වරයාට බලය දෙන සහ නියම කරන ක්‍රියාවේ යෙදවීමේ රිට් බලපත්‍රයක් පිස්කල්වරයාට නිකුත් කිරීමට විධාන කළ යුතු ය.

(iv) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 217 සිට 297 දක්වා වූ වගන්තිවල විධිවිධාන මේ ඡේදයේ (i) වන සහ (iii) වන අනුඡේද යටතේ නිකුත් කරන ලද ක්‍රියාවේ යෙදවීමේ රිට් බලපත්‍රයක් යටතේ දේපලක් තහනමට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස්කම් සහිතව, අදාළ විය යුතු ය.

(v) මේ ඡේදය යටතේ යම් දේපලක් තහනමට ගෙන විකිණීමෙන් ලබාගත් යම් මුදලක් අධිකරණය විසින්—

(අ) පළමුවෙන්, ඒ දේපළ තහනමට ගැනීම, තබා ගැනීම සහ විකිණීම සඳහා වූ වියදම් සහ ගාස්තු ගෙවීම සඳහා ද ;

(ආ) දෙවනුව, මුදල් සමාගමට ආරෝපණය කළ හැකි බවට අධිකරණය විසින් තීරණය කරන ලද, මේ ඡේදයේ (ii) වන අනුඡේදයේ සඳහන් මුදල සඳහා ද ;

යෙදවිය යුතු අතර, ඉතිරිය තහනමට ගත් දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතු ය.

(vi) මේ ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ යම් මුදලක් තහනමට ගනු ලබන අවස්ථාවක, එය මේ ඡේදය (ii) වන අනුඡේදයේ සඳහන් වන, මුදල් සමාගමට ආරෝපණය කරනු ලැබිය හැකි බවට අධිකරණය විසින් තීරණය කරන ලද මුදල් ප්‍රමාණය ගෙවීම සඳහා අධිකරණය විසින් යෙදවිය යුතු අතර, ඉතිරිය, ඒ මුදල් ලැබිය යුතු තැනැත්තාට ආපසු ගෙවිය යුතු ය.

(3) මුදල් සමාගමක යම් ආදි හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු ලේකම්වරයකු, ප්‍රධාන විධායක නිලධරයකු, කළමනාකරුවකු, සේවානියුක්තයකු, අනුයෝජිතයකු හෝ කොන්ත්‍රාත්කරුවකු ක්‍රියාවකින් හෝ යම් නොකර හැරීමකින්—

(අ) ඔහුට හෝ වෙනත් යම් තැනැත්තකුට, ඒ මුදල් සමාගමට අයිති මුදල් හෝ දේපල අයුතු ලෙස ලැබීමක් ; හෝ

(ආ) මුදල් සමාගමට අයුතු පාඩුවක්,

සලස්වා ඇත්නම්, ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු වේ.

මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු ලේකම්වරයකු, ප්‍රධාන විධායක නිලධරයකු, කළමනාකරුවකු, නිලධාරියකු, සේවානියුක්තයකු, විගණකවරයකු විසින් කරනු ලබන වැරදි.

**52.** (1) මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු, ප්‍රධාන විධායක නිලධරයකු, කළමනාකරුවකු, නිලධාරියකු සේවානියුක්තයකු හෝ විගණකවරයකු වන යම් තැනැත්තකු විසින්—

(අ) මුදල් සමාගම විසින් මේ පනතේ නියම අනුව කටයුතු කරන බව සුරක්ෂිත කිරීම සඳහා සියලු සාධාරණ පියවර ගැනීම පැහැර හරිනු ලැබුවහොත් ;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයකට හෝ සාදන ලද යම් රීතියකට හෝ අනුව කටයුතු කිරීම පැහැර හරිනු ලැබුවහොත් ;

(ඇ) මේ පනත යටතේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද විධානයකට හෝ කරන ලද නියමයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබුවහොත් ;

(ඈ) මේ පනතේ විධිවිධාන යටතේ ඒ මුදල් සමාගම ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය සුරක්ෂිත කිරීමට සියලු සාධාරණ පියවර ගැනීම පැහැර හරිනු ලැබුවහොත් ;

(ඉ) ඒ මුදල් සමාගමේ ව්‍යාපාර කටයුතුවලට, ගණුදෙනුවලට, කොන්දේසිවලට, වත්කම් හෝ බැරකම්වලට හෝ ගිණුම්වලට සම්බන්ධ යම් පොතක, වාර්තාවක, ලිපිගොනුවක, රෙජිස්ටරයක හෝ එවැනි යම් වෙනත් ලේඛනයක හෝ ප්‍රකාශයක ව්‍යාජ සටහනක් කළහොත් හෝ එවැනි සටහනක් කිරීමට සැලැස්වුවහොත් ;

(ඊ) ඒ මුදල් සමාගමේ ව්‍යාපාර කටයුතුවලට, ගනුදෙනුවලට, කොන්දේසිවලට, වත්කම් හෝ බැරකම්වලට හෝ ගිණුම්වලට සම්බන්ධ යම් පොතක, වාර්තාවක, ලිපි ගොනුවක, රෙජිස්ටරයක හෝ එවැනි යම් වෙනත් ලේඛනයක හෝ ප්‍රකාශයක සටහනක් කිරීම අත්හැරිය හොත් හෝ එවැනි යම් සටහනක් අත්හැරීමට සැලැස්වුවහොත් ;

(උ) ඒ මුදල් සමාගමේ ව්‍යාපාර කටයුතුවලට, ගනුදෙනුවලට, කොන්දේසිවලට, වත්කම් හෝ බැරකම්වලට හෝ ගිණුම්වලට සම්බන්ධ යම් පොතක, වාර්තාවක, ලිපි ගොනුවක, රෙජිස්ටරයක හෝ එවැනි යම් වෙනත් ලේඛනයක හෝ ප්‍රකාශයක වූ යම් සටහනක් වෙනස් කළහොත්, වෙන් කළහොත්, සැඟවුවහොත්, මකා දැමුවහොත් හෝ විනාශ කළහොත් හෝ එවැනි යම් සටහනක් වෙනස් කිරීමට, වෙන් කිරීමට, සැඟවීමට, මකා දැමීමට හෝ විනාශ කිරීමට සැලැස්වුවහොත් ; හෝ

(ඌ) ඒ මුදල් සමාගමේ සත්‍ය තත්ත්වය සැඟවීමේ අරමුණෙන් පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර හෝ එවැනි යම් වෙනත් ලේඛනවල බහුවිධ කට්ටල පවත්වාගෙන ගියහොත්,

ඒ තැනැත්තා මේ පනත් යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ තැනැත්තකුට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී, මේ පනතේ නියම ඉටු කිරීම සුරක්ෂිත කිරීමේ කාර්ය හෝ ප්‍රශ්නයට අදාළ ප්‍රකාශ නිවැරදි බවට සහතික වීමේ කාර්ය වෙනත් තැනැත්තකුට භාර වූ බවට විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු තිබෙන බවත් ඒ තැනැත්තා ඒ කාර්ය ඉටුකිරීමට සුදුසුකම් ඇත්තකු බව සහ ඒ කාර්ය ඉටුකිරීමට හැකි තත්ත්වයක සිටි බවත ඔප්පු කිරීම විත්තිවාචකයක් විය යුතු ය.

**53.** (1) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වූ වරක් සිදුකරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා වරදකට වරදකරු වන්නේ ය. තැනැත්තන් මණ්ඩලයක් විසින් කරන ලද වැරදි.

(2) යම් තැනැත්තකු මේ පනත යටතේ යම් වරදක් කර ඇති විට ඒ තැනැත්තා—

(අ) සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකරුවකු ම හෝ ලේකම්වරයකු ම ;

(ආ) ව්‍යාපාර ආයතනයක් නම් ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම ; සහ

(ඇ) ව්‍යාපාර ආයතනයක් නොවන සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම් ඒ මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකු ම,

ඒ වරදට වරදකරු වන්නේ ය.

එසේ වුව ද, වරද සිදුකර ඇත්තේ තමාගේ දැනුවත්කමක් නොමැතිව බව ද ඒ වරද සිදු කිරීම වළක්වාලීමට තමා විසින් සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව ද ඔප්පු කළහොත් එවැනි තැනැත්තකු වරදකට වරදකරු යයි සලකනු නොලැබිය යුතු ය.

මේ පනත යටතේ කළ ඉල්ලීම විභාග කිරීම සහ තීරණ කිරීම.

**54.** මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ මහාධිකරණයක හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු කටයුතු පවරා ඇති අවස්ථාවක, එවැනි නඩු අවසන් කිරීමට අධිකරණය විසින් ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.

වරදක් කිරීමට අනුබල දීම වරදකි.

**55.** මෙම පනත යටතේ වරදක් කිරීමට අනුබල දෙන, කුමන්ත්‍රණය කරන හෝ තැත් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මේ පනත යටතේ මූලික වරදට දඬුවම් කරන ආකාරයට ඔහු දඬුවම් ලැබිය යුතු ය.

දණ්ඩන.

**56.** (1) මේ පනතේ 2 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහාධිකරණයක් ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහකට නොවැඩි වූ කාලසීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන පහකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම සහ අධිකරණයේ අධීක්ෂණය යටතේ තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ඒ තැනැත්තාගේ ඇති බැරකම් පියවීමට යටත් විය යුතු ය :

එසේ වුව ද, 53 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වීමෙන්, 2 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, අදාළ සංස්ථාගත මණ්ඩලයේ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයේ හෝ බැරකම්, අධිකරණය විසින් විධාන කරන ආකාරයකට සහ ප්‍රමාණයකට ගෙවිය යුතු ය.

එසේ ම තවදුරටත්, අධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාගේ හෝ අදාළ සංස්ථාගත මණ්ඩලයේ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයේ ණයගැතියන්ට, අධිකරණය විසින් විධාන කරන ආකාරයට සහ කාලයක් තුළ ඔවුන් ගත් ණය ආපසු ගෙවන ලෙස නියෝග කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ 5 වන වගන්තියේ (9) වන උපවගන්තිය, 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 24 වන වගන්තියේ (4) වන උපවගන්තිය, 31 වන වගන්තියේ (2) වන සහ (7) වන උපවගන්ති, 42 වන වගන්තියේ (11) වන උපවගන්තිය, 51 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 52 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් මිලියන තුනකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) මේ පනතේ 21 වන වගන්තියේ (2) උපවගන්තිය සහ 50 වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් මිලියනයකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් ඒක ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන ලද යම් රීතියක්, විධානයක්, නියෝගයක් හෝ නියමයක් උල්ලංඝනය කරන්නා වූ හෝ ඉටුකිරීම පැහැර හරින්නා වූ සෑම තැනැත්තකු ම ඒ උල්ලංඝනය කිරීම හෝ පැහැර හැරීම (1) වන (2)

වන හා (3) වන උපවගන්ති ප්‍රකාරව වරදක් සංයුක්ත කරන අවස්ථාවක හැර මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් එක් මිලියනයකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

දඩ මුදල් ගෙවීම සඳහා අරමුදල් භාවිත කිරීම.

**57.** (1) දඩයක් ගෙවීමට සංස්ථාගත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක හවුල්කරුවකු හෝ සාමාජිකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සංස්ථාගත මණ්ඩලයේ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයේ යම් අරමුදලක් ඒ දඩය හෝ එහි කොටසක් හෝ ගෙවීමට යොදා ගතහොත්, ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වරදක් කරන තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් එක් මිලියනයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලසීමාවකට දෙයාකාරයෙන් ඒක ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම සහ ඒ සංස්ථාගත මණ්ඩලයට හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයට, දඩය ගෙවීම සඳහා ඒ සංස්ථාගත මණ්ඩලයෙන් හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයෙන් ඔහු ප්‍රයෝජනයට ගත් මුදල් ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයක් ආපසු ලබා දීමට යටත් විය යුතු ය.

ඇතැම් නියමයන්ගෙන් කරනු ලබන අභියාචනා සඳහා විධිවිධාන.

**58.** (1) 5 වන වගන්තිය හෝ 12 වන වගන්තිය හෝ 25 වන වගන්තියේ (2) වන උපවගන්තිය හෝ 31 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (6) වන උපවගන්තිය හෝ 34 වන වගන්තිය හෝ 36 වන වගන්තිය හෝ 37 වන වගන්තිය හෝ 42 වන වගන්තිය හෝ 51 වන වගන්තිය යටතේ කරන ලද්දා වූ හෝ කරන ලද්දේ යයි අදහස් කරන ලද්දා වූ නිශ්චය කිරීමකින්, තීරණයකින්, විධානයකින් හෝ නියම කිරීමකින් අතෘප්තියට පත් වූ කිසිම තැනැත්තකුට හෝ ඒ වගන්තිවලින් යම් වගන්තියක් යටතේ ගන්නා ලද හෝ ගැනීමට යෝජනා කරන්නා වූ හෝ අදහස් කරන්නා වූ යම් ක්‍රියාවකින් හෝ පියවරකින් තමාට බලපෑමක් ඇති වේ යයි වටහා ගන්නා වූ තැනැත්තකුට, ස්ථිර හෝ අතුරු ඉන්ජන්ෂන් තහනමකට, වාරණ නියෝගයකට, නැවැත්වීමේ ආඥාවකට හෝ මණ්ඩලය විසින් ඒ නියමය බලාත්මක කිරීමෙන් මණ්ඩලය නවත්වාලීමේ, වළක්වාලීමේ හෝ අවහිර කිරීමේ බලපෑම් ඇති වෙනත් යම් ආඥාවකට හිමිකම් නොලැබිය යුතු ය.

(2) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාවෙන් අභියාචනාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලය (1) වන උපවගන්තියේ සඳහන් කළ වගන්ති යටතේ කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් නිශ්චය කිරීමකට, තීරණයකට, විධානයකට හෝ නියම කිරීමකට අදාළව, අභියාචනාධිකරණය විසින් නොව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(ආ) මේ වගන්තිය (අ) ඡේදයේ සඳහන් කරන ලද අධිකරණ බලය අයැද සිටින සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීම වෙනුවෙන් හෝ ඒ ඉල්ලීමට අදාළ වූ හෝ ක්‍රියාව සිදු කිරීමේ දිනයේ සිට එක් මාසයක් ඇතුළත කරනු ලැබිය යුතු අතර, ඒ ඉල්ලීම ගොනු කිරීමෙන් මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ ඉල්ලීම විභාග කොට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු ය.

(3) මේ වගන්තිය (1) වන උපවගන්තියෙහි ඇතුළත් වන කිසිවකින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීත්‍යානුකූලව අන්‍යාකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි බලතලවලට හෝ (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී හෝ බලපෑමක් සිදු නොවිය යුතු ය.

(4) මේ වගන්තියේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී, මණ්ඩලයට විරුද්ධව යම් අතුරු ආඥාවක් හෝ අවසාන ආඥාවක් කිරීමට ප්‍රථම, මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දිය යුතු ය.

## IX වන කොටස

### සාමාන්‍ය

**59.** (1) මූල්‍ය කරුණු පිළිබඳ ජනතාවගේ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුදල නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. අරමුදල.

(2) මේ පනත යටතේ ලැබෙන සියලු දඩ මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර අරමුදලේ බැරට ඇති මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන කාර්ය සඳහා සහ එවැනි ආකාරයකට භාවිත කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී මහ බැංකුවේ තැන්පත්කරුවන්ගේ සහන අරමුදලේ බැරට ඇති සියලු මුදල් මේ අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය.

නියෝජනය කිරීමට බලය දීම සහ බලය පැවරීම.

**60.** (1) තත් කාර්ය සඳහා මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි රීති ඇත්නම්, ඒ රීතිවලට යටත්ව හා ඒවාට අනුකූලව, මේ පනතේ යම් කාර්යක් සඳහා මණ්ඩලය නියෝජනය කිරීම පිණිස මහ බැංකුවේ යම් නිලධාරියකුට මණ්ඩලය විසින් ලිඛිතව බලය පවරා දෙනු ලැබිය හැකි වුව ද, ඒ නිලධාරියා විසින් එසේ පවරන ලද බලය යටතේ මණ්ඩලය නියෝජනය කිරීමේ දී කරන ලද හෝ අත්හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සඳහා වගකීම මණ්ඩලය වෙත රැඳිය යුතු අතර එසේ දිගටම රැඳී පැවතිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, මේ පනත යටතේ එයට ඇති ඕනෑම බලයක් මහ බැංකුවේ යම් නිලධාරියකුට ලිඛිතව පවරා දෙනු ලැබිය හැකි වුව ද, ඒ නිලධාරියා විසින් ඔහුට පවරන ලද ඒ බලය ක්‍රියාත්මක කිරීමේ දී කරන ලද හෝ අත්හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සඳහා වගකීම මණ්ඩලය වෙත රැඳිය යුතු අතර එසේ දිගටම රැඳී පැවතිය යුතු ය.

රහස්‍යතාවය පවත්වාගෙන යාම.

**61.** (1) යම් මුදල් සමාගමක හා 38 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය පරිදි බලය දෙන ලද යම් සංස්ථාගත මණ්ඩලයක සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකුම, නිලධාරියකුම, සේවානියුක්තයකුම සහ අනුයෝජිතයකුම මුදල් සමාගමේ සියලු ගනුදෙනු, එහි ගනුදෙනුකරුවන් සහ යම් තැනැත්තකුගේ ගිණුම් පිළිබඳ තත්ත්වය හා එයට සම්බන්ධ සියලු කරුණු සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යතාවය පවත්වාගත යුතු අතර එබඳු යම් කරුණක්—

(අ) හෙළිදරව් කරන ලෙස අධිකරණයක් හෝ ඒ කරුණට අදාළ තැනැත්තා විසින් ඉල්ලූ අවස්ථාවක දී, ඒ අධ්‍යක්ෂවරයාගේ, කළමනාකරුවාගේ, නිලධාරියාගේ, සේවානියුක්තයාගේ හෝ අනුයෝජිතයාගේ කාර්යන් ඉටු කිරීමේ දී ; හෝ

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයකට අනුකූලව කටයුතු කිරීම සඳහා

හැර හෙළිදරව් නොකළයුතු ය.

(2) යම් මුදල් සමාගමක හා 38 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාර බලය දෙන ලද යම් සංස්ථාගත මණ්ඩලයක සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකුම, නිලධරයකුම, සේවානියුක්තයකුම සහ අනුයෝජිතයකුම (1) උපවගන්තියට අනුව පූර්ණ රහස්‍යතාවය පවත්වා ගන්නා බවට ප්‍රතිඥාවක් දෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු ය.

(3) මූල්‍ය කර්මාන්තයේ චාරිත්‍රානුකූල පරිචයන් අනුව, වෙනත් මුදල් සමාගමක් ඉල්ලීමක් කළ විට, ගනුදෙනුකරුවකු පිළිබඳව මතයක් හෝ නිර්දේශයක් සද්භාවයෙන් සැපයීම මුදල් සමාගමකට තහනම් කිරීමත්, (1) වන සහ (2) වන උපවගන්තීන්හි විධිවිධාන මගින් නොවිය යුතු ය.

අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර පවත්වාගෙන යන බව හෝ තැන්පතු භාරගන්නා බව මුදල් සමාගම් හෝ බැංකු විසින් අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු බව.

**62.** මේ පනතේ 61 වන වගන්තියේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ 77 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව වූ යම් මූල්‍ය සමාගමක හෝ බැංකුවක සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකුම, නිලධාරියකුම, සේවා නියුක්තයකුම සහ අනුයෝජිතයකුම, මේ පනතේ 2 වන වගන්තිය කඩකරමින් මුදල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවට හෝ මහජනතාවගෙන් තැන්පතු භාර ගන්නා බවට තමාට සාධාරණ සැකයක් ඇත්තේ ඒ මූල්‍ය සමාගමේ හෝ බැංකුවේ යම් ගනුදෙනුකරුවකු සම්බන්ධයෙන් ද ඒ ගනුදෙනුකරු පිළිබඳව අධ්‍යක්ෂවරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්, අධ්‍යක්ෂවරයා, බලයලත් නිලධරයන් රජයේ සේවකයන් ලෙස සළකනු ලැබිය යුතු බව.

**63.** මණ්ඩලයේ සෑම සාමාජිකයකුම, අධ්‍යක්ෂවරයා සහ මේ පනත යටතේ මණ්ඩලය විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද යම් නිලධරයකු (19 වන අධිකාරිය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂවරයා, බලයලත් නිලධරයන් රජයේ නිලධරයන් ලෙස සළකනු ලැබිය යුතු බව.

**64.** මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්ය සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ අර්ථානුකූලව අධ්‍යක්ෂවරයා හෝ යම් බලයලත් නිලධරයෙක් රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, මේ පනතේ 2 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් අපරාධ නඩු පැවරීම පිළිබඳව සළකා බැලීම පිණිස මණ්ඩලය විසින් නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

වැරදි සංඥෙය සහ ඇප දිය හැකි වැරදි විය යුතු බව.

**65.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ සෑම වරදක්ම එකී සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා සංඥෙය සහ ඇප දිය හැකි වරදක් විය යුතු ය.

නඩු පැවරීම සඳහා පූර්ව කොන්දේසි.

**66.** (1) මේ පනත යටතේ හෝ ඒ යටතේ කරන ලද හෝ පනවන ලද යම් විධානයක්, හෝ නියමයක් හෝ නියම කිරීමක් යටතේ සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි අදහස් කරනු ලබන හෝ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් මණ්ඩලයට, එහි යම් සාමාජිකයකුට හෝ අධ්‍යක්ෂවරයාට හෝ මහ බැංකුවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ මේ පනතේ විධිවිධාන යටතේ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකුට එරෙහිව අපරාධ නඩුවක් යම් අධිකරණයක පැවරීම, එසේ අපරාධ නඩුවක් පැවරීම සඳහා නීතිපතිවරයාගේ පූර්ව ලිඛිත අවසරය ලබා ඇත්නම් මිස නොකළ යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයකු අධ්‍යක්ෂවරයා හෝ මහ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ හෝ ඒ යටතේ කරන ලද හෝ පනවන ලද යම් විධානයක්, නියමයක් හෝ නියම කිරීමක් යටතේ සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි අදහස් කරනු ලබන හෝ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට ඒ තැනැත්තාට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එකී ක්‍රියාව සිදු කළේ සද්භාවයෙන් බවට අධිකරණය තීරණය කළහොත් සහ එකී මුදල එකී සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කර ගනු ලැබුවහොත් මිස, මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු ය.

මණ්ඩලය විසින් තාවකාලික මුදල් පහසුකම් හා ඇප සැපයීම.

**67.** (1) යම් මුදල් සමාගමකට තාවකාලික මූල්‍ය පහසුකම් සලසා දීම තැන්පත්කරුවන්ගේ යහපත සඳහා හේතු වේ යැයි, අධ්‍යක්ෂවරයා විසින්ම හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද මහ බැංකුවේ යම් නිලධාරියකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් මුදල් සමාගමේ කටයුතු පරීක්ෂා කිරීමෙන් පසුව හෝ මුදල් සමාගමෙන් ලැබුණු තොරතුරු මත හෝ අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වූ අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ බව මුදල් මණ්ඩලයට වාර්තා කළ යුතු අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි නියම හා කොන්දේසි මත ඒ මුදල් සමාගමට ණය දීමේ කාර්ය සඳහා (422 වන අධිකාරය වන) මුදල් නීති පනතේ 88ඉ වගන්තිය යටතේ පිහිටුවන ලද මධ්‍ය හා දීර්ඝ කාලීන ණය අරමුදලෙන් ණයක් හෝ අත්තිකාරමක් මණ්ඩලය විසින් වාණිජ බැංකුවකට දෙනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වාණිජ බැංකුවකට දෙන ලද යම් ණයක් හෝ අත්තිකාරමක් සම්බන්ධයෙන්, මුදල් නීති පනතේ 88අ සිට 88ඉ දක්වා වූ වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ණය ආයතන විසින් මුදල් සමාගමකට දෙන ලද ණය, අත්තිකාරම් සහ වෙනත් පහසුකම් සඳහා මණ්ඩලය විසින් ඇප වනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ "ණය ආයතනය" යන්නෙන්,

(අ) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී යම් බැංකුවක් ;

(ආ) මේ පනත යටතේ බලපත්‍රලාභී යම් මුදල් සමාගමක් ;

(ඇ) ණය සහ අත්තිකාරම් දෙන හෝ ආයෝජනයන් කරන හෝ මහජනයාගෙන් තැන්පතු භාර ගන්නා, (යම් ලිඛිත නීතියක් යටතේ හෝ වෙනත් ලෙසකින් පිහිටුවනු ලැබූ) රජය වෙනුවෙන් කටයුතු කරන, යම් නියෝජ්‍යායතනයක් හෝ ආයතනයක් ;

(ඈ) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ කාර්ය සඳහා බැංකු ආයතනයක් ලෙස, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කළ නියමයක් මගින් ප්‍රකාශ කරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ; සහ

(ඉ) 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ පිහිටුවන ලද යම් සමිතියක්,

අදහස් වේ.

අමාත්‍යවරයාගේ විධාන.

**68.** මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා, සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් මණ්ඩලයට ලිඛිතව දෙනු ලැබිය හැකි අතර මණ්ඩලය ඒ විධාන බලාත්මක කළ යුතු ය.

අමාත්‍යවරයාගේ නියෝග.

**69.** (1) මේ පනතින් නියෝග සෑදිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, ඒ නියෝග ඒ පළකිරීම කරනු ලබන දිනයේ දී හෝ ඒ නියෝගයේ සඳහන් කරනු ලබන වෙනත් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත නොකරනු ලැබූ සෑම නියෝගයක්ම ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

තැනැත්තන් සිටිනා තැන දැනගැනීම සඳහා තොරතුරු කැඳවීමේ බලය.

**70.** මේ පනත ප්‍රකාරව විමර්ශනයක් හෝ පරීක්ෂණයක් ඇරඹී ඇති අවස්ථාවක හෝ නඩු කටයුත්තක් පවරා ඇති අවවස්ථාවක වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ඒ විමර්ශනය, පරීක්ෂණය හෝ නඩු කටයුත්තට භාජනය වන පුද්ගලයකු සිටිනා තැන සොයා ගැනීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයාට ලිඛිත දැන්වීමක් මගින්—

(අ) නිතරම හෝ යම් දක්වනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තාගේ දුරකථන හෝ අන්තර්ජාල භාවිතය පිළිබඳ,

එසේ සපයනු ලැබූ එකී සේවාවන් භාවිතයට යොදාගත් ස්ථානයන්හි පිහිටීම ඇතුළු තොරතුරු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හෝ විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් හෝ අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් එක් අයකුගෙන් හෝ වැඩි ගණනක් වෙතින් ; සහ

(ආ) නිතරම හෝ යම් දක්වනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් යම් බැංකුවක් හෝ මුදල් සමාගමක් සමග සිදුකරන ලද ගනුදෙනු පිළිබඳ සිදු කළ ශාඛාව හෝ ඔහු ගණුදෙනු කළ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය පිහිටි ස්ථානය ඇතුළු තොරතුරු ඒ බැංකුව හෝ මුදල් සමාගම වෙතින්,

කැඳවීමට බලය තිබිය යුතු ය.

**ඉවත් කිරීම සහ ශේෂ කිරීම.**

**71.** (1) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ඉවත් කරනු ලැබුවේ වුව ද, ඉවත් කරන ලද පනත යටතේ නිකුත් කරන ලද සෑම නියෝගයක්, දැන්වීමක්, නියමයක්, රීතියක්, මාර්ගෝපදේශයක් හෝ විධානයක්, හෝ පනවන ලද නියම කිරීමක්, කරන ලද තීරණයක් හෝ බලය පැවරීමක් මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙර දිනයේ බලාත්මකව පැවතියේ නම්, ඒ නියෝගය, දැන්වීම, නියමය, රීතිය, මාර්ගෝපදේශය, විධානය, නියම කිරීම, තීරණය සහ බලය පැවරීම මේ පනතේ විධිවිධාන සමග අනනුකූල නොවන තාක් දුරට, අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද, පනවන ලද හෝ කරන ලද නියෝගයක්, දැන්වීමක්, නියමයක්, රීතියක්, මාර්ගෝපදේශයක්, විධානයක්, නියම කිරීමක්, තීරණයක් හෝ බලය පැවරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාලෙන යන්නා වූ සමාගම්, මේ පනත යටතේ බලපත්‍රලත් මුදල් සමාගම් ලෙස සැලකිය යුතු ය.

(4) 1978 අංක 78 දරන මුදල් සමාගම් පනත ප්‍රකාරව පවරා ඇති සහ මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමට පෙරතුව වූ දිනයේ දී මහෙස්ත්‍රාත් අධිකරණයක හෝ දිසා අධිකරණයක විභාග වෙමින් පැවති සියලු නඩු, අපරාධ නඩු හා කාරණා එකී මහෙස්ත්‍රාත් අධිකරණය හෝ දිසා අධිකරණය විසින් අසා තීරණය කළ යුතු ය.

**72.** මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර ගැටුමක් හෝ අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

මේ පනත වෙනත් නීති අභිබවා බලපැවැත්විය යුතු බව.

**73.** මේ වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා "තැන්පතුව" යන්නෙන්, ඉල්ලා සිටි විටෙක හෝ, ගෙවීම කරන තැනැත්තා සහ ගෙවීම භාරගන්නා තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තන් වෙනුවෙන් එකඟ වූ කාලයක දී හෝ අවස්ථානුගත කරුණු මත, පොළියක් හෝ අධි මිලක් සහිතව හෝ රහිතව, ආපසු ගෙවීමේ කොන්දේසි යටතේ ගෙවූ මුදල් ප්‍රමාණයක් අදහස් වේ.

තැන්පතුව.

(2) පහත දැක්වෙන අවස්ථාවල දී (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන නියම මත ගෙවන ලද යම් මුදලක් මේ පනතේ කාර්ය සඳහා තැන්පතුවක් නොවිය යුතු ය.

(අ) ප්‍රාග්ධන ලක්ෂණ සහිත ණය සාධන පත්‍රයක් ඇතුලු ණය සාධන පත්‍රයක් මත ණයක් හෝ ආයෝජනයක් වශයෙන් :—

(i) මහ බැංකුව ;

(ii) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලත් බැංකුවක්, මේ පනතේ අර්ථානුකූලව වූ මුදල් සමාගමක් සහ ඉහත කී පනත් යටතේ බලපත්‍ර ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් මුදා හරින ලද තැනැත්තකු ;

(iii) යම් ලිඛිත නීතියක් යටතේ මුදල් ණයට දීම සඳහා විශේෂිත වශයෙන් බලය ලත් තැනැත්තකු ;

(iv) ආණ්ඩුව, පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් ;

(v) ආණ්ඩුව විසින් ආපසු ගෙවීම සහතික කර ඇති වෙනත් යම් මූලාශ්‍රයක් ;

(vi) විදේශීය රජයක් ;

(vii) නැවත ගොඩනැගීම හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව, අන්තර් ජාතික සංවර්ධන සංගමය, අන්තර්ජාතික මූල්‍ය සංස්ථාව, ආසියානු සංවර්ධන බැංකුව හෝ වෙනත් ඕනෑම බහු පාර්ශ්වීය ණය දෙන ආයතනයක් ; සහ

(viii) මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් ආයතනයක් ;

විසින් ගෙවන ලද යම් මුදලක්,

(ආ) යම් සමාගමක් වෙනත් සමාගමකට ණයක් ලෙස හෝ කොටස්වලට දායක වීමක් ලෙස ගෙවන ලද මුදලක් පළමුවෙන් සඳහන් කළ සමාගම අනෙක් සමාගමේ පාලිත සමාගමක් හෝ සමාගම් දෙකම වෙනත් සමාගමක පාලිත සමාගම් හෝ පළමුවෙන් සඳහන් කළ සමාගම අනෙක් සමාගමේ පාලක සමාගම හෝ එක් පුද්ගලයකු සමාගම් දෙකේම ප්‍රධාන කොටස් හිමි පාලකයා වන අවස්ථාවක දී ;

(ඇ) යම් තැනැත්තකු විසින් ගෙවන ලද මුදලක්, මුදල් ගෙවන අවස්ථාවේදී මුදල් ගෙවන තැනැත්තා ඒ මුදල් ලබන තැනැත්තාගේ ඥාතියකු හෝ ඒ මුදල් ලබන තැනැත්තාගේ අධ්‍යක්ෂවරයකු නම් හෝ ඒ මුදල් ලබන තැනැත්තාගේ අධ්‍යක්ෂවරයකුගේ ඥාතියකු නම් :

එසේ වුව ද, ණය ගැනීම් ලෙස හෝ කොටස්වල දායකවීම් ලෙස හැර වෙනස් ලෙසකින් මේ පනතේ අර්ථානුකූලව මුදල් සමාගමකට ලැබෙන මුදල්, තැන්පතුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ ඡේදයේ කාර්ය සඳහා යම් පුද්ගලයකු සම්බන්ධව "ඥාතියකු" යන්නෙන් අදහස් වන්නේ ඔහුගේ කලත්‍රයා, ඔහුගේ දරුවන් සහ ඔහුගේ මව්පියන්ය ;

(ඈ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ බලයලත් රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලය ලත් යම් තැනැත්තකුට ගෙවන ලද යම් මුදලක් ;

(ඉ) මේ වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව කොටස්වලට දායකවීම් ලෙස ගෙවන ලද යම් මුදලක් ;

(ඊ) සමාගමේ යම් වත්කම් උකසකින් සුරක්ෂිත කරන ලද බැඳුම්කර හෝ ණයකරවලට ගෙවූ මුදලක්, එසේ වුව ද, එම බැඳුම්කර හා ණයකරවල මුළු වටිනාකම සමාගමේ එම වත්කමේ වෙළඳපොළ අගය නොඉක්මවිය යුතු ය ;

(උ) ප්‍රාග්ධන ලක්ෂණ සහිත ණයකට හෝ අනෙකුත් ණයහිමියන්ගේ අයිතිවාසිකම්වලට යටත් වූ ණයකට දායක වූ මුදල්, කෙසේ වෙතත් එම පාදක ණය උපකරණය, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලය ලත් කොටස් හුවමාරුවක ලැයිස්තුගත කළ සුරැකුමක් විය යුතු ය ;

(ඌ) මේ වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව, කොන්ත්‍රාත්තුවක්, ක්‍රියාත්මක කිරීම සඳහා සුරැකුමක් ලෙස හෝ කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක නොවීම නිසා ඇති විය හැකි පාඩුව සම්බන්ධයෙන් ඇපයක් ලෙස ගෙවන ලද මුදලක් ;

(එ) මේ වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව, ප්‍රාග්ධණ ලක්ෂණ සහිත ණයකට හෝ අනෙකුත් ණය හිමියන්ගේ අයිතිවාසිකම්වලට යටත් ණයකට දායක වීම්, ඒ ණයෙහි අවම කල් පිරීමේ සීමාව මාස හැටකට අඩු නොවූ විට ;

(ඒ) මේ වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව, (1) වන උපවගන්තියේ සඳහන් කළ කොන්දේසි යටතේ යම් විශේෂ අවස්ථාවල පමණක් තැනැත්තකුට ගෙවන ලද මුදලක් ; සහ

(ඔ) ගැසට් පත්‍රයේ පළ කරන දැන්වීමක් මගින් මණ්ඩලය විසින් සඳහන් කරනු ලැබිය හැකි ස්වභාවයක ගනුදෙනුවක දී ගෙවන ලද මුදලක්.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ), (ඌ), (එ) සහ (ඒ) යන ඡේදයන්හි සඳහන් කරන ලද ආකාරයෙන් ගනුදෙනු කරන ලද යම් මුදලක් මේ පනතේ කාර්ය සඳහා තැන්පතුවක් වන්නේ ද යන්න, එම ගනුදෙනු කළ වාර ගණන සහ ඒවායේ ස්වභාවය සැළකිල්ලට ගෙන මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

**74.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"ආශ්‍රිත සමාගම" යන්නෙන්, යම් සමාගමක් සම්බන්ධයෙන් භාවිතා වූ විට ඒ යම් සමාගම වෙනත් සමාගමක ගෙවා නිමි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙහි සියයට විස්සකට නොඅඩු සහ සියයට පනහකට නොවැඩි කොටස් අයිතියක් දරන විටක ඒ වෙනත් සමාගම අදහස් වේ ;

"මණ්ඩලය" යන්නෙන් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ ;

"ප්‍රාග්ධනය" යන්නෙන්, යම් සමාගමක ගෙවා නිමි ප්‍රාග්ධනය අදහස් වේ ;

"ප්‍රාග්ධන අරමුදල්" යන්නෙන්, මුදල් සමාගමක් සම්බන්ධයෙන් වන විට ගෙවා නිමි ප්‍රාග්ධනය සහ ස්ථිර නිදහස් සංචිත අදහස් වන අතර, මණ්ඩලය විසින් එසේ තීරණය කරනු ලබන්නේ නම්, අනාරක්ෂිත ණයකර සහ වෙනත් ණය බැඳුම්කරවල මුණත වටිනාකම ඇතුළත් වේ. ඒ වටිනාකම මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීම හෝ ප්‍රාග්ධනය ආපසු ගෙවීම හෝ අඩු කිරීම සිදුවන අවස්ථාවක, තැන්පතුවලට සහ මුදල් සමාගම් වෙනත් ණයතුරුස්වලට පසු ස්ථානය ගත යුතු අතර ඒවාට පහළ ස්ථානයක විය යුතු ය ;

"මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ ;

"වාණිජ බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ ;

"මූලික ප්‍රාග්ධනය" යන්නෙන්, පහත දැක්වෙන දේවල එකතුව අදහස් වේ :—

(අ) නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවා නිම කළ සාමාන්‍ය කොටස් හෝ සාමාන්‍ය ස්කන්ධ, සහ කොටසක් පමණක් ගෙවා ඇති කොටස් සහ ස්කන්ධ සම්බන්ධයෙන් ගෙවා නිමි ප්‍රමාණය :

එසේ වුව ද, මණ්ඩලය විසින් කලින් කල නිකුත් කළ විධාන ප්‍රකාර මූලික ප්‍රාග්ධනයේ ඇතුළත් කිරීම සඳහා සුදුසුකම් නොලද සංචිත, අතිරික්ත, රඳවාගත් ලාබ පදනම් කරගෙන නිකුත් කළ යම් කොටස් මූලික ප්‍රාග්ධනයේ ඇතුළත් නොකළ යුතු ය :

එසේම තවදුරටත්, මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සමාගමක් සම්බන්ධයෙන් මූලික ප්‍රාග්ධනය ගණනය කිරීමේ දී, නිකුත් කළ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය ගෙවා නිමි ලෙස සැළකිය යුත්තේ ඒ කොටස්, මුදල් සඳහා නිකුත් කර ඇත්නම් පමණි ;

(ආ) ලාභාංශ කොටසක් හෝ සම්පූර්ණයෙන් ගෙවීමට ලාභ ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හි දී ලාභාංශයන් ගෙවීම අඩු කළ හැකි හෝ ස්ථිර වශයෙන් නොගෙවා සිටිය හැකි නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවා නිමි සමුච්චිත නොවන නිදහස් කළ නොහැකි වරණීය කොටස් :

එසේ වුව ද, මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සමාගමක මූලික ප්‍රාග්ධනය තීරණය කිරීමේ දී නිකුත් කරන ලද සමුච්චිත නොවන සහ නිදහස් කළ නොහැකි වරණීය කොටස් ගෙවා නිමි ලෙස සැළකිය යුත්තේ ඒ කොටස්, මුදල් සඳහා නිකුත් කර ඇත්නම් පමණි ;

(ඇ) අදාළ වේ නම්, සාමාන්‍ය කොටස්, සාමාන්‍ය ස්කන්ධය, සමුච්චිත නොවන සහ නිදහස් කළ

නොහැකි වරණීය කොටස්වල නිකුත් මිල සම වටිනාකමට වඩා වැඩි වන විට එහි ඇති අතිරික්තය ;

(ඈ) මේ පනතේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර පවත්වාගෙන යන සංචිත අරමුදලක බැරව ඇති මුදල් ප්‍රමාණය ;

(ඉ) අවසානයට විගණනය කළ ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන පරිදි, රඳවාගත් ලාභ, කොටස් අධිමිල හෝ වෙනත් ඉපයූ අතිරික්ත යොදා ගැනීමෙන් ඇති කළ හෝ වැඩි කළ පොදු හෝ අනෙකුත් නිදහස් සංචිත ස්වරූපයෙන් යුත් හෙළිදරව් කළ සංචිත

(ඊ) අවසානයට විගණනය කළ ගිණුම් ප්‍රකාශයන්හි දැක්වෙන ආකාරයට එකතු වූ ලාභ හෝ පාඩු ;

එසේ වුව ද, ආයෝජන දේපළ ප්‍රත්‍යාගණනයෙන් ඇති වූ රඳවා ගත් ලාභ ඇතුළු නොකළ යුතු වේ :

(උ) මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානයකට යටත්ව, ස්ථාවර සහ දිගුකාලීන ආයෝජන විකිණීමෙන් ලත්, බද්දට පසු අතිරික්ත හෝ පාඩු ද ඇතුලුව අවසානයට විගණනය කළ ගිණුම් ප්‍රකාශයේ දිනයේ සිට ලැබූ ලාභ හෝ පාඩු ;

(ඌ) මණ්ඩලය විසින් කලින් කලට නියම කරන අවශ්‍යතාවයක සපුරාලන වෙනත් යම් ප්‍රාග්ධන සංචරකයක් ;

“යැපෙන දරුව යන්නෙන් අවුරුදු 18 ට අඩු දරුවකු හෝ අවුරුදු 25 ට අඩු අවිවාහක හෝ රැකියා විරහිත දරුවකු හෝ වයස කොපමණ වුවත් ශාරීරික හෝ මානසික බෙලහීනතාවයක් නිසා සිය යැපීම සඳහා උපයා ගැනීමට නොහැකි දරවකු අදහස් වේ ;

“අධ්‍යක්ෂවරයා යන්නෙන්, මුදල් සමාගම් විෂයය පවරනු ලැබ ඇති මහ බැංකුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා අදහස් වන අතර වැඩ බලන අධ්‍යක්ෂවරයකු ද ඇතුළත් වේ ;

"මුදල් ව්‍යාපාර" යන්නෙන් තැන්පතු භාරගැනීමේ ව්‍යාපාරය, සහ

(අ) මුදල් ණයට දීම ; හෝ

(ආ) යම් කවර ආකාරයකින් හෝ මුදල් ආයෝජනය කිරීම ;

(ඇ) යම් කවර ආකාරයකින් හෝ මුදල් ණයට දීම හෝ මුදල් ආයෝජනය කිරීම.

අදහස් වේ

"මුදල් සමාගම" යන්නෙන්, මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා මේ පනත යටතේ බලපත්‍රලත් සමාගමක් අදහස් වේ ;

"පාලක සමාගම" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනතේ එකී යෙදුමට ලබා දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයන්" යන්නෙන්, යම් සමාගමක (විධායක හෝ විධායක නොවන) යම් අධ්‍යක්ෂවරයෙකු ඇතුලු ඍජුව හෝ වක්‍රව යම් මූල්‍ය සමාගමක කටයුතු සැලසුම් කිරීම, විධාන කිරීම හා පාලනය කිරීම සඳහා බලය සහ වගකීම දරන පුද්ගලයන් අදහස් වේ ;

"නෛතික වයෝ පූර්ණත්වය" යන්නට (66 වන අධිකාරය වූ) වයස් පූර්ණත්ව අඥාපනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"ද්‍රවශීලි වත්කම්" යන්නෙන්—

(අ) අතැති මුදල් ;

(ආ) යම් බැංකුකරුවකුගේ ලියමකින් හෝ අය කිරීමකින් නිදහස්, වාණිජ බැංකුවක ඇති ජංගම ගිණුමක හෝ තැන්පත් ගිණුමක ශේෂ ;

(ඇ) යම් අය කිරීමකින් හෝ ලියමකින් නිදහස් එක් අවුරුද්දක් තුළ කල් පිරෙන, ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ;

(ඇ) යම් අය කිරීමකින් හෝ ලියමකින් නිදහස්, එක් අවුරුද්දක් තුළ කල් පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරකුම්පත් ;

(ඉ) යම් අය කිරීමකින් හෝ ලියමකින් නිදහස්, එක් අවුරුද්දක් තුළ කල් පිරෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් ;

(ඊ) ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවත්වාගෙන යන මුදල් ශේෂ ඇති නම් එකී මුදල් ශේෂ ; සහ

(උ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් වත්කම්.

අදහස් වේ.

"ණය" යන්නට යම් අත්තිකාරමක් හෝ යම් විකිණීමේ දී ගෙවීම කල් දැමීම හෝ කුලියට ගෙවා මිලට ගැනීමේ ගිවිසුමකට හෝ බදු ගිවිසුමකට අදාළ ගනුදෙනුවක දී ගෙවීම කල් දැමීම ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාව අනුව පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

"සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් සන්තකයේ දරන්නා වූ ද, තැනැත්තෙකු ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම

සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද ගණකාධිකාරී සමාගමක් හෝ අදහස් වේ.

"ඥාතියා" යන්න පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට ඒ පුද්ගලයාගේ කලත්‍රයා හෝ යැපෙන දරුවකු අදහස් වේ.

"පාලිත සමාගම" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ එකී යෙදුමට ලබා දී ඇති අර්ථයම ඇත්තේ ය.

"සෑහෙන සම්බන්ධතාවය" යන්නෙන්—

(අ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගම ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයක් ඉක්මවන්නාවූ ගෙවා නිමි අගයෙන් යුත් කොටස් කෙරෙහි වෙනත් සමාගමක් හෝ පුද්ගලයෙක් හෝ ඔහුගේ ඥාතියකු විසින් තනි තනිව හෝ එක් ව දරනු ලබන අර්ථදායි සම්බන්ධතාවයක් හෝ යම් පුද්ගලයකු හෝ ඔහුගේ ඥාතියකු විසින් හෝ වෙනත් සමාගමක් විසින් හෝ ඒ සමාගමේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයකට නොඅඩු මුදල් ප්‍රමාණයකට දෙන ලද ඒ සමාගම වෙනුවෙන් වූ ඇපයක් හෝ හානි පූර්ණයක් අදහස් වේ;

(ආ) ව්‍යාපාරික ආයතනයක් සම්බන්ධයෙන් වන විට, පුද්ගලයකු හෝ ඔහුගේ ඥාතියකු විසින් තනි තනිව හෝ එක්ව ව්‍යාපාරික ආයතනයෙහි දරනු ලබන, එකී ව්‍යාපාරික ආයතනයේ සියලු හවුල්කරුවන් විසින් දායක වූ මුළු ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි වූ ප්‍රමාණයක් නියෝජනය කෙරෙන අර්ථදායි සම්බන්ධතාවයක් හෝ පුද්ගලයකු හෝ ඔහුගේ කලත්‍රයා, මව හෝ පියා හෝ දරුවකු විසින් ඒ ව්‍යාපාර ආයතතනය වෙනුවෙන් එහි ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයකට අඩු නොවූ ප්‍රමාණයක් සඳහා දෙන ලද ඇපයක් හෝ හානි පූර්ණයක් අදහස් වේ.

"අයුතු ලැබීමක්" යන්නෙන්, ලැබීම ලබන පුද්ගලයාට නීතිමය අයිතියක් නැති දේපළ වංක වංචනික හෝ නීති විරෝධී ලෙස, ලැබීම අදහස් වේ.

"අයුතු පාඩුවක්" යන්නෙන්, නීතිමය අයිතියක් ඇති පුද්ගලයාට දේපළ වංක වංචනික හෝ නීති විරෝධී ලෙස, පාඩුවක් සිදුවීම අදහස් වේ.

**අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**75.** මේ පනතේ සිංහල සහ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.